**වසර 2500 පසු**
**මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.**

# සත්‍ය ධර්මය ඇවදි විය

(දහසයවන වෙළුම)

# බුද්ධ ඥානය අචින්ත්‍යයි - II

(සිතක මැවෙන ලෝකය)

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදයේ ප්‍රකාශනයකි.

**සියලුම හිමිකම් ඇවිරිණි**

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලුම ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළකිරීම් සපුරා තහනම් ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරේ.



**බුද්ධ ඥානය අචින්ත්‍යයි - II (සිතක මැවෙන ලෝකය)**

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය - 2022 දෙසැම්බර්

ධර්ම ග්‍රන්ථය පිළිබඳ විමසීම්
Email: buddothpado@gmail.com
Tel +94 703 518 747 - බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ

පරිගණක මුද්‍රණ සැකසුම
**වාක්‍යා රූ**
අංක 42/8, මකුළුදූව, පිළියන්දල.
දුරකථනය 011 2 708377

මුද්‍රණය
**K.S.U. ග්‍රැෆික් (පුද්) සමාගම**
අංක 510, රාජගිරිය පාර, රාජගිරිය
දුරකථන 011 2 884701

අන්තර්ජාලයේ ධර්ම දේශනා ශ්‍රවණය කිරීමට
www.buddothpa.com / www.buddothpado.lk

facebook හරහා ශ්‍රවණය කිරීමට
https://www.facebook.com/Buddothpado

1. Buddothpado -
   https://youtube.com/@buddothpado

2. Buddothpado Aryanwahanse -
   https://youtube.com/@buddothpadaaryanwahanse

3. Buddothpado  Unity -
   https://youtube.com/@BuddothpadoUnity

4. Buddothpado English -
   https://youtube.com/@weeejj

5. Buddothpado Tamil -
   https://youtube.com/@buddothpadotamil

6. Buddothpado Zoom Discussion -
   https://youtube.com/@Zoom-up2ik

7. Buddothpado Night Discussion -
   https://youtube.com/@BuddothpadoNightDiscussi-zj2bk

8. Buddothpado English Zoom Discussion -
   https://youtube.com/@BuddothpadoEnglishZoom

9. Buddothpado Radio Damma Discussion -
   https://youtube.com/@BuddothpadoRDD

10. Buddothpado TV Damma Desana  -
    https://youtube.com/@BuddothpadoTVdammaDesana

## නිවන් මඟ යායුතු අනුපිළිවෙල

(සත්‍ය කෘත්‍ය කෘතක් ද්විදසාකාරක තිපරිවට්ටම්)

**බුදුන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය තුලින් ප්‍රථම වතාවට නිවන් මඟ යා යුතු ආකාරය අනුපිලිවෙලින් මෙසේ වදාළ සේක.**

1. **පූර්ව භාග ප්‍රතිපදාව** (පළමුව කලයුතු දේ) සත්‍යඥාණ අවබෝධය
2. **අපරභාග ප්‍රතිපදාව** (දෙවනුව කලයුතු දේ - ප්‍රායෝගිකවන ආකාරය)

    2.1 කෘත්‍යඥාණය - ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම

    2.2 කෘතක්ඥාණය - ආත්මීය භාවයෙන් මිදීමේ අත්දැකීම

1. **පූර්ව භාග ප්‍රතිපදාව (සත්‍යඥාණ අවබෝධය) ශ්‍රාවකයාගේ උත්සාහය මත සහ කල්‍යාන මිත්‍රයාගේ පණිවිඩය මත පවතී**

    බුද්ධදර්ශනය අවබෝධකරගැනීම (දර්ශන ඥාණය = සත්‍යඥ්ඥාණය)

    - සිත හැදෙන හැටි අවබෝධකරගැනීම
    - සිත මායාවක් බව අවබෝධකරගැනීම සිත යනු අරමුණම බව දැනගැනීම
    - අරමුණෙහි සත්‍ය දැකීම, අරමුණට නොරැවටීම
    - ආත්මීය භාවය හැදෙන ආකාරය අවබෝධකර ගැනීම අරමුණම ආත්මය බව දැකීම
    - ශූන්‍යතා අවබෝධය
    - ත්‍රිවිද්‍යා දැනගැනීම (පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතූපපාත ඥාණය, ආසවක්‍ෂයඥාණය)
      (සිත = අරමුණ = ආත්මය)

    1.1 කල්‍යාණ මිත්‍රයාගෙන් පණිවිඩය අසාදැන ගැනීම

    1.2 නැවත නැවත සද්ධර්මශ්‍රවනය

    1.3 යෝනිසෝමනසිකාරය

    1.4 ධම්මානුධම්ම ප්‍රතිපදාව
    **ශ්‍රාවකයා උට්ඨාන වීර්යෙන් කලයුතු දෙයින් වැඩි ප්‍ර තිශතයක් ඇත්තේ පූර්ව භාග ප්‍රතිපදාව තුලයි.**

**බුදුන් වහන්සේ කී පරිදි, නිවන් මඟයන ශ්‍රාවකයා කලයුතු සියල්ල හිමාලය පර්වතය නම්, පූර්ව භාග ප්‍රතිපදාවෙන් පසු තව කලයුතු වන්නේ අත ඇති ගල් කැටයක පමණ දෙයකි.**

- සක්කාය දිට්ඨි ප්‍රහානය මෙතැනදී සිදුවේ.
- ශ්‍රාවකයා ආර්‍ය භූමියට පිවිසේ.

2. අපරභාග ප්‍රතිපදාව

2.1. **කෘත්‍යඥාණය** - අසාදැනගත් ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම - (ධර්මය තමාතුලින් දැකීම = සතර සතිපට්ඨානය වැඩීම).

2.1.1. **අරමුණෙහි සත්‍ය දැකීම**; --දර්ශනය තුල සිත හැදෙන හැටි දකින ආකාරය ප්‍රායෝගිකව අත්දැකීම(යථාභූත ඥාණය = යෝනිසෝ මනසිකාරය)

2.1.2. **අරමුණෙහි සත්‍ය දැක මිදීම**
අරමුණ සත්‍යක් නොවන බව ප්‍රායෝගිකව අත්දැකීම
ඒ අනුව ආත්මයක් නැතිබව ප්‍රායෝගිකව අත්දැකීම
සවිතක්ක සවිචාර සමාධිය අත්දැකීම (විදර්ශනා සමාධි.)

2.1.3. **ත්‍රි විද්‍යා ප්‍රායෝගිකව අත්දැකීම** (පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතූපපාත ඥාණය, ආසවක්‍ෂය ඥ්ඥාණය)

2.2. **කෘතඥාණය (ශ්‍රාවකයාට කලහැකි කිසිවක් නැත. සොභාදහමේ අනාවරනයක් පමනි. ඥාණයට හසුවේ. බුද්ධ වචනයට අනුව මෙහිදී දැඟලුවහොත් පාරුව ගිලේ.) - සම්මා සමාධි, සම්මා විමුක්ති**

ආත්මයක් නැතිබව ප්‍රායෝගික අත්දැකීමෙන්, මිදීම අත්දැකීම (ආත්මීය භාවයෙන් මිදීම නිසා ඇතිවන සමාධිමත් ස්වභාවය)

අවිතක්ක අවිචාර සමාධිය - අනිමිත්ත ශූන්‍යත අප්‍රනීත චේතෝ විමුක්තිය - අරහත්ත සමාධිය - නිස්සත්තෝ නිර්ජීවෝ ශූන්‍යෝ

ශාන්ත ප්‍රනීත නිර්වාන සම්පත්තිය

# බුද්ධෝත්පාදෝ

- නිවැරදි නිවන් මඟ හඳුනා ගැනීම (සත්‍ය, කෘත්‍ය, කෘතක්)
- නිර්වාණය සකස් කරගැනීම සඳහා ප්‍රායෝගිකව ඔබ කටයුතු කළ යුතු ආකාරය.
- බුදුරජාණන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රයේ පැහැදිලි කරන ආකාරයට "එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහොසි"
- සත්‍ය ඥානය
- කෘත්‍ය ඥානය
- කෘතක් ඥානය

ලෙස නිවැරදිව නිවන්මග දේශනා කර ඇත.

- මේ පිළිවෙළට නිවන් මඟ වැඩීම තුළ ආත්ම දෘෂ්ටිය දුරුවී, ආත්ම සංඥාව දියවී, අනාත්ම ස්වභාවයට පැමිණෙන ආකාරය පැහැදිලි කර ඇත.
- එනම් ඔබට සතියක් තුළ නිවන් මග මුල, මැද, අග ලෙස කටයුතු කරන ආකාරය පහතින් පෙන්වා ඇත.

**1. පළමුවෙනි දිනය**

බුද්ධ දර්ශනය පැහැදිලි කිරීම. (සත්‍ය ඥානය අවබෝධ කරගත යුතුයි.) ආත්මය හැදෙන හැටි.

2. **දෙවෙනි දිනය**

බුද්ධ දර්ශනය පැහැදිලි කිරීම. (සත්‍ය ඥාණය අවබෝධ කරගත යුතුයි) ආත්මය හැදෙන හැටි, ආත්ම සංඥාව, ආත්ම දෘෂ්ටිය දැනගැනීම.

3. **තුන්වන දිනය**

අරමුණ බාහිර ඇත්තක් නොවන බවත්, එය සිතිවිල්ලක් බවත් දකිමින් කටයුතු කිරීම.

4. **හතරවන දිනය**

අරමුණ සිතිවිල්ලක් බවත්, සිතිවිල්ලක් සත්‍යක් නොවන බවත්, දකිමින් කටයුතු කිරීම.

5. **පස්වන දිනය**

බාහිරත් සිතත් සත්‍යක් නොවන බව දකිමින්, මිදෙමින් කටයුතු කිරීම.( ක්‍රියා සිත දකිමින් කටයුතු කිරීම) ආයතන දැකීම.

6. **හය වන දිනය**

අරමුණ ආත්මය වශයෙන් නොගෙන ක්‍රියාවලිය දකිමින් කටයුතු කිරීම.

7. **හත්වන දිනය**

විවේක සුවයෙන් කටයුතු කිරීම.

- මෙය සතියක් වඩන ආකාරය ඉහත දැක්වේ. තවදුරටත් මේ ආකාරයෙන් සති දෙක, තුන සහ මාසයක් යන ආකාරයට වැඩි වෙන ලෙස සකස් කරගත හැක.
- මෙය මූලාශ්‍ර කොටගෙන කෙන කෙනාට සුදුසු ආකාරයෙන් සකස් කර ගත හැක.

**බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ**

# පෙරවදන

මෙය ඇසෙන ඔබ මහා භාග්‍යවන්තයි. ඔබ කොහේද යන්නේ, මුලාව රැවටීම හරි භයානකයි. සත්‍ය කුමක්ද? ඔබ සංසාර චක්‍රයක අතරමං වෙලා. විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකෙන්, සැපේ දුකේ දෝලනය වන මේ ජීවිතය හරි භයානකයි. ඔබ සත්‍ය දන්නේ නෑ. ඒ සත්‍ය ඔබ අවබෝධ කළ යුතුයි. ඔබ සංසාර දුකින් මිදෙන කතාවයි මේ.

මෙම දේශන මාලාව මඟින් ඔබට සත්‍ය ධර්මය අවබෝධය සඳහා යම්කිසි උපකාරයක් ලැබෙනවා. සියලු දුකින් මිදෙන තැන හමුවන ඒ 'සදාතනික සුවය' මෙම දේශන මාලාව මගින් අත්දකින්නට ඔබට ද හැකියාව ලැබේ. බාහිර ඇත්ත කරගෙන සිටින තාක් ඔබ ඉන්නේ මිත්‍යාදෘෂ්ටියේමයි. ඒතාක් ඔබට දුක උරුමයි. සිතද මායාවක් වන තැන

සිතේ මායාවෙන් මිදුනු තැන,
බාහිර ඇත්තක් නොවන තැන
සිතද සත්‍යයක් නොවන තැන
ඒ සිතෙන් මිදෙන තැන
ඒ බාහිර ඇත්තක් නොවන තැන
'අජ්ජත්ත බහිද්ධා' කියන තැන
අන්ත දෙකම මිදුන තැන, එනම්,

ධර්මය තුළ සඳහන් වන නාම, රූප අන්ත 2න් මිදීමයි නිවන් මග වන්නේ. මෙලොව උපදින සියලු සත්ත්වයෝ නිවනින්මයි සැනසීම ලබන්නේ. ධර්මය නම් ධර්මතාවයයි. ඒ පටිච්චසමුප්පාද ධර්මයයි. එනම් ඉදප්පච්චතාවයයි. එනම් දෙයක් නැති බවයි. දෙයක් නැති බව බුද්ධ ස්භාවයයි. දෙයක්

නැති තැන චේතෝවිමුක්තියයි. එනම් අනිමිත්ත, ශූන්‍යත, අප්ප්‍රනිත චේතොවිමුක්තියයි. ඒ බුද්ධ ස්වභාවයයි. මේ දහම අවබෝධ වේ නම් ඔබ අප සියලු දෙනාම ඒ බුද්ධ ස්වභාවටයි අවදි වෙන්නේ. ඒ බුද්ධ යනු ශූන්‍යතාවයි.

"නිස්සත්වෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ"

පහන නිවීගිය පසු ගිය තැනක් කොහින්ද? ඒ නිවීමමයි නිවන. ඒ කෙලෙස් ගින්නේ නිවීයාමයි. ඒ සසර ඕඝයේ නිමාවයි. ඒ විඤ්ඤාන නිරෝධයට ගිය තැන සියලු දුකෙන් මිදීමයි.

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පහං
එත්ථ ආපෝච පඨවි ච - තේජෝ වායෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජති
විඤ්ඤානස්ස නිරෝධෙන - එත්තෙ තං උපරුජ්ජති

සිතෙන් මිදෙන මඟ
නිවන් දකින මඟ
දුකින් මිදෙන මඟ
එයයි නිස්සරණ මඟ

නිවැරදි නිවන් මඟ ඔබටත් හමුවේවි. ධර්මය සොයන්නාට බුදුන් හමු වේ. බුද්ධ යනු සොබාදහමයි. ප්‍රායෝගික පුහුණු විය යුතු ආකාරය හඳුනාගෙන අවබෝධ කළ යුතු ධර්මයකි.

**බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ**

# හැඳින්වීම

මේ ගෞතම බුද්ධ ශාසනය තුළ අපි හැමදෙනාටම අවශ්‍ය වන්නේ නිවීමක්, සැනසීමක්, දුකින් මිදීමක්. නිරන්තර පවත්නා රාග, ද්වේශ, මෝහ. නිවා ගැනීමයි නිවන කියන්නේ. කිසාගෝතමී, පටාචාරා, අම්බපාලි වැනි බොහෝ පිරිස් බුදුරජාණන් වහන්සේ අභියස ඒ ගිනි නිවා සදාකාලික සැනසීම ලැබුවා.

අද බෞද්ධ සමාජයට මේ නිවීම සැනසීම අහිමි වෙලා බොහෝ පිරිස් නොයෙකුත් රාමුවලට සිරවී, ග්‍රන්ථ ධූරයට පමණක් සීමාවෙලා සිටින්නෙ. ඒ තුළින් සත්‍ය දැකීම අපහසුයි. විදර්ශනා ධූරය සමාජයෙන් ඈත් වී ඇති මෙවන් යුගයක නැවතත් ඒ ගිලිහී ගිය බුද්ධ දර්ශනය, විදර්ශනා ධූරය තුළින් ම ඉස්මතු වෙනව. ඒ අති ගම්භීර, නිර්මල, පරම සත්‍යය අපට අහන්න ලැබෙනවා. මේ නිවැරදි බුද්ධ දර්ශනය පෙර නොඇසූ විරූ දහම, ධම්ම චක්ඛුෂය අපි අවබෝධ කරගත යුතු වෙනව. මේ සත්‍ය දර්ශනය බාහිරින් හමුවන දෙයක් නොවේ. බාහිර ඇත්ත වූ තැන පවතින්නෙ ආත්මීය ස්වභාවයක්.

මේ අනාත්ම ධර්මය උතුම් බුද්ධ දර්ශනය ‘බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ මාලාව’ තුළින් ඔබට කියවන්න ලැබෙනව. එය හොඳින් කියවන්න. ධාරණය කරගන්න. ඔබට සත්‍ය අවබෝධයට මෙය උපකාරී වේවි. මේ අප ගන්නා උත්සාහයේ එක් අවස්ථාවක් පමණි.

**අප කල්‍යාණ මිත්‍ර මෙහෙණින් වහන්සේ**

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මේ උතුම් සත්කාරය සඳහා අර්ථයෙන්, ධර්මයෙන්
සියළුම ආකාරයෙන් උදව් උපකාර කළා වූ
සියළුම දනන් හට, මෙම ධර්ම දානය තුළින්
ජනිත වන්නා වූ පුණ්‍ය ශක්තිය
මේ ගෞතම බුද්ධ ශාසනයේ දී ම
ඒ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය
අවබෝධ කරගෙන සංසාර දුකින් මිදී
නිවනින් ම සැනසීම ලබන්නට
හේතු වේවා !

# පිදුම



කෙනෙක් කෙතරම් දුර ඇති
අරමුණක් කරා වුවත් යන්නා වූ
එක්වර උපදින එක සිතකට
සීමා වූ, ශරීරය නැමැති
ගුහාවෙහි පවත්නා සිත
තැම්පත් කර ගනිද්ද
ඔහු මාර බන්ධනයෙන් මිදේ.
ඔබ අප සෑම සියළු දෙනාම
සිතුවිලි සසරෙන් මිදී
මාරයා පරාජය කිරීමට
අධිෂ්ඨානය කරමින් නිවන්මඟට පිලිපන්
විය යුතුයි. ඒ සුන්දර නිවන්මඟ
ගමන් කිරීමට මේ සත්‍ය ධර්මය
ලැබීමත් භාග්‍යයක් ආශිර්වාදයක්
පෘතග්ජන භූමියෙන් මිදී
ආර්යය භූමිය ස්පර්ශ කර
ශ්‍රැතවත් ආර්යය ශ්‍රාවකයකු වීමට
වෙර වීරිය ගන්න. ඒ උතුම්
නිවන්මඟ විවර කරගැනීමට මේ දහම්
පඬුර හේතුවේවා!!!

# පටුන


| | |
|---|---|
| බුද්ධෝත්පාදෝ | 6 |
| ලෝකයේ කෙලවර කොහේද | 15 |
| සිහිනයට පුළුවන් ද සිහිනයක් බව දැනගන්න | 45 |
| මේ මොහොතේ ඔබ සියළු දුකින් මිදෙනවා | 70 |

# 01

# ලෝකයේ කෙලවර කොහේද

**උපාසිකාව :** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස නමස්කාර වේවා. ආර්යයන් වහන්සේ කිව්වනේ සෙන්සස් ලක්ෂ ගණන් තියෙනවා කියලා.

**ආර්යයන් වහන්සේ :** ඔව්.

**උපාසිකාව :** එතකොට ආර්යයන් වහන්ස දැන් අපේ මොලේ, කුඩා මෝලේ කියල තව එකක් තියෙනවනේ. ඒකට කියන්නේ අර මස්තිෂ්කයනේ. එතකොට ඔය කුඩා මොලෙන්නේ අපි සංඥා යවන්නේ. එතකොට ආර්යයන් වහන්ස දැන් 'අංශබාගය' වගේ හැදුනොත් 'පැරලයිස්' වීම වගේ එකක් වුනත් එතකොට ඒවා වැඩ නොකරන්නේ එතකොට ආර්යයන් වහන්ස ඒ සෙන්සස් ඒ ගැන පොඩ්ඩක් විග්‍රහ කන්න පුළුවන් නම් හොඳයි ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** කයට සම්බන්ධ බොඩි එක 'පිසිකල් බොඩි' එකනේ. 'පිසිකල් බොඩි' එක තමයි ඔය කියන මොලෙන් සම්බන්ධ වෙලා කටයුතු කරන්නේ. මේ කතා කරන එක ඔය පිසිකල් බොඩි එකේ කතාව නෙවෙයි සෙන්සස්වල කතාව. ඔය පිසිකල් බොඩි එකේ මේන්ටේනින් ටික තමයි. ඔය තියෙන 'මස්තිෂ්කය' ඇතුළේ කතාවේ තියෙන්නේ. සෙන්සස්වල ක්‍රියේෂන් එක මස්තිෂ්කයේ කතාව නෙවෙයි.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** මේ පිසිකල් බොඩි එකේ බැලන්සින් දෙපැත්ත නැතිවෙන ඒවා ඔක්කොම පිසිකල් බොඩි එකට අදාළ මස්තිෂ්කයේ කතාව තමයි, ඒ පැත්ත වම් පැත්ත දකුණු පැත්ත බැලන්ස් වෙන හැටි.

**උපාසිකාව :** එහෙමයි ආර්යයන් වහන්ස. ඔබ වහන්සේට නමස්කාර වේවා. සාදු සාදු සාදු

**ආර්යයන් වහන්සේ :** පිසිකල් බොඩි එක දකින එක, ඒක වෙනම කතාවක්. ඒක මේ ශරීර කූඩුවට අපේ ඇස හැදිල තියෙනවා කන හැදිල තියෙනවා වගේ අනිත් ඒවත් ඔය අපේ අස්ථි, ඒ වගේම රුධිර සංසරණ පද්ධතිය ඒ සේරම වෙනම කතාවක්. පිසිකල් බොඩි එකේ කතාව ඒක නිකන් හරියට අර මේක වාහනයක් වගේ තමයි. වාහනේ එන්ජින් එකක් තියෙනවා. ඒකේ වෙනම සුක්කානමක් තියෙනවා. ඒක එක එක අතට හරවන්න පුළුවන්. ඒ වගේ පිසිකල් බොඩි එකක් එක්කලා යන පෙට්‍රල් තියෙනවා ටැංකිය තියෙනවා, ඒ වගේ සිස්ටම් එකක් තමයි ශරීර කූඩුව. මේක නෙවෙයි මේකේ වැදගත් වෙන්නේ.

**උපාසිකාව :** ආර්යයන් වහන්ස ඔබ වහන්සේ කියනවා එතකොට තව මේ සෙන්සර්ස් තියෙනවා වැඩ ගන්නැති කියලා.

**ආර්යයන් වහන්සේ :** ඒක අපේ ශරීර කූඩුවේ තියෙන සෙන්සස් ටික තමයි මෙච්චර තමයි තියෙන්නේ. මේ ශරීරවල තියෙන සෙන්සර් ඔච්චරයි. ශරීර කූඩුවේ වෙන සෙන්සර්ස් නෑ. ශරීර කූඩුවේ තියෙන්නේ ඔය සෙන්සර් ටික විතරයි. ඇස් දෙකයි, කන් දෙකයි, කටයි, නහයයි ඔය බොඩියේ තියෙන හන්කඩේ ඒ සෙන්සර්ස් ටික හැර සෙන්සර්ස් නෑ. ඔය ශරීර කූඩුවේ වෙනින් කොහෙන් හරි සෙන්සර්ස් තව හයි කරොත් තියෙයි. සෙන්සර්ස් කියන්නේ මොනවාද? සෙන්සර්ස් කියන්නේ දැන් මෙතන අපේ 'ඉන්ඩිකෙට්' කරන්නේ ශබ්ද, වර්ණ ගන්ධ, රස, පහසනේ, එච්චරයිනේ ඉන්ඩිකේට් කරන්නේ. දැන් කැරපොත්තට ස්පර්ශක තියෙනවානේ. ඔය ස්පර්ශක දෙක ඔලුවේ හයිකර ගන්නකෝ ඔබතුමිය දැන් මෙතන අංදෙක වගේ පේනවනේ නේද? කැරපොත්තගේ දෙකත් හයිකර ගන්න තව ටිකක් අර වවුලා ගෙත් තියෙනවානේ රේඩාර් එක වගේ, ඒකත් හයිකර ගන්නකෝ කොහේ හරි ඒ වගේ සත්තුන්ගේ තියෙන ඔක්කොම ගැජට් ටික හයිකර ගත්තම සෙන්සර්ස්නේ.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** තේරුණා නේද 'සෙන්සර්ස් කියන්නේ මොනවද කියලා. සෙන්සර්ස් කියන්නේ මේ අපිට දැනෙන අපිට අහුවෙන සිග්නල්වලට අමතරව, මේ ලෝකේ සිග්නල් තියෙනවා ප්‍රකෝටි ගාණක් අපිට ඒවා අහුකරන සර්කිට් ටික නෑ. ඒ සර්කිට් ටිකක් තමයි ඔය කියන ඔය ඇස, කන, දිව, නාසය, කය ඒක සෙන්සර්ස් කරනවා අපි, ඒ කිව්වේ ඒකයි. එතකොට ඒ අපේ ප්‍රකෝටි ගණනක ඒවා තියෙනවා. අපිට ඒවා අහුවෙන්නේ නෑ. අපිට අහුවෙන්නේ ඒවට අහු කරන්න ඕනා කියන සර්කිට් ටිකක් නැත්නම් ඔය සිරස අහුවෙනවා වගේ සර්කිට් එකක් හයි කර ගත්තනම් ඒකත් අහුවෙනවා. දැන් සිරස බලන්න වෙනම එළියේ ටී.වී. ඕන නෑ අරකෙන් බලතැහැකියි.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** අපිට ඒ සර්කිට් එක ගැජට් එකක් ඔය නියොරෝමී එකේ ඔය 'සයන්ස්ටිස්ලා' දන්නවා මේ කතාව. මේ ගොල්ලෝ ගැජට් හයිකරන්න උත්සාහ කරනවා පිසිකල් බොඩි එකට. ඒවා හයි කරලා බලනවා ඒගොල්ලෝ එක්ස්පෙරිමන්ට් කරලා ඊට වැඩිය එතකොට අහුවෙනවා. උදාහරණයක් කියනවා නම් ෆෝන් එකක් අතට වෙනම ගන්න ඕනේ නෑ. අපේ මේ හමේ පච්චයක් ගහනවා වගේ එකක් කරනවා. ඒක ගැහුවට පස්සේ අපේ හමෙන් පුළුවන් කතා කරන්න. ෆෝන් ඕනේ නෑ. දැනට ඒවා කරලා එක්ස්පෙරිමන්ට් කරලා තියෙන්නේ විද්‍යාඥයෝ. හම ටච් කරන්න විතරයි තියෙන්නේ. හම ටච් කරහම ඒකෙන් යනවා ඒකට වැදිලා ඉවරයි. ඒ වගේ තව සිස්ටම් ගොඩක් තියෙනවා. දැනට විද්‍යාඥයෝ එක එක විදිහට සෙන්සර්ස් අධ්‍යනය කරනවා. විද්‍යාඥයෝ අධ්‍යනය නොකරනවා නෙවෙයි මේක ඒ ගොල්ලන්ට ඒක ලොකු අභියෝගයක් ඒ තරම් කෝටි ප්‍රකෝටි ගාණක් සෙන්සර්ස් තියෙනවා. මේකේ වැරදි එකක් වුනොත් වැරදි විකෘතියකුත් එනවා.

මේ එක්ස්පෙරිමන්ට්වල එහෙම දේකුත් වෙනවා. එහෙම වුනහම තමයි ඒවට ගන්න අය ජීවිතේ පවා අයින් කරලා දානවා. විනාශ කරලා දානවා. මොකද විකෘති තියෙනවා එළියේ ඒ සෙන්සර්ස්වලට අහුවෙනවා වෙන වෙනම. අහුවුනහම ඒ සෙන්සර්ස් එකත් එක්කම මොකක් හරි කරපු එක්ස්පෙරිමන්ට් එකක් මනුස්සයෙක් කලොත්, ඒ මනුස්සා එක්කම නැති

කරලා දාන්න වෙනවා. එහෙම නැතිවුනොත් ඒකෙන් ලොකු විකෘතියක් වෙලා ඔය වගේ තමයි ඔය 'පුස්' හිටන් තියෙන්නේ. ඒ 'පුස්' එකක් ගැහුවහම මුළු මිනිස් සංහතියම ලෝකයම වද වෙනවා. ඒක සෙන්සර්ස් එකක් කවුරුත් දන්නැති වුනාට. ඒක ගැහුවොත් මුළු ඔක්කොම වද වෙනවා, මිනිස් සංහතියම ඔක්කෝම පුස් කනවා. ඒක තියෙන්නේ, මේ අපේ අවකාශයෙන් තියෙනවා. එවැනි සෙන්සර්ස් තාම කවුරුත් හොයාගෙන හරියට දන්නැතුව ඇති.

සයන්ටිස්ලා මේක දන්න අයත් ඉන්නවා. ඔක්කොම දන්නේ නැත්තේ නෑ. මොකද සමහර මෙය ඇමරිකාවල එහෙම රහස් එක්ස්පරිමන්ට් කරන මධ්‍යස්ථාන පවා තියෙනවා. ගොඩක් අය දන්නවා මේවා. ඒවත් එක්කම 'සීල්' කරනවා මේ කොරෝනා වුනත් නිකන් හැදිච්ච එක්ක නෙවෙයි. මේ සෙන්සර්ස් එකෙන් ආපු මේවා තව පැතිකඩයත් විශාල ප්‍රමාණයක් තියෙනවා රසායනික බයොලොජිකල් ඔක්කොම හැදෙන්නේ සෙන්සර්ස් හරහා. මේවා ගැන හොඳ අධ්‍යනයක් කරන අයට මේ වගේ කියන්න දේකුත් නෑ. එයාල දන්නවා මිනිස්සුන්ට තියෙන සෙන්සර්ස් විතරක් නෙවෙයි, මේකේ සෙන්සර්ස් අප්‍රමාණයි. අප්‍රමාණ ඒවා අල්ල ගත්තොත් ඒවා අහුකරොත් මිනිස් සංහතියටම තිත. වැරදුනොත් අර දැලිපිහියෙන් කිරි පැණි කනවා වගේ ගින්දරක් එක්ක සෙල්ලම් කලා සෙන්සර්ස් එක්ක සෙල්ලම් කරන එක. ඔය DNA RNA සංයුති පවා වෙනස් වෙනවා. ඔය විද්‍යාඥයන්ට ඒවා කරන්න පුළුවන් දැනට ඔය එක එක නිර්මාණ කරල රහසිගතව කරලා විනාශ කරලා දානවා. කවුරුත් දන්නෙත් නෑ තමුන් මේ හිතනවට වැඩිය ලෝකේ මිනිස්සු තාම, සාමාන්‍ය මනුස්සයා මේවා දන්නේ නෑ. මේ ලෝකේ දකින ලෝකේ නෙවෙයි තියෙන්නේ. ඇත්ත ලෝකේ කවුරුත් දැකලා නැහැ. ඇත්ත ලෝකේ මිනිස්සුන්ට දකින්න බැරි බව.

සියලු ආගම අත් හරිනවානේ බලන්නකෝ. ආතර් සී. ක්ලාක්ගේ ආගම මොකක්ද කියල. බුද්ධ ධර්මය 'ටච්' කරන්නේ, ආගම නෙවෙයි. විද්‍යාඥයෝ ටච් කරන්නේ ධර්මයක් විතරයි. ඒ ධර්මතාවය බුද්ධ ධර්මය. බුද්ධ ධර්මය කියන්නේ ආගමක් නෙවෙයි. ඒකේ 'ස්පීචුවෙල්ටුත්' ලෝකේ මොකක්ද 'සත්‍ය' කියන එක හැමෝටම තියෙනවා අභියෝග

යක්. සයන්ස්ටිස්ලටත් තියෙනවා. එතකොට ඒ අයට මේක අභුවෙනවා. අභුවුනහම ඒ ගොල්ල දන්නවා මේ ආගම බොරුවක් කියලා. **ධර්මයේ පෙන්නන්නේ 'සිස්ටර් මැටිකලී හැදෙන හැටි. හැදිලා ඒවේලම අත් දකින වෙලේම, එවේලෙම ප්‍රත්‍යක්ෂ වන දහමක් ලෝකේ වෙන කොහේවත් නෑ. එකම ධර්මය මේ ධර්මය විතරයි.** අනිත් ඒවා ඔක්කොම තියෙන්නේ දෙවියෝ ලෝකේ මැව්වයි කියලා එයාට බයේ ඉන්නේ. ඒක මිනිස් සංහතියම 'කන්ට්‍රෝල් කරන්න හොඳ ටැලන් එකක් දෙවියෝ ලෝකේ මැව්වයි කියල දෙවියන්ට බයේ ඉන්න එක. නැත්නම් මිනිස්සු කන්ට්‍රෝල් වෙන්නේ නැහැ.

මිනිස් විඤ්ඤාණය හරි විසයි, මේ පෘථිවියට දරා ගන්න බෑ. ඒක නිසා ඔය 'කන්සෙප්ට්' එක ඇතුලේ, පෘථිවිය පොඩ්ඩක් බැලන්ස් නෑ දිව්‍ය ලෝකේ මැව්වයි කියන 'කන්සෙප්ට්' එක ඇතුලේ. එහෙම නැතිවුනොත් මේ සත්ව වර්ගයා මනුස්ස වර්ගයා අනිවාර්යෙන් ම ධර්මයට එන්න ඕනා. එහෙම නැති වුනොත් බැලන්ස් වෙන්නේ නෑ. කොහොමත් සියයට සීයක් ධර්මයට කවදාවත් මිනිස්සු එන්නේ නෑ. ඒක වෙන්නේ නෑ. එතකොට සමතුලිතතාවය පෘථිවියෙන් බිඳ වැටෙනවා. මේකේ කවුරුත් නොදන්න බැලන්ස් එකක් තියෙනවා. කාටවත් නොපෙනෙන පැත්තක් මේකේ තියෙනවා. මේ සාමාන්‍ය මනුස්සයෙකුට තේරෙන්නේ නෑ. **මේක මේ මනුස්සයින්ගේ කතාවක් නෙවෙයි. සත්ත්ව පුද්ගල කතාවක් නෙමෙයි. මේකේ තියෙන්නේ කම්පන සිස්ටම් එකක් ඇතුලේ අපි හිරවෙලා ඉන්නෙ. අපේ කතාව සම්පූර්ණම 'කම්පන සිස්ම් එකක් තියෙන්නේ.** කම්පන එකට අපි කොටු වෙලා ඉන්නේ. ගැලවීමක් නෑ. ෆ්‍රීකොන්සි එකක් වගේ සිස්ටම් එකක් කිව්වොත් හරි නිවැරදියි. ඒකෙන් ගැලවෙන්න කිසි කෙනෙකුට බැහැ ඒ සිස්ටම් ෆ්‍රීකොන්ස් එක.

**බුදුන් වහන්සේ දේශනා කරපු ධර්මය ඒක කම්පන සිස්ටම් එක. තාම මේ පෘථිවියේ තියෙනවා. ඔබට ඒක අහුනොවෙන්න පුළුවන්. සිරස අල්ලනවා වගේ දෙරණ අල්ලනවා වගේ ඒක අල්ලන්න පුළුවන්. ඒක අල්ලන සිස්ටම් එක ඔබ දන්නේ නෑ. විද්‍යාඥයින්ටත් ඒක අභියෝගයක් තමයි.** හැබැයි ඔවුන් දන්නවා ඒක අල්ලන්න පුළුවන් බව, හැබැයි තාම එවුන්ට ඒක අහුවෙලා නෑ. පරීක්ෂණ ගොඩක් කරනවා. අපි ඒක කියන්න

යන්නේ නෑ. අපිට කියන්න පුළුවන් ගොඩක් තියෙනවා. නමුත් ඔවුන්ට තාම 'සිස්ටම්' එක අහුවුනේ නෑ. ඔබ හිතනවාට වැඩිය ගැඹුරු රහසක් ඒ වචන ටික ඇතුළේ තියෙනවා. **මෙතෙක් මේ පෘථිවි ධාතුව තුළ යමෙක් කතා කළ ද, යම් කිසි කම්පනයක් සිදු කරා ද සියල්ලම පවතිනවා. ඒ කම්පන සංඛ්‍යාත කිසි කෙනෙකුට අල්ලන්න බැරි වෙන්න පුළුවන්. නමුත් ඒක කම්පනයක් වත් නැති වෙන්නේ නෑ. අමුතුවෙන් හට ගන්නෙත් නෑ. තියෙනවත් නෙවෙයි නැති වුනත් නෙවෙයි ඒක අමුතුම කතාවක්. හිටපු කෙනෙකුත් නෑ. ඉන්න කෙනෙකුත් නෑ. මැරෙන්න කෙනෙකුත් නෑ කිව්ව වගේ.**

මේක 'සිස්ටම්' එකක්. මේ සිස්ටම් එක හඳුනාගත්ත කෙනෙකුට විතරයි සිස්ටම් එක හදන්න පුළුවන්, හදන එකක් මිසක් තියෙන එකක් නෙමෙයි. හැදුනොත් ඒ 'සිස්ටම්' එක හදන්න කෙනෙක්ට හසු වුනොත්, ඒක කියලා නවත්වන්න නම්, මනසට දරා ගන්න අමාරුයි. මේ ලෝකේ මනුස්ස හිත කියන්නේ මේ වර්ණ, ශබ්ද, ගන්ධ, රස, පහසත් එක්ක තියෙන හිත. වර්ණ, ශබ්ද, ගන්ධ, රස පහස අභිබවා ගිය ස්වභාවය, ඒ ස්වභාවය කුඩු කරපු ස්වභාවය 'මුණි ස්වභාවය', මුණි ස්වභාවය තුළ ශබ්ද, වර්ණ, ගන්ධ, රස, පහස කතා නෑ. එතකොට එතන ඔය අපි කතා කරන වර්ණ ලෝකේ නෑ. ශබ්ද ලෝකෙත් නෑ එතකොට ගන්ධ, රස, පහස ලෝකයක් නෑ, ඔක්කොම එක ලෝකෙකට යටත් වෙනවා. ඒක තමයි කම්පන. සියල්ල කම්පන තමයි. ශබ්ද, වර්ණ කියල දෙයක් ලෝකේ නැහැ, ඒක ඇත්තම ඊලුෂන් එකක්, මායාවක්, බොරුවක් මේක මේ සෙන්සර්ස්වලට මැවෙන එක කොහේවත් තියෙනවා නොවෙයි. විඥ්ඥාණ මායාවක්.

මිනිස් සිත බොලදයි, මිනිස් සිත ඒකත් එක්ක තමයි ඔක්කොම ගිනි ගන්නේ. හැබැයි ඒ සිතට එහා ගිය 'ලේයර්ස්' එකක් තියෙනවා. එහෙම තමයි කියන්න වෙන්නේ. මේක එතනින් ඉවර වෙන්නේ නෑ කතාව. මේකත් ගැඹුරින් ගැඹුරට යන කතාවක්. අපි දැන් කතා කරනවා මේක අපි මීට කලිනුත් කිව්වා අනාගාමී භූමිය කියල. අනාගාමී භූමිය කියන්නේ, 'ගති නිමිති', 'කම්ම නිමිති' කියන්නේ ලෝක සංඥා. ඒ කියන්නේ අම්ම, තාත්තා, ගෙවල්, දොරවල්, ඉර හඳ, ගහ කොළ, දුව, පුතා ඔක්කොම ශබ්ද වර්ණ ඒවා සිතුවිලි. ඒවා ගැන හිත හිත දුක්විඳින

එක සැප විඳින එක, ඔක්කොම ශබ්ද වර්ණ වලින්ම මැවෙන මායාවේ තවත් එක් මායාවක් විතරයි. මායාවක් ඇතුළේ මායාවක් මැවුන කියල හීන ඇතුලේ හීන දැක්කා කියල වැඩක් නෑ එහෙම, කම්පනය වෙනවා දුක්වෙනවා අඬනවා වැලපෙනවා ඒවා ඔක්කොම තියෙනවා.

එතකොට මේ මැටීරියල් වර්ල්ඩ් එක මේක ලෝක සංඥා බැස ගත්තොත්, ඒ කියන්නේ දරුවෝ ඉන්නවා, ගෙවල් දොරවල් තියෙනවා, සත්තු ඉන්නවා, දිව්‍ය ලෝකත් තියෙනවා, නිරයත් තියෙනවා, මාත් ඉන්නවා. ඔක්කොම ඉන්නවා කියලා දෙයක් තියෙනවා කියල ගත්ත ලෝකය, කාම භූමිය, සදෙව් ලොව, මනුස්ස ලෝකය, සතර අපාය, මේ ඔක්කොම තියෙනවා. ඒ විතරක් නෙවෙයි මේකට අනිත් ඒවත් අයිතියි. දැන් මේ ලෝක සංඥා තියෙනකම්ම ලෝකෙක උපදිනවා. හැබැයි මෙතන භෞතිකව අපි මේ කතා කරන මේ ලෝක සංඥා බැස ගන්නේ නැත්නම්, ශබ්ද, වර්ණ, ගන්ධ, රස, පහස කියන ආයතනවලට මැවෙන ලෝකය සංඥා තියෙනවනේ. අපි කියන වගේ ගති නිමිති කම්ම නිමිති කියලා, මේ නිමිති සකස් වෙන්නේ නැත්නම් අනාගාමී ඒ කියන්නේ කම්පන විතරයි. ඒකයි 'ශුද්ධාවාස' ඒකයි අනාගාමී. රූප දර්ශනයෙන් මිදිලා ඕභාසය මතු වෙනවා කිව්වේ ඕකයි.

බුදුන් වහන්සේගේ පර්යාය අනුව බුදුන් වහන්සේ දේශනා කරන ධර්මය අනුව රූප දර්ශනයෙන් මිදිලා 'ඕභාසයට' එනවා කියන්නේ, තනිකර සෙන්සර්ස් වල ඒ කියන්නේ වර්ණ, ශබ්ද, ගන්ධ, රස, පහස, උණුසුම, සීතල, තද ගතිය ආයතන හයම මිදෙනවා, මිදිලා ඕභාසය මතු වෙනවා ඒ අනාගාමී. කතා කරන්න දෙයක් ඉතුරු වෙන්නේ නෑ. මේක කඩන්න බෑ කාටවත් රූප දර්ශනයෙන් මිදුන 'ඕභාසය' මතු වන ස්වභාවයයි අනාගාමී. ආර්යයන් වහන්සේ කියල දෙනවා කමටහන් දෙනවා පිරිසිදු කරනවා. අනාගාමී භූමිය, හැබැයි ඒක වෙන්නේ නෑ. එක තැනකින් ඒක වෙන්නේ නැත්තේ. මේක වහගෙන ඉන්න තව භූතයෙක් ඉන්නවා. ඒ භූතයා තමයි සක්කාය දිට්ඨිය. 'සක්ඛාය දිට්ඨිය' කුඩු වෙනකම් කවුරුත් අනාගාමී වෙන්නේ නෑ. මේක තමයි ජටිලයෝ, බ්‍රාහ්මණයො, නිගන්ඨයොන්ට තිබ්බ්ච ප්‍රශ්නය. මොකක්ද මේ භූතයා කියල භූතයා හොයා ගන්න බැහැ.

"හේතුං පටිච්ච සම්භූතා හේතු භංගා නිරුජ්ජතී" කියන භූතයාව බුදුන් වහන්සේ පෙන්නුවා. ඒක කඩන හැටි. මේක කඩන් නැතුව ඔක්කොම භාවනා කරා, කරාට වැඩක් නැහැ එතකොට රූප ධ්‍යානවලට ගිය රූපාවචර බ්‍රහ්ම ලෝකවලට ගිය, බ්‍රහ්ම පාරිසජ්ජය, බ්‍රහ්ම පුරෝහිතය, මහා බ්‍රහ්මයා ඔක්කොම හොයා ගත්තා. හොයා ගත්තා කියන්නේ මේක සිත අභ්‍යන්තරයේ, මේ ස්ථරය මේ කතා කරන්නේ. නමුත් කවුරුවත් අනාගාමී නෑ. ඒක කැඩුවේ එකම එක තැනින් සක්කාය දිට්ඨිය ප්‍රහීන කරලා, එතකොට නැවත උපතක් නැතිවෙනවා එන්නෙ 'ශුද්ධාවාස' කතාව. හැබැයි එතන තියෙන්නේ ඔය රූප දර්ශනයෙන් මිදුන 'ඕභාසය' මතුවෙන තැන අනාගාමී 'සක්ඛාය දිට්ඨිය' ප්‍රහීන වෙලා තියෙන්නේ. මේ ධර්මස්කන්ධය තුළ තියෙන වටිනාම සංධිස්ථානය තමයි 'සක්ඛාය දිට්ඨි' ප්‍රහීන වන එක. ඒකයි සක්ථාය දිට්ඨි ප්‍රහීන නොවී කිසි කෙනෙක් අනාගාමී වෙන්නේ නෑ උපදිනවා ආයි, උපදින්න හේතුව සක්ඛාය දිට්ඨියයි.

සක්ඛාය දිට්ඨිය කියන්නේ මේකේ බුදුන් වහන්සේ ලෝකයට හෙළි කරපු දැවැන්ත පර්යාය. ඒක කුඩු කරන්න තමයි පටිච්චසමුප්පාදය ගෙනාවේ. 'පටිච්චසමුප්පාදය' ගෙනාවේ නැත්නම් ඒක ඒ විදිහට ප්‍රායෝගිකව දැකලා ඒක මතුවුනේ නැත්නම් බුදුන් වහන්සේට සම්මාසම්බුද්ධ යයි කියලා කියන්නත් බෑ එතනින් එන්නේ, සක්ඛාය දිට්ඨිය කුඩු වෙනවා. ඒ 'දිට්ඨිංච අනුපගම්ම සීලවා දස්සනේන සම්පන්නෝ' කියන ඒ දර්ශන ඥානයෙන් එන 'සත්‍ය ඥානයෙන් සක්ඛාය දිට්ඨි ප්‍රහීන වෙන්නේ. ඒක තමයි ඒකෙ තියෙන 'කී' එක, යතුර කියලා. මේක තමයි මේකේ තියෙන රහස. මෙතනින් තමයි මේක වෙන්නේ. ඒ කියන්නේ මේ මායාවක් ඇතුලේ දැන් අපි කතා කරන හැම කම්පනයකම කෝටි ප්‍රකෝටි ගානක කම්පනවල නොසැලකිය හැකි තරම්. ඒ තරම් මේ කම්පන අති විශාලයි. කතා කරන්න බැරි තරම් ඒ කියන්නේ අපි කතා කරන හැම එකම, ඒ කියන්නේ අපි හිතන හැම එකම, අපි ගන්න හැම එකම කම්පනයක්. ඒ කම්පනය තවත් කම්පනයට හේතු වෙනවා. ඒ කම්පන එකක්වත් පවතින්නෙත් නෑ. ඒ හැම කම්පනයක්ම, ඊගාව කම්පනය ඒක නෙවෙයි. එක කම්පනයක් ඉපිද නිරුද්ධ වෙන්න කලින්,

වෙන කම්පනයක් වෙනවා. මේ ඊගාව ආශ්චර්ය ඒකයි. ඒක අධික වේගයක්.

මේක පුදුම කතාවක්. ඒ අර මනුස්ස සිත අභිබවා ගිය මුණි ස්වභාවයක් කිව්වේ. එහෙම ස්වභාවයක් තියෙන බව 'බුද්ධ ස්වභාවය' ගැන නෙවෙයි මේ කතා කරන්නේ. බුද්ධ ස්වභාවය ගැන කතාවේදී අපට බුදුන් වහන්සේ පෙන්නුවා 'පාත්' එකේ යන්න. හැබැයි ඒ 'මුණි' කියන ස්වභාවයට, ඒ කියන්නේ මෙය කියන ස්වභාවයට ඔය 'ශුද්ධාවාස' ස්වභාවයට අයිතිත් නෑ. ඒ කියන්නේ මේ අම්මා තාත්තා, ගෙවල් දොරවල් ඒ හැම එකම දෙයක් නොවන ස්වභාවයට නිගන්ඨයොත් ඇවිල්ලා හිටියා. ඒවායෙන් මිදිලා භාවනාව තුළින් වෙනම කම්පන ස්වභාවයට තලයක සිහිය පවත්වමින් හිටියා. ඒ ගොල්ලෝ මුණි තමයි. ඒ ගොල්ලෝ 'මැටීරියල් වල්ඩ්' එකෙන් අයිනට වෙලා හිටියේ. හැබැයි හිටියට එතන ඉන්න බෑ. ඒකේ එහෙම ඉදීමක් සිද්ධ වෙන්නේ නෑ. මොකද ඒකේ දෘෂ්ටිය තියෙනවා 'සත් දෘෂ්ටිය', 'සත් දෘෂ්ටිය' කියන්නේ 'ඉත්ථ දෘෂ්ටියක්' තියෙනවා ඉත්ථ කම්පනයක් ඒ තුළ තියෙනවා. ඒ කියන්නේ තියෙනවා වගේ දැනෙන කම්පනයක් එක්කයි ඒ ස්වභාවය පවතින්නේ, ඒ 'මුණි ස්වභාවය' ඒ අතින් නිගන්ඨයින්ගේ ස්වභාවය. හැබැයි මේ බුද්ධ කියන ස්වභාවය ඇතුලේ මේ කතාව ටිකක් වෙනස් තෙරුවන් සරණයි.

(ඉහත දේශනාව මෙතනින් අවසන්)

**උපාසිකාව :** තේරුවන් සරණයි ආර්යයන් වහන්ස, අර 'සෙන්සර්ස්' කතාව ගැන කතා කරපු නිසා දැන් බුදුරජාණන් වහන්සේ ගොඩාක් දේවල් ඒ කියන්නේ සාමාන්‍ය ඇසකට දකින්න බැරි දේවල් ගොඩාක් දැක්කා කියලා කියනවා. ඒ කියන්නේ දැක්ක බවට ප්‍රකාශ කරල තියෙනවා. එතකොට ඒ කියන්නේ බුදුරජාණන් වහන්සේ සාමාන්‍ය කෝටි ප්‍රකෝටි ගාණක සෙන්සර්ස්වලින් ගන්න දැනුමක් උන්වහන්සේ ලෝකෙට ප්‍රකාශ කරලත් තියෙනවා. ඒ වගේම ආර්යයන් වහන්ස වර්තමානයේ දැන් අර 'එලයිමන්ට්' ඒ වගේ කියන කතාවකුත් එනවා. දැන් මේ දේවල් අතර ආර්යයන් වහන්ස මීට කලිනුත් බුද්ධ ස්වභාවය ගැන පැහැදිලි කිරීමක් අපට කරල තියෙනවා. ආර්යයන් වහන්ස පුළුවන්ද අපට තවදුරටත් මේ බුද්ධ ස්වභාවය ගැන පැහැදිලි කිරීමක් ලබා දෙන්න.

**ආර්යයන් වහන්ස :** ඒක ආර්යයන් වහන්සේට තමයි ඉන්ඩිකේට් වෙන්නේ. මේකේ තව දෙයක් කියන්න ඕනා. බුදුන් වහන්සේ මේ සෙන්සර්ස්වල එහෙම දැනුමකින් කියලා නතර වුන එකක් නෙවෙයි. මජ්ජේ සූත්‍රයේ අවබෝධය ඉතාම ගැඹුරු එකක්. ඒකේ මුළු ධර්මස්කන්ධයම තියෙනවා. ඒකේ මෙච්චර ප්‍රසාරණයක් තියෙනවා කියලා කිසි කෙනෙක්ට තේරෙන්නේ නැහැ. ඇත්තටම කිව්වොත් බුද්ධ විෂය අචින්ත්‍යයි කියන්නේ, මේකේ මහා පුරුෂ කියලා බුදුන් වහන්සේ කියනවානේ **'මජ්ජේ සූත්‍රයේ 'යො උභෝ අන්තේ විදිත්වාන - මජ්ජෙ මන්තා න ලිප්පති' ' තං බ්‍රෑහී මහා පුරුසෝ - සේද සිබ්බනි මජ්ඣගා' 'තං බ්‍රෑහී මහා පුරුසෝ' කියනවනේ, මෙක දැක්කොත් මහා පුරුෂයෙක් කියලා. මහා පුරුෂයාට මේකේ තියෙන විශේෂය තමයි බුදුන් වහන්සේ දෙන වචනය 'වේදගූ'** කියලා කියන්නේ. 'වේදගූ' කියල කියන්නේ බුදුන් වහන්සේ දුන් නිර්වචනයක්. ඔහු මේ ලෝකේ සියල්ල අවබෝධ කලා කියන එකයි. ඒ කියන්නේ සියල්ල අවබෝධ කලා කියන්නේ, ඉන් එහාට අවබෝධ කරන්න දෙයක් නෑ. ඔබ වහන්සේ 'කතකරණීය' අපි නම් තාම මුකුත් කර ගෙන නෑ කියල අර ආනන්ද හාමුදුරුවන්ට කලින් අර හිටපු උපස්ථායක 'මේඝීය' උපස්ථායක කියනවා වගේ. **මේ කතකරණී තැනට එන්න 'වේදගූ' කියනතැන මහාපුරිසෝ කියන තැන කල්‍යාණ මිත්‍රයා පෙන්නන තැන, එතනයි තියෙන්නේ.** මේක ඇත්තටම සුවිශේෂී කතාවක් තමයි මේ කියන්න යන්නේ. මොකද ඔය ප්‍රශ්නය අහන්නේ 'එල්ලයින්මන්ට්' එක කියන්නේ මොකක්ද? මොකක්ද බුද්ධ ස්වභාවය කියන්නේ කියලා.

**උපාසිකාව :** එහෙමයි ආර්යයන් වහන්ස

**ආර්යයන් වහන්සේ :** ඔය තිස් එක් ලෝක ධාතුව සිත තුළින් දකින කොට එකම අරමුණේ තිස්එක් ලෝකධාතුවම දකින ආකාරය. කාම භූමිය, රූප භූමිය, අරූප භූමිය තුන් භූමියම එකම අරමුණේ තියෙන ආකාරය, ඒ වගේම 'සංඛාර උප්පත්ති සූත්‍ර'වල පෙන්වන ආකාරය බුදුන් වහන්සේ තිස එක් ලෝක ධාතුවම එකම අරමුණේ දකින හැටි 'සංඛාර උප්පත්ත' සූත්‍රය කියලා අපි පැහැදිලි කරා. මෙතනදී මේ එකම අරමුණ කියන්නේ, මේ අරමුණේ දෙයක් කියල දකින තැන. මේ අරමුණ දෙයක්

වෙලා විතරක් නෙමෙයි, අරමුණ දෙයක් වෙන කොට ඒකේ අගයක් වටිනාකමක්, ඒකේ රූප සංඥාවක්, ඒකේ දෙයක් වගේ දැනෙන තැන, ඒ දැනීම තුළ දැනෙන ආත්ම සංඥාව ඉත්ථභාවය සේරම තියෙනවානේ ඔය අරමුණේ, ඔය අරමුණේ හැම එකම තියෙනවා.

මේ මොහොතේ හැම ක්‍ෂණයේම එක අරමුණක් විතරයි, **හැම මොහොතේම ඒ මොහොතේ ඒ අරමුණ විතරයි. ඒ මොහොත ඒ මොහොත විතරයි. 'ක්ෂණසම්පත්ති' කිව්වත් ඒකමයි. හැම මොහොතෙම ඒ සිත, ඒ සිත විතරයි. 'අවුත්වා සම්භූතං - වුත්තානං භවිස්සති' 'පෙර නොතිබීම හටගත්තා' 'ඉතුරු නැතුවම නිරුද්ධ වෙනවා.' පවතින සිතක් නෑ, එක මොහොතක එක සිතක් පවතිනවා.** එක සිතක් හට ගෙන නිරුද්ධ වෙනවා. ඒකත් ඒ කම්පනය වන වේගයට සකස්වෙන සිස්ටම් එකෙන්මයි එන්නේ. දැන් අපි මීට කලින් පැහැදිලි කරන කොට කිව්වා ඒ සියල්ලම එතනින් අරගෙන තමයි මේකට එන්න වෙන්නේ. පෙන්නුවා 'යො උභොන්තේ විදිත්වාන මජ්ජේ මන්තා න ලිප්පති තං බ්‍රෑහි මහා පුරිසෝ සේද සිබ්බනි මජ්ජගා' කියලා මජ්ජේ සූත්‍රයෙන්ම තමයි මේකත් එන්නේ. මෙන්න මේ අපි කතා කරන 'අබොප්පා චේතෝ විමුක්තිය' කියන පැත්තෙන් මොකක්ද මේ එල්ලයිමන්ට් වෙනවා කියන්නේ මොකක්ද මේ එල්ලයිමන්ට් එක මොකක්ද මේ වේදේ තුළ තියෙන එල්ලයිමන්ට් එක මොකක්ද බුද්ධ ධර්මය තුළ කතාවෙන **'බුද්ධ ස්වභාවය'** මොකක්ද **අනුත්තර** ස්වභාවය මොකක්ද මේ **විමුක්ති සාරා** කියල කිව්වේ.

බුදුන් වහන්සේ මේක පෙන්නනවා. බුදුන් වහන්සේ ම කියනවා මේක විපස්සනා ඛණික සමාධිය, ඒකෙන් තමයි නිවන් දකින්නේ. **'සමථ යානිකයා' 'විදර්ශනා යානිකයා' කියල කතා කරාට, සමථ විපස්සනා යුගන්ධන් ගමනක් තමයි කොහොමත් තියෙන්නේ.** කොහොමත් මේකේ **'විපස්සනා ඛණික'** සමාධියෙන් තොර කිසි කෙනෙක්ට නිවන් මගක් නෑ. අවසානයේ විපස්සනා ඛණික සමාධියක් තමයි ලබන්නේ. **'විපස්සනා ඛණික' සමාධියක් කියන්නේ මේ මොහොතේ 'යන්හී යන්හී තන්ත්‍ර තන්ත්‍ර' 'එතන එතන එතන එන' සිත දැකලා එකේ දෙයක් නැති බව දැකලා, ඒ සිතේ 'විමුක්ති සාරා' කියන එකයි** කියන්නේ. ඒ විදිහට **උපදින උපදින සෑම සිතම ප්‍රවාහයම විමුක්ති 'සාරා' වෙනවා.** එතකොට **ඒ සිතුවිලි**

**එකක්වත්, හරයක් දෙයක් මුකුත් පනවන්න බෑ.** ඕක තමයි ප්‍රායෝගික පැත්ත. ප්‍රායෝගිකව **අභ්‍යන්තර සිහියට මේක අසුවෙන්නේ මේක සම්මා ඥාන. ඒ කියන්නේ අභ්‍යන්තර ඥානයට මේක හසුවෙන්නේ මේක ඥායස්ස අධිගමාය කියන මග.**

එතකොට 'ඥානය' කියන්නේ සිහිය කියන්නේ, 'ඥනය' කියනකොට සිහියමයි දියුණු වෙලා 'දර්ශන ඥානය' වෙන්නේ. එතකොට **දෙයක් නැති බවට දැනෙන සිහියයි, 'ඥාන සම්ප්‍රයුක්ත'** වෙන්නේ. ඒක තමයි ඥායස්ස අධිගමාය වෙන්නේ. සම්මා ඥාන සම්මා විමුක්ති පැත්තට එන්නේ '**දසාංග සමන්නාගත අරිඅට්ඨංගිකෝමග්ග**' කියනකොට 'මහා චත්තාරි' සූත්‍රයේ මේය හොඳට පෙන්වනවා. ආර්ය අෂ්ඨාංගික මාර්ගය දසාංග කරලා පෙන්නුවා, නිවනට උපනිශ්‍රය වන ආකාරය නිවනත් එක්කම පෙන්නුවා. හැබැයි 'විමුක්ති සාරා' කියන්නේ, එතනට තමයි යන්නේ. ඒක 'අරහත්ත සූත්‍රයේ' 'විමුක්ති සාරා' කියල බුදුන් වහන්සේ වෙන වචනයක් කියන්නේ නෑ 'මාපුත්‍රයෙකි' 'බුද්ධපුත්‍රයෙකි' 'ශ්‍රාවක බුද්ධ' වෙමි. අනුත්තර ස්වභාවයට පත්වුනෙමි, විමුක්ති සාරා වෙමි. මේවා මේ සූත්‍ර කාටවත් බොරු කරන්න බෑ. බුදුන් වහන්සේ කියන්න ඕන තැන්වල මේ සූත්‍රය හොඳට ඉස්මතු කරලා ඉවරයි. ශූන්‍යත පටිසංයුක්ත දේශනා කියන්නේ මොනවද කියලා ඒවායෙන්ම විග්‍රහ වෙලා ඉවරයි.

මීට කලින් අපි පැහැදිලි කරා මේ ශුන්‍යත පටිසංයුක්ත කියන්නේ මේ අනුසෝතයේ නෙවෙයි, මේ 'නේචර්' එක කියලා අපි කතා කළා. අපි පෙන්නුවා 'නේචර්' එක කියන්නේ හැම තිස්සේම පැවැත්මක් දිහා බලනවා කියලා. ඔය නේචර් එක කියලා එහෙම දේකුත් නෑ. මේ කවුරුත් කරන කෙනෙක් එහෙම දෙයක් පුද්ගල කතා මොනවත් නෑ. මේ කතාවේ මේක තනිකර 'සිස්ටමැටිකලි' 'ඔටෝ මැටිකලි' මේක නිකන් සංසිද්ධි ටිකක් විතරයි. ඒකේ වෙන  අමුතු කතාවක් නෑ කොහේවත්. එතකොට මෙන්නන මෙතන තමයි අපි දැන් සුද්ධ කරගෙන එන්නේ, ආයෙමත් මජ්ජේ සූත්‍රයට තමයි ඔය එතනින් තමයි ලිහිලා යන්නේ. එතන තියෙන්නේ අපි දන්නවා සාමාන්‍යයෙන් අපිට කතා කරන්න පුළුවන් ඇස, කන, දිව, නාසය කියනවා වගේ වර්ණ, ගන්ධ, රස, ඕජා කියල කියනවා වගේ, ඊට පස්සේ අපිට කතා කරන්න පුළුවන්

ඇලෙන, ගැටෙන ස්වභාවය නිසා රාග, ද්වේශ කියල කතා කරන්න පුළුවන් රාග ද්වේශ මෝහ තුනීවෙන ස්වභාවය අභ්‍යන්තයට අසුවෙනවා කියන්න පුළුවනි දෙයක් ඕනම ආරම්මණයක්. එතකොට **ඒ ආරම්මණය ශබ්දාරම්මණය, වර්ණාරම්මණය, ගන්ධාරම්මණය, රසරසම්මණය, පොට්ඨබ්බාරම්මණය, මනාරම්මණයක් කියලා ඒ ටික ඔක්කොම පැත්තකින් තිබ්බා. ශබ්ද, වර්ණ, ගන්ධ පැත්තකින් තිබ්බා, ඊට පස්සේ ආරම්මණයක් විතරක් කියලා ගන්නවා. එතකොට කම්පන ස්වභාවය එනවා.** අපි දන්නවා 'වේදනා සංඥා නිරෝධ සමාපත්තියට' එනවා. අපි දන්නවා 'නිරෝධ සමාපත්තිය කියන්නෙත් කම්පන ස්වභාවයක් නොදැනෙන ස්වභාවයක් කියලා, මේ ඔක්කොම කතාව කියන්නේ. හැබැයි එක තැනක් හොඳින් පිරිසිදු කරගන්න රැවටෙන්න එපා. ඒක මේ හැම තිස්සෙම කතාත් එක්ක ගැටෙන තැනක් එනවා. බුදුන් වහන්සේ ලෝකෙට පෙන්නපු එළි කරපු කාර්ය අමතක කරලා ධර්මය දකින්න එපා. ඔබට වරදිනවා අනිවාර්යයෙන් බුදුන් වහන්සේ ලෝකයට හෙලි කරපු පෙර නොඇසු විසූ දහම කියන්නේ **'පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු' කියල දේශනා කරන්නේ, මේ අවබෝධ කළ යුතු දහමක් තියෙනවා 'සංඛිත්තේ නිබ්බිදාය' කියලා දේශනා කරන්නේ 'පටිච්චසමුප්පාද ධර්ම්මේසුධම්මං' කියන තැනින්, ඒ කියන්නේ මේ දර්ශන ඥානය 'දිට්ඨිංච අනුපගම්ම සීලවා දස්සනේන සම්පන්නෝ'** කියන එක, ඒක මගඇරියොත් සබ්බාසව සූත්‍රයේ 'දස්සනා පහා තබ්බ කියල මේ හැම සූත්‍රයකම දර්ශනයෙන් පටන් ගන්න එක.

ඔබ දර්ශනය නැතුව කතා කරොත් විනාශයි, ඔබ නිගන්ඨයෙක් වෙනවා. ඊට පස්සේ ඔබ මේ කියන ආර්යයන් වහන්සේ කියන එක පවා ඇදගෙන යාවි. ආර්යයන් වහන්සේ කිව්වා කියලත් ඔබ කියාවි. ආර්යයන් වහන්සේ කිව්ව කියල කිව්වත් ඔබ නිගන්ඨයෙක් විතරයි. ඇයි ඒ ඔබට මේ දර්ශන ඥානය නැත්නම්, ඔබ ඒ 'දර්ශණ විසුද්ධියට' පත්වෙලා නැත්නම් ආර්යයන් වහන්සේ මොනවා කිව්වත් වැඩක් වෙන්නේ නැහැ. මේ සේරම **එක තැනක් තියෙනවා මේ සියල්ල ලිහා ගත යුතු. ඒක තමයි මුළු බුද්ධ ධර්මයම කියලා කියන්නේ. ඒ කියන්නේ දර්ශනය, 'බුද්ධ දර්ශනය' 'සත්‍ය ඥානය' මේ ඉතුරු ඒවා එකක්වත් කතාකරාට වැඩක් වෙන්නේනෑ මෙන්න මෙතන සුද්ධ කරගන්නේ නැතුව, මේක කියන්න**

**හේතුව කියන්නම්, මේ බුද්ධ දර්ශනයෙන් තමයි ඔබේ ඔය ආත්මය කියන එක නැතිවෙන්නේ, ඔබේ 'ආත්ම දෘෂ්ටිය' නැති වෙන්නේ.**

ආත්මය කියන එක දිය වෙලා ගිහිල්ලා අවසානයට ආත්ම සංඥාව දුරුවෙන හැටි ඔබට හම්බවෙනවා. ඒ කතාව තුළ ඔබට අහුවෙනවා. නමුත් ඒක සිද්ධ වෙන්නේ නෑ ඒක නොදැනෙන ස්වභාවයට ගිහිල්ලා කම්පන ස්වභාවය දියවෙන ස්වභාවය නිගන්ඨයින්ට හමුවෙනවා. ඒ ජටිලයෝ නිගන්ඨයෝ, බ්‍රාහ්මණ ධ්‍යානවලත් ගිහිල්ලා නොදැනෙන ස්වභාවයේ හිටියා, නමුත් සක්ඛාය දිට්ඨිය නැතිවෙලා තිබුනේ නෑ. ඒක ඔබට සූත්‍ර ගණනාවක දැක ගත හැකියි. ඔබ ඔය සූත්‍ර හොඳට අධ්‍යනය කරල බලන්න. 'පොට්ඨපාදය' කියන තැන සුවිශේෂීව මේක විග්‍රහ කරනවා. බුදුන් වහන්සේ ඔබ ඉන්න ආත්ම දෘෂ්ටියේ ඉන්නතාක් 'පොට්ඨපාද ඔබට මේ නිවන අවබෝධ වෙන්නේ නෑ. ආත්ම දෘෂ්ටිය අත්හැරපු දවසට ඔබ නිවන් දකිනවා, **මේ ආත්ම දෘෂ්ටිය සක්ඛාය දිට්ඨිය' කියන එක, ඒක තමයි ඔබගේ මුළු ධර්මයම වෙන්නේ. ඔබ එතෙන්ට ගහපු ගමන් වෙන්නේ, ඔබ එතනින් එහාට කොහොමත්ම නියත සම්බෝධිපරායනයි. ඔබ නිවන් දකිනවාම තමයි. ඒ කියන්නේ අනාගාමී වෙන්නෙත් එතනින්ම තමයි.**

**සෝවාන් නොවී කිසි කෙනෙක් අනාගාමී වෙන්නේ නැහැ. ඒ කියන්නේ නැවත උපදිනවා, සක්කාය දිට්ඨිය තියෙනකම් නැවත උපදිනවා. සක්කාය දිට්ඨිය ප්‍රහීන කරන තැනින් අන්න එකේ දිගුවක් විදිහට ඇවිල්ලා ආත්ම සංඥාව එතෙක්, එක අවස්ථාවක් රූප දර්ශනයෙන් මිදිලා ගිහිල්ලා අන්න එහෙම ඕභාසයට එන්න පුළුවන්, අරහත්වයට පත්වෙලා නෑ එහෙම වුනොත් අනාගාමී. එතන තමයි තැන පෙන්නන්නේ. එතන සෙන්සර්ස් විදිහට දකිනවා. ආයතන විදිහට දකිනවා. එතකොට ආත්මයක් පුද්ගලයෙක්, සත්වයෙක් නෑ,** එතනින් තමයි ඒ ස්වභාවය එන්නේ. හැබැයි 'සුද්දාවාස' ආයේ එයාට උප්පත්තියක් පනවන්න බෑ. ආත්ම කතාව, පුද්ගල කතාව මුකුත් නෑ. හැබැයි **අර සංඥාව, දැනෙන ස්වභාවය තියෙන නිසා තමයි 'සුද්දාවාස' පනවන්නේ 'සුවිසුද්ධං' වෙලානෑ,** ඒ ස්වභාවය තුළත් ඔබට මතක ඇති සමහරවිට අපි පැහැදිලි කරන කොට මේ ඔක්කොම එකින් එක එකින්එක.

මේ බුදුන් වහන්සේ පෙන්වන්නේ කොහේවත් එළියේ තියෙන ලෝකයක් එහෙම දෙයක්වත් නෙවෙයිනේ. බුදුන් වහන්සේ පෙන්වන්නේ 'චිත්ත ස්වභාවය තුළ මේ ස්වභාවය සකස් වෙන ස්වභාවයනෙ පෙන්වන්නේ. එතකොට ඔබ ඒක දැක්කා අපි ඒක ඔබට හොඳින් පෙන්නුවා. වෙනම සම්පූර්ණ දවසක් ම ඒක වෙනුවෙන් අපි ගතකරා. ඒ කියන්නේ මේ පෙන්නුවේ අවිහය, අතප්පය, සුදස්සිය, සුදස්සය අකනිඨාව කියන ඒ අනාගමී භූමිය පෙන්නුවේ. 'පංච' සුද්ධාවාස භූමිය පෙන්නුවේ. රූපාවචර බ්‍රහ්ම ලෝක ස්වභාවයෙන් පෙන්නන්නබෑ. ලෝක සංඥා, අපි කතා කරන ඕලාරික අර අම්ම, තාත්තා, ගෙවල්, දොරවල්, ඉර, හඳ එතකොටයි මේ මනුස්සයින්ටත් තේරෙන්නේ මෙන්න මේ කියන ගති ස්වභාවය. මෙතෙනින් මිදෙන තාක්කල් 'එකම ස්වභාවයට' එන්නේ නෑ. එකම කම්පන ස්වභාවයකට එන්නේ නෑ. එකම කම්පන ස්වභාවයක් කියලා සේරම දේවල් ශබ්ද වර්ණ ගන්ධ, රස පහස, එහෙම දෙයක් නැති බව දැකලා කම්පන ස්වභාවයට එහෙම එන්න ඕනා. නමුත් සක්කාය දිට්ඨිය තියාගෙන එන්න බෑ. සක්කාය දිට්ඨිය එහෙනම් කලින් එතෙන්ට යන්න, එතකොට තමයි බෞද්ධයෙක් වෙන්නේ.

ඉස්සෙල්ලාම එයා බෞද්ධයෙක් වෙන්න ඕනා. **බෞද්ධයෙක් කියන්නේ 'භව නිරෝධය' දකින්න ඕනා එතන දෙයක් නැති බව දකින්න ඕන. එහෙම එතන තමනුත් නැති බව** දැනුමට හරි එතනින් සක්කායදෘෂ්ටිය කුඩු කරන්න ඕනා. ඒ සක්කාය දෘෂ්ටිය තියාගෙන මේ කිසිම දෙයක් කරන්න බෑ. එහෙම නිගන්ධයෙක් විතරයි වෙන්නේ. එතනින් 'අවිහය' ඒ පැත්තට එනකොට කෙලින්ම අපි කතා කරන්නේ මහා කල්ප දාහයි. මනුස්ස ලෝකේ මහා කල්ප දාහක් ඔය අවිහයට එක දවසයි. හිතන්නකෝ ඔය මොකක්ද කියන්නේ කියලා, මහා කල්ප දාහක්. එතකොට මහා කල්ප දෙදාහක් අතප්පයට එක දවසයි. එතකොට මහා කල්ප හාර දාහක් ඔක්කොම දෙගුණ කරලා බුදුන් වහන්සේගේ විග්‍රහය මේ දෙගුණ කරලා තියෙන්නේ. සමහර අය මේවා ගණන් ගන්නේ නෑ. මේවා ඉතින් සමහර විට ඔය පොත්වල තියෙන සුරංගනා කතා කියලා. ඔබ නොසිතන විශාල කතාවක් මේකේ ඇතුලේ තියෙනවා. ඇත්තම කතාව තමයි ඔය.

ඔබට නොතේරෙනකම ඔබේ තියාගන්න, බුද්ධ විෂය අචින්තයි. ඕකතමයි ඇත්තම කතාව. ඒ අය අනාගාමී කියලා, ඇයි මේ තරම් කාලයක් ගැන හිතන්න පුළුවන්ද? කල්ප හතක් ගැන කතා කරන්නෙත් අපි හරි අමාරුවෙන්. කල්පයක් ගැන කතා කරන්නෙත් අපි අමාරුවෙන්. අපිට ඒ එකක්වත් මැෂිමන්ට් නෑ, ඇත්තම කිව්වොත් විශ්වාස තියෙනකම්ම එහෙම කිව්වොත් හරි නිවැරදියි. ආයිත් කොහොමත් ඒ ලෝක මේ මනුස්ස ලෝකවල වගේ එ වගේ මේ ආයතන මේ ඒ කතා ඒවා මොකක් වත් නෑ. සත්ව කතා එහෙම කතානෑ. ඔය අනාගාමී භූමිය 'ශුද්ධාවාස' කියන්නේ, 'ශුද්ධාවාසම' තමයි. එහෙම කොහේවත් තියෙන වාසයක් කරන එහෙම ගෙයක් තියෙන එහෙම එකක් නෑ. 'මැටීරියල්ඩ් වර්ල්ඩ්' එකේ මිනිස්සුන්ගේ මානසිකත්වය ස්වභාවයක්. බොළඳ මනසේ ස්වභාවයක්. එහෙම හිතන කිසිම දෙයක් නෙවෙයි ඔබ ඔය කතා කරන මේ කතාව ඔබට ගෝචර නෑ.

**මේ කතාව කිව්වොත් ඉදිකටු සිදුරක් තරම් කුඩා සිදුරකින් කෝටි ගණන් දෙවිවරු යනවා කියපු කතාව ගත්තොත්, එක අංශුවේ කතාව තමයි මේ තියෙන්නේ.** ඔය තියෙන මෙය කතා කරන ශුද්ධාවාස මුළු ගැලැක්සියම එකම අංශුවක්. මේකෙ තියෙන්නේ එක අංශුවයි මනුස්ස සිතට මේක තේරුම් ගන්න බෑ. මේක ඔය හිතන ප්‍රේම් එක ඇතුලේ මේක නෑ. එකම අංශුවේ ස්වභාවයක් මේ කියන්නේ. නමුත් එකම අංශුවේ මුළු පාන්පිටි ගෝනිය අරගත්තේ ඔය නිසා තමයි. පාන්පිටි ගෝනියේ තිබුනේ එකම පාන්පිටි අංශුවයි. මුළු ගෝනියම පිරිලා තියෙන්නේ එක ජාතියේ අංශුවලින්. **මේ එක අංශුව ඔක්කොම තියෙන්නේ. ඒකයි මෙතන තිස්එක් ලෝකධාතුවම එක අරමුණේ තියෙන්නේ. එක අංශුවේ තියෙන නිසා ඒකයි කාම භූමිය, රූප භූමිය, අරූප භූමිය තුන් භූමියම එක අරමුණේ තියෙන්නේ. එක අංශුවේ තියෙන නිසයි ඒකයි මේ 'බුද්ධක්ෂණය' 'ක්ෂණ සම්පත්තිය' එක අරමුණේම තියෙන්නේ ඒකයි මුළු පටිච්චසමුප්පාද ධර්මයම එක අරමුණේ තියෙන්නේ. එක අංශුවේ කම්පනයක් නවත්ත ගන්න මේ දරණ කතාවක් මේ තියෙන්නෙ. මේක මහා නුවනකට අසුවෙන්නේ. මේක බුද්ධ විෂයක්**. එතකොට මුළු විශ්වයේම තියෙන සේරම අංශුව කතාව, එක අංශුවක කතාවක්. මේක පුදුම කතාවක්, ගොඩක් නෑ එකයි තියෙන්නේ 'චන්නස්' වෙනකොට එක වෙනකොට, ඔක්කොම එක වෙනවා. එක ජාතියේ.

අඹ ගහේ කොල පන්දාහක් තිබුනට එක අඹ කොලේක නාරටි වින්‍යාසය බැලුවොත් අඹ ගහේ කොල පන්දාහම දැක්ක වෙනවා. පාන් පිටි ගෝනියේ පාන්පිටි කොච්චර තිබුණත් එක පාන්පිටි අංශුවක් හරියට පරික්ෂා කරොත් මුළු පාන්පිටි ගෝනියම පරික්ෂා කරා වෙනවා. ඔබ දකින විශ්වය මෙච්චරයි කියලා කිව්වට, ඔබ එක අංශුවක් ඒ විශ්වයේ දැක්කොත් මුළු විශ්වයම දැක්කා වෙනවා. ඔබ විශ්වයේ කතා කරන්නේ ඔබගේ ඇස් දෙක නිසා. ඔබගේ ඇස් ගුලිය ගලෝපු දවසට විශ්වයක් නෑ. ඔබ ශබ්ද කතා කරන්නේ කන් බෙරය නිසා. ඔබේ කන් බෙරය හිල්වුනු දවසට ශබ්දත් නෑ. **ඔබගේ ඇස, කන, දිව, නාසය සෙන්සර්ස් ටික අයින් කරාට පස්සේ ලෝකේ තියෙන්නේ එක අංශුවයි. මේක මෙහෙම කිව්වට තේරෙන්නේ නෑ. මේක ඊට වැඩිය මායාව ප්‍රබලයි.**

අපි මේ කතාවට එමු. ඔබතුමියගේ ප්‍රශ්නයට ආවොත් ගොඩාක් ගැඹුරු විෂය මාලාවක් මේ ගලන්නේ. මේ එල්ලයින්ට්මන්ට් එක මොකක්ද? මොකක්ද බුද්ධ ස්වභාවය. මේක අපි මීට කලින් අවස්ථාවක දී කිව්වා මේ එල්ලයින්ට්මන්ට් එකේ ස්වභාවය අපි එතනදි පැහැදිලි කරා. මෙතන මේ සම්පූර්ණම ස්වභාවය අරගෙන පැහැදිලි කරා. 'අවිහය අතප්පය, සුදස්සිය සුදස්සය, අකනිට්ඨාව' කියලා. එතනින් දහදාහක් කියල පෙන්නුවා. අකනිට්ඨාව මහා කල්ප දහදාහක් අකනිට්ඨාවට එක දවසයි කියලා එතනින් එහාටත් පෙන්නුවා. ආකාසංඤ්ඤායතන අතරෙ මහා කල්ප විසිදාහයි කියලා එතනින් එහාට විඤ්ඤානන්ආයතනය පෙන්නුවා. අරූප ධ්‍යානවල මහා කල්ප හතළිස්දාහයි කියලා. එතනින් එහාට ආකිඤ්ඤායතනය පෙන්නුවා මහා කල්ප හැත්තෑදාහයි කියලා. එතනින් එහාට නෙවඤ්ඤානාසඤ්ඤා අතර පෙන්නුවා මහා කල්ප අසූදාහයි කියලා. ඒ මහා කල්ප අසූදාහෙන් එහා නේවඤ්ඤානාසඤ්ඤා විමුක්ති ස්වභාවය තමයි මහා කල්ප අසූදාහෙන් එහා තියෙන්නේ එල්ලයිමන්ට් එක.

කැමති කෙනෙකුට කැමති විදිහට විග්‍රහ කරන්න පුළුවන්. මේක කිසි කෙනෙක්ගේ විෂයක් දැකලා පොතක් දැකලා නෙවෙයි කියන්නේ. මේක නුවනින් දැකලා කියන්නේ. මේ 'ධම්ම චක්ඛුෂයට අසුවෙන වචනයක් කවදාවත් බොරු කරන්න බෑ. මේක සිතුවිල්ලක් නෙවෙයි මේක පරම

සත්‍යය. 'බුද්ධ', එල්ලයිමන්ට් එකක් නොවන්නේ කොහොමද අපි **'මජ්ජේ සූත්‍රයට' ආවහම පෙන්නුවා මේ කම්පනය, අබොප්ප චේතෝ විමුක්තිය' මේ බුද්ධ ස්වභාවය කියලා.** ඔතන තියෙනවා මෙහෙම එකක් බුදුන් වහන්සේ පෙනෙන බුද්ධ ස්වභාවය මොකක්ද? එල්ලයිමන්ට් එක මොකක්ද කියලා. මීට කලින් අපි මේක එක මට්ටමකට ඇවිල්ලා නැවැත්තුවා.

අපි කිව්වා මෙතන සුදු කොලයක් ගන්න තිතක් තියන්න දැන් මේක එහාට කරන්න, එහාට කරොත් මෙතන බලයක් උපදිනවා කියල පෙන්නුවා, ඒ බලය පෙන්නුවා. ඊට පස්සේ පෙන්නුවා මෙතන හැම තිස්සෙම කම්පනයක් තියෙන්නේ. එහෙම කම්පනයක් තියෙනවා නම් අපි දන්නවා, කම්පන තමයි ශබ්දය කියන්නේ, වර්ණය කියන්නේ, ගන්ධය කියන්නේ රස කියන්නේ හැම එකම කම්පන. **හැබැයි ශබ්ද, වර්ණ, ගන්ධ, රස නැතත් කම්පන තියෙන බව පෙන්නුවා. ඒ මොන විදිහෙන් ආවත් කම්පනයක්ම තමයි. හැම තිස්සෙම මේ අපිට දැනෙන්නේ. හැම තැනම කම්පනයක් කියලා පෙන්නුවා. ඉත්ථභාවය කියන්නෙත් කම්පනයක්**. එතකොට අපිට මොනවා හරි දෙයක් අපි හිතමු ආශාවක්, ඇල්මක්, ගැටීමක්, රාගයක්, ද්වේෂයක්, මෝහයක්, ගින්නක්, ඕනම පිච්චෙන එකක් දැනෙන දැනීමක් කම්පනයක්මයි. ඒ කියන්නේ සංඥාවක්මයි. කම්පනයමයි සංඥ්ඥාවක් කියල අනිත් පැත්තට. එතන ස්පාක් එකමයි සංඥ්ඥාව කියල, කම්පනයමයි සංඥාව කියල අන්තිමට කියනවා සංඥ්ඥාවමයි විඥ්ඥාණය කියල.

මේවා තව තියෙනවා ගැඹුරට පැහැදිලි කරන්න. මොකක්ද මේ සංඥාව කියන්නේ විඥ්ඥාණය කියනකොට, සංඥාවමයි විඥ්ඥාණය. ටිකක් ගැඹුරුයි පරාසය ගොඩක් විශාලයි. අපිට මොකක්ද කම්පනය තියෙන්නේ, අපිට කම්පනය තියෙන්නේ අපිට අරමුණක් එනකොට ඒ අරමුණට ඇලෙන ගැටෙන කම්පනයක් තියෙන්නේ. අපිට දෙයක් වගේ දැනෙන කම්පනයක්. අපිට දැන් අරමුණක් එන කොට අපි හිතමු. මේක ඇසින් එන ආරම්මණයක් කියලනේ කියන්නෙ, එතකොට කනින් එන ආරම්මණයක් ශබ්දාරම්මණයක්, වර්ණාරම්මනයක්, ගන්ධාරම්මණයක්, රසාරම්ණයක්, පොට්ඨබ්භාරම්මණයක්, මනාරම්මණයක්. එතකොට මේ

ආයතන භයෙන්ම අපිට අරමුණු එනවා. හැබැයි මොන අරමුණ ආවත් මේකේ එක්තරා මට්ටමකට මේක දියුණු වුනහම, සාමාන්‍යයෙන් ඔය ලෞකික ධ්‍යාන ගැන දන්නවානේ. විතක්ක විචාර සංසිදෙනවා. ප්‍රීති සුඛ ඒකාග්‍රතා කියල එන්නේ නිරෝධ සමාපත්තිය නොදැනෙන ස්වභාවයට එනවා. කම්පන නොවන ස්වභාවයට එනවා. ඒ අය 'සක්කාය දිට්ඨි' ප්‍රහීන කරන්නේ නැතුව ඒ දෘෂ්ටිය ඇතුලේ ඉදගෙන ඉන්නේ. ඉත්ථ සංඥාව නැති වෙලත් නෑ. එතකොට නිරෝධ සමාපත්තියට පත්වෙන කෙනෙක් ඉන්නවා. අර 'ඉත්ථ සංඥාවට' තමයි කෙනා නිරූපනය කන්නේ.

අර අසංඥතලයට ගියත් සංඥ්ඥා නොදැනෙන ස්වභාවය නිරුපනය කරනවා එයා ඉන්න බව. ඒකට හේතුව 'සක්කාය දිට්ඨිය' ප්‍රහීන නොවීම. ඒකයි අසංඥ තලයේ ජීවිත ඉන්ද්‍රිය රූපය' තියෙනවා. ඒ නිසා තමයි 'එල්ලයිමන්ට්' එකෙත් ජීවිත ඉන්ද්‍රිය රූපය තියෙන්න ඕනා. මේක හොඳට බලන්න 'එල්ලයිමන්ට්' එකේ ජීවිත ඉන්ද්‍රිය රූපය තියෙනවා 'සක්කාය දිට්ඨි' ප්‍රහීන වෙලා නෑ. මේ වේදය තුළ පෙන්වන 'එල්ලයිමන්ට්' කියන වචනය දාල තියෙන්නේ, ඇත්තටම එල්ලයිමන්ට් එකක් ඔය වචනේ තේරුම හරි ඒකේ ජීවිත ඉන්ද්‍රිය රූපය තියෙනවා. නමුත් බුදුන්වහන්සේ දේශනා කරන ස්වභාවය දිහා පොඩ්ඩක් බලන්න. අතන කම්පනය දැන් බලන්න දැන් අංශුව කම්පනය වන ස්වභාවය. හැම තිස්සෙම කම්පනය වන ස්වභාවයක් මේකේ තියෙනවා. කම්පනය වන ස්වභාවය තියෙනවා කියන්නේ, **හැම තිස්සෙම දැනෙන ස්වභාවයක් තියෙනවා. කම්පනය කියන්නේ දැනෙන ස්වභාවයක් තියෙනවා. හැබැයි දැනෙන ස්වභාවය නොදැනෙන ස්වභාවයට යනවා.**

නේවසංඥ්ඥා නා සංඥ්ඥායතන පසුවෙන කොට, ඒ නොදැනෙන ස්වභාවයට ගියාට පස්සේ ආයෙ හොයන්නවත් බෑ. අල්ලන්නවත් බෑ. මොකක් වත් බෑ. සංඥාවකුත් නෑ ආයෙ ඒ කතිකාව ඉවරයි. ඔය අසංඥ තලය කියන තැන. එහෙම නම් මේ මෙතන මේ මොකක්ද මේ තියෙන්නේ 'ඉත්ථ සංඥාව' කුඩු වෙලා නැහැ. සංඥාවයි නොදැනෙන ස්වභාවය තමයි හරි. ඒකෙත් තියෙනවා ජීවිත ඉන්ද්‍රිය ඒකෙත්, තියෙනවා ඉන්නවා කියන සංඥාව. ඒක නිසා තමයි එල්ලයිමන්ට් කෙනෙක් ඉන්නවා කියලා අපි කිව්වේ. බොරු කරලා මේ ගමන යන්න බෑ නිර්මල

වෙන්න අවංක වෙන්න සත්‍ය කතා කරන්න සත්‍යාවාදී වෙන්න. බුදුන් වහන්සේ සත්‍යවාදීයි. 'බුද්ධ ඥාණං අචින්ත්‍යයි' කියල කියන කොට මේක බොරුවක් නෙවෙයි. එකක්වත් සුරංගනා කතාත් නෙවෙයි. ඔය මෙතෙක් ඔබ නොහිතන ඔබ පිළිගත්තත් නොගත්තාට අපට අදාළ නෑ.

සියල්ල හෙලි කරන්න සූදානම් ඔය සේරම බොරු ටික ලිහිලා සත්‍ය මතුවෙලා එන්න. මෙතන මොකක්ද 'බුද්ධ ස්වභාවය' මේ අබොප්පා චේතෝ විමුක්තිය' කියන්නේ, මෙන්න මේ කම්පන ස්වභාවය ඔබට මේ අරූප ධ්‍යානයේ දැනෙන්න ලැබෙනවා. ඔබට මේ අරූප ධ්‍යානවලට යන්න කලිනුත්, මේ හතරවෙනි ධ්‍යානෙත් ඔබට මේ කම්පන ස්වභාවය ඔබට නොදැනෙන ස්වභාවයට එනවා. ඒ 'නිරෝධ සමාපත්තියේදී' ඔබට එනවා. 'සංඥා වේදනා නිරෝධ සමාපත්තිය' ඔබට මේ අසංඥ තලයේ හමුවෙනවා. මෙතන ඔබට නොදැනෙන ස්වභාවය දැනෙනවා හැබැයි ඔබ එතන ඉන්න බවට දැනෙනවා. මේක ඔබ හිතන තරම් මෙහෙම නිකන් කිව්වට, මෙහෙම කතාවක් නෙවෙයි. අපි මේක ඔබට තේරුම් ගන්න ඔබේ මට්ටමට බොහොම සරල විදිහට පැහැදිලි කරා අර කම්පන ස්වභාවය අංශු අරගෙන සුදු කොලේ තියලා පෙන්නපු කම්පනය අරගෙන, ඒක උපමාවක් විතරයි එතන කම්පනය.

**ඔබට මේ අභ්‍යන්තරයට දැනෙන දේ තමයි මේ රූපෙට අරගෙන පෙන්නන්නේ. මේ සුදු කොලේ අරගෙන 'තිතක්' කියලා එහාට මෙහාට කරලා පෙන්නන්නේ මේ කම්පනය තමයි. එහාට කරොත් අර ඉලාස්ටික් එක ඇද්දා වගේ ආතතියක් තියෙන්නේ ඕකේ තියෙන්නේ. 'තණ්හාව නැමති වඩුවා තාමා දිටිමි' 'තාට නිවසක් සැදීමට ඉඩ නොදෙමි' කියලා, මේකේ මේ ආතතිය තමයි නන්දිය කියල.** ඔය 'නන්දිය' කියන එක තියෙනකම් මේකේ ආතතියක් තියෙනකම්, මේ කම්පනය නවතින්නේ නෑ. අර 'සිරස, දෙරණ, හිරු වගේ වේවුස් සිස්ටම්' එකක්, මේකෙ වෙනස් විදිහකට 'සිස්ටම්' එක ඔපරේට් වෙනවා කියලා. මේ 'සිස්ටම්' එක 'ඔපරේට්' වෙන්නේ ඇසේ උපතයි මහණෙනි උපත කියන තැනින්. සිස්ටම් එක ඔපරේට් වෙන ආකාරය 'ඉත්ථ ස්වභාවය' සකස් වෙන ආකාරය මේවා කතා කරනවා, 'බුද්ධ ස්වභාවයට' චැල්ලයින්ට්මන් වෙමු. හැම එකම ලිහිලා යයි ටිකෙන් ටික ඔබට. ඔය ඔබට අහන්න ලැබෙයි

මෙන්න මේ කම්පන ස්වභාවය. දැන් එතකොට මෙතන **රාග ද්වේශ මෝහ කෙලෙස් සංසිදෙනවා කියන්නේ ඒකමයි, තණ්හාව ක්ෂය වෙනවා කියන්නේ 'තණ්හක්ඛයෝ නිබ්බාණෝ' කියන තැනටයි එන්නේ, එතන කම්පනය ක්ෂයවීගෙන යනවා කියන්නේ, 'ආතතිය' අර මැද තිබුණු 'ආතති බලය' අඩුවෙනවා කියන්නේ, අර අන්ත දෙකක් තිබුනට අන්ත දෙක ටික ටික නැතිවෙන්නේ. එතකොට කම්පනය තමයි නිරූපනය වෙන්නේ. කම්පනය නැත්නම් නිරූපනය නෑ.** ශබ්දයක් ආවත්, වර්ණයක් ආවත් මොකක් ආවත්, මොන අරමුණක් ආවත්, ඉත්ථි භාවයක් ආවත් තියෙනවා වගේ, අන්තිමට කම්පනය ඊර්සියාව, වෛරය, ක්‍රෝධය ඔක්කොම තියෙන්නේ එතනමයි. ඇලෙන ගැටෙන ස්වභාවය නෑ කම්පන කරන්ට් එක වගේ, කරන්ට් එක බැහැල යන ස්වභාවය. ඕක තමයි බැටරිය බහින ස්වභාවය. ඊට පස්සේ කම්පන නොවන ස්වභාවය 'අබොප්පා චේතෝ විමුක්තියට'. අන්න ඔබ කරන දෙයක් නෑ, මේකේ ඔබට සිද්ධ වෙනවා රූප දර්ශනයෙන් එහාට.

ඔබට ඒ රූප දර්ශණයෙන් එහාට, ඒ කියන්නේ මෙතන වර්ණ ශබ්ද, ගන්ධ, රස පහස මෙතන මේ එන ආරම්මණවල. ඔබ මෙතන කමටහන විදිහට ගත්තොත් මෙතන 'සෙන්සර්ස්' ටිකක් විතරයි, මෙතන කෙනෙක් නෑ, එතනින්ම ඔබ එනවා මේ කියන ස්වභාවයට 'ඕභාසයට' එනවා. ඔබට හැබැයි අභ්‍යන්තර පරිවර්තනය නැත්නම් සක්කාය දිට්ඨිය ඒ පැත්ත හොඳින් සුද්ධ වෙලා ආවොත් තමයි මේ කතාව ගැලපෙන්නේ. සක්කාය දිට්ඨිය තියාගෙන මේ දේවල් වෙන්නේ නෑ. ඒකට හේතුවක් තියෙනවා. සක්කාය දිට්ඨි තියාගෙන මෙතෙන්ට මේ නොදැනෙන ස්වභාවයට ආවට එතනත් තියෙනවා කම්පන ස්වභාවයක්. ඒක කවදාවත් නැති කරන්න හම්බ වෙන්නේ නෑ. ඒකේ **කාමාශ්‍රව, භවාශ්‍රව, දිට්ඨාශ්‍රව, අවිජ්ජාශ්‍රව කියන ඕඝනිය ධර්ම 'යෝගනීය ධර්ම' සේරම මේ තියෙන්නේ මෙන්න මේ එකම කතාවක් ඇතුලේ.**

**මේ ඔබේ කතාව කතා කරන්නේ ඔබේම දෙයක් වගේ දැනෙන ගතිය, ඔබ ඔබෙන් මිදෙන ගතිය, ඔබට අභ්‍යන්තර සිහියට කොහොමද අසු වෙන්නේ. මෙතන අර ඉන්නවා වගේ දැනෙන සංඥාව දිය වෙලා නොදැනෙන සංඥාවක් මතු වෙන්නේ.** හැබැයි ඒක වෙන්නේ නෑ. අතන

තමයි පර්යාය තියෙන්නේ. සක්කාය දිට්ඨි ප්‍රහීන කරන තැන. ආත්මය හැදෙන හැටි දැකලා. මෙතන දෙයක් නැති බව දැකලා, කම්පනය බව දැකලා, මෙතන රුප්පනය විතරයි කම්පනය විතරයි. මේ තුළ තමයි තියෙන්නේ මේ කතාවේ, ඒක හොඳින් සුවිසුද්දන් වෙන්න ඕනා. ඒක හැම තැනම ඊට පස්සේ කම්පනය නොවන ස්වභාවය තමන්ට සිහියට අසුවෙන්නත් ඕනා ඒකෙ කෘත්‍ය ඥානය තුළ. අන්න එතනින් තමයි ඔබ ගිලිහිලා එන්නෙ. අර සක්කාය දිට්ඨිය ප්‍රහීන වෙන තැනින්. ඊට පස්සේ ඔබට නැති ස්වභාවයක් තමයි ඔබට දැනෙන්න ගන්නේ. **ඔබ නැති ස්වභාවය, ඔබ අරූපයට ගිය ස්වභාවයත් දෙකක්.**

ඔබ ඉදලා අරූපයට ගිය ස්වභාවය ජටිලයෝ නිගන්ඨයෝ, බ්‍රාහ්මණයෝ එල්ලයින්මන්ට් කතාවක්. ඒ ගොල්ලෝ ඉන්න නිසා ඒ ගොල්ලෝ එල්ලයින්මන්ට් වෙනවා. දැන් මේකේ ඔබ නැති වෙනවා. මුල ඉදන්ම එල්ලයින්මන්ට් එක නැති වෙනවා. **ඇත්තම කිව්වොත් එල්ලයින්මන්ට් එකක් තියෙනවා නෙමෙයි. එල්ලයින්මන්ට් එක නැති වෙලයි යන්නේ.** අතන කුන්ඩල යෝග චක්‍ර අවධි වේවී. ඒ කතාව වෙනම කතාවක්. මේක වෙනම කතාවක්. ඔබ නැතිවෙන කතාවක් මේකේ ඔබ නැතුව එල්ලයිමන්ට් එකයන්නේ, කෙනෙක් ඔබට මේක අභ්‍යන්තර සිහියට අසුවෙනවා. මෙතන කෙනෙක් පුද්ගලයෙක් නැති ස්වභාවය ක්‍රියාවලිය විතරයි. එතන ඔබේ සම්පූර්ණම මේ කතාව තුළ මොකක්ද වෙලා තියෙන්නේ.

ඔබට මතක ඇති අපි ඊයේ කියන කොට කිව්වා එක කතාවක්. ඒක තමයි මෙතන කම්පනය වෙනවා කිව්වා. මෙතන මේ අංගුව කම්පනය වන එක මේකේ බලය නැතිවෙනවා කිව්වා. 'තණ්හක්ඛයෝ නිබ්බාණෝ' කිව්ව විදිහට ඊට පස්සේ අංගුවේ පරතරය 'ගැප්' එකක් නැති වෙනවා කිව්වා. අංගුවේ කම්පනයක් නෑ කිව්වා. ඒක මෙතෙන්ට එන කොට අංගුවේ කම්පනයක්නෑ **ගැප් එකක් තියෙනවා, ගැප් එකක් තියෙනවා කම්පනයක් තියෙනවා. ගැප් එකක් නැත්නම්, කම්පනයක් නෑ. හැබැයි ඒකේ අන්තිමට කියපු කතාව තමයි අන්තිමට අංගුව නෑ කියලා. අංගුව තමයි සක්කාය දිට්ඨිය.** ඒ සක්කාය දිට්ඨිය උපමාව විදිහට අපි ගත්තේ ඒ අංගුවත් අන්තිම මොහොතේ අන්තිමට මේකේ කියන්න දෙයක් නෑ.

නමුත් ඔබ චිල්ලයිමන්ට් වෙනවා කියපු කතාව ඇතුලේ අංශුව තියෙනවා. ඒකේ සක්කාය දිට්ඨිය ප්‍රහීනයි. නමුත් මේ කතාවේ අංශුව නෑ. අංශුව නැතුව අවසානයේ ආරෝපනය වන ස්වභාවය විතරක් අර ආරෝපනය විතරක් දැනෙන ස්වභාවය තිබිලා ඒක නැති වෙනවා. මේක උපමාවක් විදිහට අරගෙනයි පෙන්නුවේ.

මේ **බුද්ධ ස්වභාවය කියන්නේ කිසිම දෙයක් නිරූපනය නොවන ස්වභාවයක්. ඒක නිසා තමයි බුදුන් වහන්සේ උපමාවල තියෙන්නේ 'තෙලුත් ඉවරනම් තිරත් ඉවරනම් පහන නිවී ගියේ ය' ගිය තැනක් කොයින්ද කියලා එක ඒ කියන්නේ.** විශ්වය තුළ තියෙන ඩාර්ක් මැටර්ස් කියන අංශු ස්වභාවය තියෙනවා. බුදුන් වහන්සේ කියන්නේ ඩාර්ක් මැටර්ස් කියන අංශු ස්වභාවයෙනුත් එහාට ගිහිල්ලා අංශුව අතර තියෙන ගැප් එක තියෙන හිඩස ගැන, **ඒ හිඩසයි 'බුද්ධ ස්වභාවය'** අංශුවේ ස්වභාවය චිල්ලයිමන්ට් එක **අංශුවල හිඩසයි බුද්ධ ස්වභාවය.** ඒ බුදුන් වහන්සේ හෙළි කරපු කාරනාවලට ටිකක් ඉස්මතු කරනවා. ඒකයි කිව්වේ අසූහාරදහස් ධර්මස්කන්ධය එකසිය විසි හතරදාහක් වෙන කාලෙට ගිය තැන.

ගෞතම බුද්ධ සාසනයේ නැවත පිබිදීමයි. මේ මිහිපිට යම් මෙතෙක් බිහිවුණු ඒ මුණි ස්වභාවය අපි දන්නවා. ඔබට නොපෙනෙනවා ඔබට නොතේරෙනවා, අපිට දැනෙනවා. අපිට වැටහෙනවා. ඔවුන් දන්නවා නැවතත් මේ ගෞතම බුද්ධ සාසනය පිබිදීමක් නවත්වන්න බැරි බව. මෙතන එසේ මෙසේ කටයුත්තක් නෙවෙයි සිද්ධ වෙන්නේ කියල ඒ ෆ්‍රීකොන්ස් සියල්ලම ගැස්සිලා ඉවරයි. මේක අති පුදුමාකාර අවස්ථාවක්. දස දහසක් ලෝක ධාතුව කම්පා වෙනවා කියන්නේ ඔබ හිතනවාට වැඩිය මේක මහා පුදුමාකාර, ආශ්චර්යයක්. මේක බුද්ධ ස්වභාවයෙන්මයි කතා කරන්නේ. ඒක වෙන්නේ සත්‍ය හෙළි කිරීම තුළ පමණයි. මේක සඟවන්නත් බැහැ මෙතනින් එහාට කාටවත්. තේරුවන් සරණයි.

(ඉහත සාකච්ඡාව මෙතනින් අවසන්)

**උපාසක :** තේරුවන් සරණයි ආර්යයන් වහන්ස 'බුද්ධ ස්වභාවය' කියලා ආර්යයන් වහන්සේ දේශනා කළා.

**ආර්යයන් වහන්සේ :** තෙරුවන් සරණයි. ආත්ම සංඥාව දියවීගෙන යන ස්වභාවය තුළ, ඒ ස්වභාවයට කියන නමක් විතරයි අනාත්ම සංඥාව කියන්නේ. අනාත්ම සංඥාව කියලා එකක් නැහැ.

**උපාසක :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** අනාත්ම සංඥාවක් කියන එක සිද්ධවෙන එකක් නෙවෙයි. ආත්ම සංඥාව කාටවත් හම්බවෙන්නේ නෑ. මේක අපි පර්යායක් තුළ ලියන කොට මෙහෙම ලියන්න පුළුවන් පොත, නමුත් ප්‍රායෝගික පැත්තෙදී ආත්ම සංඥාව දියවීගෙන යන ස්වභාවය තුළයි අනාත්ම සංඥාව වචනයක් වෙනවා පමණයි. 'බුද්ධ ස්වභාවයි' කියල කියන්නේ දැන් මෙතන ගැප් එක නැති වෙනවා. ගැප් එක නැතිවෙලා විතරක් නෙවෙයි මේ අංශු කතාවකුත් නැතිවෙනවා. මේ අංශුව තියෙන්නේ, මේ අංශුව කියන එකම තමයි අපිට මේ සක්කාය දිට්ඨිය. ඒ අංශුව කියන එකම තමයි අපට තියෙන ආත්ම සංඥාව. ඒ ආත්ම සංඥාවම තමයි සක්කා දිට්ඨිය එක්කම ආටෝප වෙලා අංශු විදිහට තියෙන්නේ. ඒ කතාවේ නිරූපනයක් තියෙන නිසයි ඒක අංශු උපමාවට ගත්තේ. **හැබැයි ඒ නිරූපනයකුත් නැතිවෙන ස්වභාවය තමයි අර ගැප් එකක් නැති වෙන තැන. ආරෝපණ බලය තියෙනකම්ම යමක් නිරූපණය වගේ දැනුනට ආරෝපණ බලය නැතිවෙන කොටම අර නිරූපනයත් නැති වෙනවා. ඒ නිරූපනය නැතිවීම තමයි අනාත්ම සංඥාව,** වඩන එකක් නෙවෙයි සංඥාව නොදැනෙන ස්වභාවය. මේ ස්වභාවය තමයි බුදුන් වහන්සේ 'න සඤ්ඤ සඤ්ඤී - න විසඤ්ඤ සඤ්ඤී - නොපි අසඤ්ඤී - න භූත සඤ්ඤී' කියලා සංඥාවක් එතන නිරූපනය වෙන්නෙත් නෑ. සංඥාවක් නිරූපනයක් කතා කරන්නත්බෑ. නමුත් නෑ කියන්නත්බෑ කියන ස්වභාවය පෙන්නල නැවැත්තුවා.

නමුත් එල්ලයිමන්ට් එකේ දී තියෙනවා ඔතන නිරූපනයක්, ඒ ආත්ම සංඥාව. මේක මෙච්චර කියන්න හේතුව අරූප ධ්‍යානයට පත් වුණු කෙනෙකුට විතරයි මේක කියන්න පුළුවන්කම තියෙන්නේ. අරූප ධ්‍යාන තුළ අර සංඥාව නොදැනෙන ස්වභාවය මතු වෙනවා. සංඥාව නොදැනෙන ස්වභාවය මතුවුනාට, ඒ සංඥාව නොදැනෙන ස්වභාවය ආත්ම සංඥාව බවට පත් වෙනවා. ඊට පස්සේ අර ආකාසඤ්ඤායතනය

එකම ස්වභාවය බවට පත්වෙලා ආකිඤ්චඤ්ඤායතනය දැනෙන ස්වභාවයක් මතු වෙනවා. දැනෙන ස්වභාවයක් මතුවෙලා නොදැනෙන ස්වභාවයට ගිහිල්ලා, නොදැනෙන ස්වභාවයට එනවා. හැබැයි නොදැනෙන ස්වභාවයට ආවට මේ අපිට වෙච්ච අත්දැකීමතුළමයි, සක්කාය දිට්ඨි ප්‍රහීන නැත්නම් ඔතන මේ නොදැනෙන ස්වභාවයේ ඉන්නවා. ඒක සංඥාවකින් එනවා. ඒකම තමයි අනාත්ම සංඥාව කියලා ඔය දාගෙන තියෙන්නේ. ඒ නොදැනෙන ස්වභාවයට ආපහු සංඥාව වෙලා තියෙන නිසා තමයි අනාත්ම සංඥාව කියලා වචනයක් වෙලා, මෙතන තියෙන්නේ. මේ පර්යායේදී ඒක වෙන්නේ නෑ.

**සක්කාය දිට්ඨි ප්‍රහීන වෙනකොට, මුල ඉදන්ම ආත්මය නැති වෙනවා. එතන ඉදන්ම යන්නේ 'සක්කාය දිට්ඨි' ප්‍රහීන වුනු තැනේ ඉදන්ම යන්නේ, කෙනෙක් නැති ආයතන ටික දකින ගමනක්. කෙනෙක් නැති, ආයතන ටික දකින ගමනේ සිස්ටම් එක දකින්නේ. කෙනා දකින්නේ නෑ. එතකොට කෙනා දකින්නැතුව සිස්ටම් කුඩුවෙලා යනකොට අනාගාමී. නිකන් හුස්මටික ගියොත් අනාගාමී වෙනවා. ඒ ශුද්ධාවාස පෙන්නන්නේ ආයේ ඉපදීමක් කියන්නබෑ.** මොකද එතන අර රූප අපි ගත්තොත් ශබ්ද, වර්ණ, ගන්ධ, රස පහස කියලා ආයතනවල සෙන්සර්ස් විදිහට දකින කොට මුකුත් මෙතන නිරූපනයක් එන්නේ නෑ. ඒක සෙන්සර්ස් විදිහට දකින කොට සිස්ටම් එකක් විදිහටයි දකින්නේ. සිස්ටම් එකක් තුළ අර කෙනෙක් නෑ. දැන් උපදින්න කෙනෙක් ඉන්නවාද කෙනා නැතුව කවුද උපදින්නේ. උප්පත්තියක් පනවන්නබෑ. එතකොට මොකද වෙන්නේ උප්පත්තිය, මරණය දෙකම සිතුවිල්ලක් වෙලා ඒකත් ඒක ඇතුලේම ආරම්මණය ඇතුලේම එතනම ඒකත් 'සිස්ටම්' එකෙන්ම වෙලා, සිස්ටම් එකක් විතරයි දකින්නේ. කෙනෙක් නෑ. කෙනෙක් පුද්ගලයෙක් එතන ඉදලත් නෑ මැරෙන්නෙත් නෑ උපදින්නෙත් නෑ අනාගාමී ස්වභාවය. උපදින්නෙත් නෑ මැරෙන්නෙත් නෑ නිකන් කතාවක් විතරයි තියෙන්නේ. 'සුවිසුද්ධං' කිව්වේ ඒකයි. 'සුවිසුද්ධං' කියන කොට ශුද්ධාවාස කිව්වේ ඒකයි. ඒක පනවන්න බෑ. ඒකයි කල්ප විසිදාහෙන් එහා කතා කරන්නේ. ඒ කියන්නේ මනුස්ස ආත්ම කල්ප විසිදාහක් එක දවසයි කියන තරමට හරවන්න බැරි කතාවක්. නිරූපනයක් කිසි දවසක නෑ උප්පත්තියක්

කොහොමත් නෑ. ඒක මේ අපේ නිකන් සාමාන්‍ය මනුස්සයාගේ සිතේ ස්වභාවයෙන් දැකලා  අනාගාමී නෙවෙයි නිවන් දැකලම තමයි.

**උපාසක :** මායාව මායාව දුරු කරන ආකාරය අති විශිෂ්ටයි ආර්යයන් වහන්ස අත්භූතයි.

**ආර්යයන් වහන්සේ :** ධර්මය ගාම්භීරයි. අති විශිෂ්ටයි හොඳයි මේක ප්‍රායෝගික පැත්ත ලෝක සත්වයාට හෙළි කිරීම වටිනවා. මොකද මේක හෙළි කරාට පස්සේ අපේ හුස්ම ටික ගියත් කමක් නෑ. ඒකට හේතුවක් තියෙනවා. මේක නැතිවුනොත් මේ බුද්ධ ධර්මයේ මෙතනින් එහාට පරිහානියක්, විනාශක් කරා යනවා. මොකද මේක මතුවෙන්න තියෙන අවස්ථාව මේක මං කියන්න යන්නේ නෑ. දැම්ම අපි ඒක නොකියා ඉමු. මේ වෙලාවේ ආර්යයන් වහන්සේට ලොකු යුතුකමක් වගකීමක් තියෙනවා. ආර්ය භූමියේ මේ දේ කළ යුතුයි. ආර්යයන් වහන්සේ හුස්ම ගියේ නෑ. ඒවා නිකම්ම සිද්ධ වෙච්ච ඒවා නෙවෙයි.  ආර්යයන්ට හොඳ දැක්මක් තියෙනවා. ආර්යයන් වහන්සේ දන්නවා මේක ඔබ හිතනවද ලේසියෙන් මේක කියන්නේ නෑ. මේක කියන්න බෑ. මේක මේ ස්වභාදහමෙහිම නිර්යායකයේ උත්තරයක් තමයි හම්බවෙන්නේ, **මේක මේ මොහෙතේ නිරුද්ධ වෙන මේ 'මැසෙන්ජර' එක මේ ශරීර කූඩුවයි ස්වරාලය' භාවිතාවයි විතරයි.** මේ සිද්ධිය ලේසි නෑ. මේක කියනවා කියන එක.

**උපාසිකාව :** ඇත්තමයි ආර්යයන් වහන්ස පළවෙනි වතාවටයි මේ වගේ විශේෂ පැහැදිලි කිරීමක් අපට අහන්න ලැබෙන්නේ. කොහෙවත්ම මේ වගේ දෙයක් අහලා දැකලා නැහැ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** ඒක තමයි තව ඉස්සරහ තව ටිකක් මේකේ තියෙනවා. නමුත් මේ තැනට එන්න අඛණ්ඩව අවුරුදු 03ක් එක හුස්මට බණ කියන්නෙ. හේතුව මේ මනුස්සයෝ නැත්නම් අසරණයි. මේ මනුස්ස සංහතිය මේ බුද්ධ දර්ශනය මතු කර ගන්න බැරුව සෑහෙන්න අසරණ වෙලා තියෙන්නේ මේකේ. දැන් මේ යුගයේ ඊටත් වැඩිය, **මේ සුදුසු ස්වභාවය මතු වෙලා තියෙනවා මේ යුගයේ. මේ මනුස්ස ශරීර කූඩුව සකස් වෙනවා, දැන් මේවට මේ ස්වභාවය අවශ්‍යයි. මේ ස්වභාවය**

**අපේම යුතුකම මේ ඉෂ්ට වෙන්නේ. ඒ ස්වභාවය, ඒ ස්වභාවයට යුතුකම ඉෂ්ට වෙන්න තියෙන්නේ. මේක ස්වාභාවික නිර්නායකයක්. මේවා කවුරුත් කරන එකක් නෙමෙයි. සත්ව පුද්ගල කතාවක් නෙවෙයි මේක**. මේ අටුවාචාරීන්ට වැරදිලාවත් කාටවත් වැරදිලා නෙවෙයි.

2500ය වසරක් ගිය තැන නැවතත් ගෞතම බුද්ධ සාසනය පිබිදෙනවා කියන එකට මේකේ වෙනම සංනිවේදනයක් තියෙනවා, මේක සත්ව පුද්ගල දෘෂ්ටියට අසුවෙන්නේ නැහැ. ඒ සංනිවේදනය හරියටම 'ඉන්ඩිකේට්' කරහම තමයි මේ කතාව ගන්නේ මොකක්ද මේ වෙන්නේ කියලා. මේ කතාව කියන්න පුළුවන් දෙයක් කියලා. මේ මොහොතේ මේ දහම අවබෝධ වෙන කිසි කෙනෙක් වැරදියට ගන්න එපා. ඔබත් මේ බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේත් දෙන්නෙක් නෙවෙයි, දැනට ඒක විතරක් තියා ගන්න. මේ කතාවේ දෙන්නෙක් නැහැ. මේ එකම ස්වභාවයක කතාවක් මේ ස්වභාවයට මතුවෙන්න. මේක අද ඊයේ කතාවක් නෙවෙයි. මං හිතනවා අපට දැනෙන විදිහනම්, ගෞතම තථාගත සම්මා සම්බුදු පියාණන් වහන්සේ මේක දකිනවා. උන් වහන්සේ නිකන් පහළවුනා නෙමෙයි. මේ සත්ව විඤ්ඤාණවල ස්වභාවල නිකන් මතුවුණා නෙවෙයි.

මේ යුගයෙත් මේ නිකන් මතුවෙනවා නෙමෙයි. ආරෝපන ඒවා මේවා වැඩක් නෑ පුද්ගල කතා වැඩක් නෑ. මෙතනදී යුතුකම විතරක් දැක්කොත් හොඳටම ඇති. මොකද තාමත් මේ සමාජයේ පරිසරය සුදුසු නෑ. විෂ වැඩියි. ඉතින් බොහොම පරිස්සමෙන් ඕන මේ හැම දෙයක්ම දකින්න. මේ සත්‍ය මතුවීම දරාගන්නත් ටිකක් අපහසුයි, මේ සොබාදහමටම අපහසුයි. සමහර විට මේක ඇහිලා මේක දරාගන්න බැරුව ලතවෙන 'විඤ්ඤාණ ධාතු' පවා මේ මොහොතේ සකස් වෙනවා. ඒ කියන්නේ ඒ තරම් මේක 'ජේසුස් වහන්සේට' ඇණ ගැහුවා වගේ කතාවක්. මේකම ඇති අපේ හුස්ම ටික යවන්න. මේ හෙළි කිරීම අපේ හුස්ම ටික යවන්න සුදුසු කමක් වෙනවා. මේ අපට කොරෝනා හැදුන වෙලාවේ හුස්ම ටික නොයන්න තිබුන සුදුසුකම අපි දැක්කේ අපේ හුස්මටික නොයන්න හේතුව අපි දැක්කා. දැන් අපි දකිනවා මේ ටික හෙළි කරනවාත් එක්කම

අපේ හුස්මටික යන්න සුදුසුකම ලංවෙලා. ඒකට හේතුව අපිට මේ ශරීර කූඩුව අයිති නෑ මේ ශරීර කූඩුව ඔබේ, මේ මනුස්ස සත්වයා මේකට අපි සමුදීලා බොහෝ කල්. මේ ශරීර කූඩුව අයිති විඤ්ඤාණ ස්වභාවවලට මේක දරා ගන්න අමාරුයි.

අපිට දැනෙන විදිහට මේ බුද්ධෝත්පාද දේශනා කියන්නේ ඉතිහාස ගත දේශනා තව අවුරුදු 100ක් 200ක් යනකොට මේ ගැන කතා කරනවා. මේ අනාගතයේ සියලු ආගම් බිඳ වැටුනු තැන එක වචනයක් කියනවා ඉන්න පිරිසක්. ඒ 'සත්‍ය ධර්මය' කියන වචනය. ඔය වචනය අනාගත වාක්‍යයක්. ඕක තව අවුරුදු 200ක් එහාට ආගම් බිඳ වැටෙනවා. 'සත්‍ය ධර්මය' කියන නමින් කියැවෙන්නේ නැති වෙයි. ඒක සත්‍ය ධර්මය කියලා කියැවෙන්නේ ඒ 'සත්‍ය ධර්මය'ත් එක්ක නැති අය අතර යුද්ධයක් තියෙනවා. ඉස්සරහට ඒ ගෞතම බුද්ධ ශාසනය අවසානය සනිටුහන් කරනවා. දැනට ඔබ භාග්‍යවත්, ඔබ තිරිසන් සතෙක් වෙලා ඉපදුනොත්, තමයි ඔබට මේ කතාව තේරෙන්නේ. ඔබ මනුස්සයෙක් නිසා ඔබට මේක තේරෙන්නෑ. ඔබ මේ 'සසර ඕඝය' දකින් නැති නිසා ඔබට මේක තේරෙන්නේ නෑ. ඔබ ලබන ආත්මේ බල්ලෙක් වෙලා උපදින්න ඕනා. එතකොට ඔබට දැනෙයි ඔබ විඳින දුක.

මේක සත්ව පුද්ගල කතාවක් නෙවෙයි. මේක දෙරණ සිරස හිරු වගේ 'ෆ්‍රීකොන්ස් සිස්ටම්' එකක්. මේක නිව්ට්‍රල් නොවුනොත් ඔබේ කතාව, ඔබේ කතාවම තමයි බුදුන් වහන්සේ කියනවා වගේ මේ සසර ඕඝය. මේ ඔබත් මාත් මේ සත්‍ය නොදන්නා තාක් සැරි සරණවා. 'අනේක ජාති සංසාරං - සද්ධා විස්සං අනිම්බිසං -ගහකාරකං ගවේසංතෝ - දුක්ඛාජාති පුනප් පුනං' ඔබ ඔබගේ කටයුත්ත කරන්න. තව ටිකක් හොඳින් ඇස් ඇරලා බලන්න. ඔබ යන්නේ කොහාට ද? ඔබට මොකක්ද වෙන්නේ මොකක්ද ඔබේ කතාව කියලා. හැබැයි ඔබ මෙතන මනුස්ස ආත්මභාවයක ඔබ, මේ ශූන්‍ය කරන්නේ ඔබ, මේ කිසිම සත්වයෙකුට මේක කරන්න බෑ. මේ ශූන්‍ය කිරිල්ල බලන්න සතෙකුට කරන්න පුළුවන් වෙයිද කියලා කවදාවත්. මේ අභ්‍යන්තර මේ වගේ මේ ස්වභාවය ආරෝපන මතුවෙන ස්වභාවය දැකලා මේක ශූන්‍ය කරනවා වගේ එකක් 'ෆ්‍රීකොවන්ස්' එකක්.

**කොහේ හරි තැනක අහසේ විදිල්ලක් කෙටුවොත්නේ මෙහෙ ජනේල් හෙල්ලෙන්නේ. අහසේ විදුලි කෙටුවේ නැත්නම් ජනේල් හෙල්ලෙන්නේ නැහැනේ. ඔතන ඔබ ෆ්‍රීකොවන්ස් එකක් සිද්ධ වෙන නිසානේ තව තැනක හෙල්ලෙන්නේ. මේ කතාව තේරෙන්නේ නෑ එක පාරට කිව්වට, මේක ටිකක් වෙනස් කතාවක්. මේක මනුස්ස හිතකින්නේ හිතන්නත් වෙන්නේ. මේක මැරුණායින් පස්සේ කරන්න පුළුවන් දේකුත් නෙවෙයි.** මේ ජීවත් වෙලා ඉන්න කොට මේක 'සාන්දිට්ඨික අකාලික එහිපස්සික ඕපනයික පච්චුප්පන්න' ධර්මය මේ මොහොතේ දැකලා මේ මොහොතේ නියතසම්බෝධිපරායන වෙනවා කියන්නේ. මේ මොහොතෙන් පස්සේ ඔබගේ කතාව, ඔබට කොහොමත් රැකවරණය ලැබිලා ඉවරයි. ඔබගේ මේකනේ සිස්ටම් එක. යටි නූල ඇද්දහම නූල් ඔක්කොම 'මැෂිමන්ට් ලිහිලා ගියා වගේ ඔබ මේක දැක්ක මොහොතේ ඉදන් මෙතන ආත්මයක් නෑ. මේක සිස්ටම් එකක් මේ කියන වචනෙ හැම වචනයක්ම මේ මිනිස් සංහතියම කුඩු කරනවා. මෙතන ආත්මයක් නෑ කියන කොටම මිනිස් සංහතිය හෙල්ලිලා ඉවරයි. ඒ මිනිස් සංහතියට අයිති ඒ විඤ්ඤාණ ධාතු දෙදරලා ඉවරයි.

මෙතන ආත්මයක් නෑ කියන ඒ වචනෙ සාමාන්‍ය මේක හරියට තේරිලා කියන එකයි නොතේරිලා කියන එකයි, ඔය සිංදුවක් වගේ කියන එක දෙමළ කියනවා වගේ වැඩක්. දෙමළ කඩේට ගියා වගේ නේ. දෙමළ වචනයක් කිව්වට අපි දන්නේ නැහැ. නමුත් එහෙම නෙවෙයි මේක. මේ ධර්මය ඇහෙනවත් එක්කම මේ ආත්මයක් නෑ කියලා කියවෙන කොටම ඇඟකිලිපොලා වැටෙන මේ සිස්ටම් එකක් තියෙන්නේ, මෙතන ආයතන ටික සෙන්සර්ස් ටික විතරයි වැඩ කරන්නේ. මෙතන ආත්මයක් නෑ සත්වයෙක් නෑ පුද්ගලයෙක් නෑ කියල මේක යන්තම් දැනෙන කොටම, ඔබේ අභ්‍යන්තරය දෙදරලා ඉවරයි. විඤ්ඤාණ ධාතුව හෙල්ලිලා ඉවරයි. ඒවා ආයි සකස් වෙන්නේ නැහැ. ඊට පස්සේ චිත්ත ස්වභාවයකට එන්නේ නෑ. ඒකයි කිව්වේ ඊට පස්සේ ඔබව පෘතග්ජන කරන්න බෑ කියලා. ඒ කියන්නේ ඔබ ආයි නැවත අර සසර ඕගයට වැටෙන්නේ නැහැ. කොහොමත් මේ සත්‍ය අවබෝධ වුනොත් මෙතන දෙයක් නැති බව දකිනවා. කිසිම කෙනෙක් සසර දුගතියට වැටෙන්නේ

නෑ නියතසම්බෝධිපරායනයි නිවනින්ම සැනසීම ලබනවා. මේ දේශනා අපි දන්නේ නෑ කොච්චර ප්‍රමාණයක් අහනවාද කියලා. මේ දේශනා අහනවා කියන්නේ නම්, ඔබ අහන්නේ මනුස්ස තලය අභිබවා ගිය සත්‍යයක් ලෝකෙට හෙළිවෙන එකක්, මනුස්ස සත්වයාට වනදේ හෙළි කරන කතාවක්. තෙරුවන් සරණයි සියලු දෙනාටම.

# 02

# සිහිනයට පුළුවන් ද සිහිනයක් බව දැනගන්න

**උපාසිකාව :** තෙරුවන් සරණයි පාද නමස්කාර වේවා ආර්යයන් වහන්ස. සත්ව පුද්ගල ස්වභාවයෙන් මිදිලා පෘතග්ජන සියලු දෙනා වෙනුවෙන් අති මහත් උත්සාහයක් කැපවීමක් කරන මහා කාරුණික බුද්ධ ස්වභාවයට නමස්කාර වේවා. ආර්යයන් වහන්ස ධර්මය දැනෙනවා කියන තැන අපි මේ යුද්ධ කරන්නේ ආත්ම භාවයක් එක්ක කියනඑක. ආත්මය තියෙන නිසයි මේ භවගමනක් දුක සැප ඔක්කොම. මේ හැම දෙයක්ම ඔබ වහන්සේ විස්තර කරන අපට බාහිරක් කතා කරන්න අපට අවශ්‍යතාවක් නැහැ. මේ ආයතන කම්පනය නිසා අර එතන හැදෙන මැජික් එකට රැවටෙන එතන කම්පනය ගැනයි මේ ආත්ම කියන්නේ අකම්පිත බව කියන්නේ. මැජික් පෙනවා හරි පුදුමයි ඒ පෘතග්ජන ස්වභාවය කියන එක මැජික් පේන එක්කෙනාට ඒක ලොකු දෙයක් නෙවෙයි. එතන දෙයක් නෑ වටිනාකමක්නෑ ඒකේ සැබෑ දේ පේනවා. ඒක තමයි අකම්පිත බව වගේයි මට දැනුනේ ආර්යයන් වහන්ස. මෙතන අංශු කම්පනයක් වත් නෑ අංශුවකුත් නෑ කියන එක ඔබ වහන්සේ විස්තර කරා. ඒක අපට තාම හරියට පැහැදිලි නෑ. නමුත් එතනදී තේරෙනවා මේ ආයතන කම්පනය වීමෙන් ඒ වන ස්වභාවික ක්‍රියාවලිය මේ අපි කෙනෙක් හදා ගන්න එක, එතනයි අපි හිරවෙලා ඉන්නේ. ඔබ වහන්සේ දේශනා කරනවා අර කම්පනය වන ස්වභාවය අකම්පිත බව සිහියට තමයි අසුවෙන්නෙ කියන එක සිහිය කියන එක කම්පනය නොවන හින්දයි අර කම්පනය වන ඒවා දැනෙන්නේ ඒ පිළිබඳව ද විස්තර කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ආර්යයන් වහන්සේ :** ධර්මය හරි ගාම්භීරයි. හරි සුන්දරයි. හරි සරලයි. හරි ගැඹුරුයි කියල තමයි අපට දැනෙන්නෙ අපි නොගැඹුරුයිද

ධර්මය ගැඹුරුයිද. ඇත්තටම අපි මේ දෘෂ්ටි ගොඩකින් එක එක දේවල් හදාගෙන අයිසිං දාලා කේක් එකක් ලොකු අයිසිං තට්ටුවක් හදාගෙන, අපි කියනවා අන්තිමට කේක් එක දිහා බලලා මේ අයිසින් ටික දිහා බලලා කියනවා මේක රස නෑ කියලා ඇයි ඒ. ඒ වගේ දෙයක් මෙන්න මෙතන තියෙනවා. අයිසිං ටික අයින් කරහම තමයි අපට කේක් එක හම්බ වෙන්නේ. කේක් එක එච්චර ලොකු නෑ. කේක් එක ඔය පේන පේන පාට ආටෝප මොනවත් කේක් එකේ නෑ. **කේක් එක කෑවහම දිවට දැනෙන රසක් විතරයි. රසේ කොයින්ද පාට. රසේ කොයින්ද එක එක දේවල්. ඒ වගේ දෙයක් මෙන්න මෙතන තියෙනවා. මේක ඇත්තටම හරිම සරලයි. හරිම සුන්දරයි. මනුස්සයාට මේක හරිම ගැඹුරුයි. ඒකට හේතුව මනුස්සයා කියන්නේ පාට පාට අයිසිං එකක්.** මනුස්සයා කියන්නේ බොලඳ සත්වයෙක්. එහෙම තමයි අපිට කියන්න වෙන්නේ.

මේ සත්ව ලෝකයේ මනුස්සයත් ඇවිල්ලා මනුස්ස සත්වයෙක්. **'සත්ව' කියන්නේ 'ඉත්ථ' කියන ස්වභාවය 'ඉත්ථ' කියන්නේ තියෙනවා කියල දැනෙන ස්වභාවය, 'ඉත්ථභාව' 'ඉති රූපං' 'ඉත්ථත්ව' 'තථාගත' ඔක්කොම එකම දිගුවක් තමයි අපට පේන්නේ.** මේ සුන්දර දහම දේශනා කිරීම අතිසුන්දර කතාවක්. හැබැයි මේ සුන්දර දහම තුළ කෙනෙකුත් නෑ. සත්වයෙකුත් නෑ. පුද්ගලයෙකුත් නෑ. ආත්මයකුත් නෑ. සුළඟ හරි සුන්දරයි. සුළඟ සුන්දර නැද්ද? හුළඟ කොයින්ද හැඩ තළ සුළඟට කොයින්ද පාටක්, හුළඟට කිසිවක් පනවන්න බෑ. හුළඟ මඩෙත් හමනවා හුළඟ ගොඩත් හමනවා, කන්දෙත් හමනවා, තැන්නෙත් හමනවා. කාන්තාරයෙත් හුළඟ තියෙනවා. මහා සාගරයෙත් හුළඟ තියෙනවා. මෙන්න මේ වගේ තමයි මේ ධර්මය හරි සුන්දරයි. ධර්මය කියලා අපි කතා කරාට මේ ධර්මය කියන්නේ අපි මේ 'ඉත්ථභාවය' කතා කරන සත්වයා, මේ සත්වයා කොහොමද හැදෙන්නේ කියන කතාව.

මේ සත්ව කියන්නේ මේ 'ඉත්ථ' කියන්නේ අපිට මේ දැනෙන සිතුවිල්ලමයි. 'ඉතිරූපං' 'ඉති රූපං සමුදයෝ' අපි මේ සත්වයෙක් කියලා කතා කරන්නේ ඉත්ථභාවයක් කියලා කියන්නේ. ඔබ දැන් මේ කතාව හොඳට දැන් අහගෙන ඉන්නවා. ඔබත් දන්නවා ඇත්තටම මෙතන මොකක්ද වෙන්නේ කියලා. මේක ඇත්තම කතාව මේක අති

විශිෂ්ඨයි. මේක මනඃකල්පිතයක්වත් හදපු එකක්වත්, බොරුවක්වත් ගොතපු එකක් නෙවෙයි, මේ බුද්ධ වචනය කියන්නේ පරම සත්‍යය. මේ මුළු ධර්මස්කන්ධයම ඔබ හොඳින් අධ්‍යනය කළොත් මේක කොහේවත් තියෙන 'කන්සෙප්ට්' එකක්වත් තව දර්ශනවාදයක් වත් එහෙම එකක් නෙවෙයි. මේ ලෝකයේ සත්‍ය තියෙනවා. ඒ සත්‍ය නම් සත්‍යයක්. සත්‍ය කවදාවත් අසත්‍යයක් වෙන්නේ නෑ. සත්‍ය දෙකක් තියෙන්නත් බෑ. දෙකක් තිබ්බොත් එකක් අසත්‍ය වෙනවා. තව එකක් සත්‍ය වෙනවා. මේ සත්‍යය සත්‍ය කියලා දෙයක් නැති බවම පෙන්වන නමුත්, සත්‍ය කතාව මේකේ දෙයක් නෑ. මේක අවබෝධ කරන දහමක්. මේ අවබෝධය තුළයි ඔබට මේ දැකීම හැකියාව තියෙන්නේ. දැන් මෙතුමිය අහන ප්‍රශ්නය ආන්දෝලනාත්මක ප්‍රශ්නයක්. ආන්දෝලනාත්මක දේශනා මාලාව සමූහයකට ඔබ සවන් දෙනවා. මෙතෙක් වසර දෙදහස් ගාණක් කාලයේ වැලිතලාවට සැඟව ගිය ඒ පරම සත්‍ය අන්න ගොඩගනිමින් සිටිනවා. එය ඔබ අත්දකිනවා. මෙතෙන්ට ඔබව රැගෙන එන්න අපි අවුරුදු කීපයක සිට කටයුතු කරනවා. වසර 03ක මෙහෙයුම අවසානය මේ ඔබ අත්දකින්නේ.

අපි කිව්වොත් දාහකට වැඩි පිරිසක් අඛණ්ඩව වසර 2-3ක් අපි සමග පැමිණියා. ඔවුන් එන්නේ හරියට නිකන් අර පාඨමාලාවක් හදාරනවා වගේ. 'කෝස්' එකක් කරනවා වගේ. ඒ සත්‍ය ලෙසම 'සසර ඕඝයේ' නිමාව දකින කෝස් එක තමයි මේ ඔබ කරන්නේ. ඔබේ සසර ඕඝය ඔබේ නිමාව දකින්න ළඟටම ඇවිල්ලා. ඔබට නැවත උප්පත්තියක් නෑ ඒක ඔබට දැන් දැනෙනවා, මේ ඔබගේ අන්තිම ආත්ම භාවය. ඒකත් ඔබට දැන් දැනෙනවා. ඔබ මහා සසර ඕඝයක නිමාව දකිනවා. එය ඔබ අත්දකිනවා. අවසාන කඩඉමගාවට ළංවෙනවා කියලා ඔබට දැනෙනවා. දැනුමට මේ දේ ඔබට මුලින්ම හමුවෙන බව, ඒ දැනුමට ඔබට මෙය හමුවුන බව ඔබට දැන් දැනිලා ඉවරයි. ඒත් ඔබට ඒක අවසාන කර ගන්න අවශ්‍යයි. ඒ කෝස් එක සම්පූර්ණ කරන්න ඔබට අවශ්‍යයි. ඒ නිසා ඔබ වෙරදරනවා.

එක වරම කෙනෙකුට මේ අද මේ මොහොතේ දේශනා කරන දේ නැති බව අපි දන්නවා. මේ නවකයින්ට ගැටළු ඇති වෙනවා. හැබැයි

මේ දක්වා මේ ආපු මඟ එකට ආපු අය ඔවුන් අත්දකිනවා. ඔවුන් සාක්ෂි දරනවා ඒ ප්‍රත්‍යක්ෂ ධර්මයක් බව. එය ප්‍රායෝගිකව අත් දකින බව. මේ ලෝකේ ඉන්න නිවන් මග හොයන ඒ නිවන් මගට කටයුතු කරන හැමෝටම කියන්න කැමතියි අපි ගාව දාහකට වැඩිය සාක්ෂි තියෙනවා. මේක ඍජුවම කියන්න කැමතියි. ඔබ වෙනුවෙන් සාක්ෂි ඉදිරිපත් කරන්න දාහකට වැඩිය අපි සූදානම් කරලා තියෙනවා. ඒ ප්‍රායෝගිකව අත් දකින ඒ අය අතර පැටලුනු අය නැතුවා නොවෙයි. පැටලුනු අයත් ඉන්නවා. හැබැයි මේ මග එමින් නිවැරදිව හඳුනා ගනිමින්, පිරිසිදු කර ගතයුතු තැන් හඳුනා ගනිමින්, පිරිසිදු කර ගනිමින්, ඒ අවසානය කරා පැමිණෙන අය අති විශාල පිරිසක් ඉන්නවා.

අපි කිව්වා අන්ධකාරයේ සිටින ඔබට ඒ අවිද්‍යාව ඝණ අඳුරේ සිටි ඔබට උදෑසන හිම්දිරි පාන්දර අරුණාලෝකය වැටෙන්නා වගේ, මේ සත්‍යයේ හිරුකිරණ දෙරණ තලයට වැටෙනවා. ඒ මහා ප්‍රඥාලෝකය පහළ වෙනවා. සැනසුම් සුසුමින්, ඒ හඬ අසමින් මහා ශාන්ත සුසුමින් සුළඟක් දසත හමනවා. ඒ සිත් සතන්වල පුදුම සුවයක්, ඇත්තටම අර සුළඟක් හමනවා වගේ මේ දෙරණ තලය සිසාරා යනවා. දැල් වෙමින් තිබුන ගිනිදැල් නිවීගෙන යනවා. ඒ සිත් සතන් සැනසුම් සුවයක් ලබනවා. මේ අවිද්‍යා මිථ්‍යා දෘෂ්ටි කාන්තාරයක ඉපදුන ඔබට සම්මා දිට්ඨිය ගැන කවර කතාද ඒක ලෙහෙසි නෑ. ඔබ දකින්න ඇති නිගන්ඨ භාවනා දේශනා මාලාව. ඒක බුදු සමයේත් තිබුණා. අදත් තියෙනවා. ඔබ අත් දකින්න ඇති දිව්‍යලෝකවල සත්‍ය කතා දේශනා මාලාව. සිත තුළින් තිස්එක් ලෝක ධාතුවම දකින සංඛාර උප්පත්ති සූත්‍ර දේශනාව. මෙතෙක් කිසිවෙක් හෙළි නොකළ ඒ 'අලමරිය ඤාණ දර්ශණය' මේ සැබෑම භික්ෂුව කෙසේද කියන එක දේශනා මාලාව මේවා අතිගාම්භීරයි.

'ලොවම දෙදරයි' 'මට මම නැති වෙන හැටි' 'ඒ බුද්ධ ස්වභාවයට අවධි වෙනවා'' ඒ ලොව්තුරු සුවයට පත්වෙන හැටි' 'සදා අමරණීයත්වයට පත්වෙන හැටි' ඒ අනුත්තර ස්වභාවයයි. ඒ 'විමුක්ති සාරා' කියල බුදුන් වහන්සේ පෙන්වපු ආකාරය 'ඒ මාපුත්‍රයෙකි' 'ඒ ශ්‍රාවක බුද්ධ වෙමි' කියලා ඒ 'අරහත්ත සූත්‍රය' තුළ බුදුන් වහන්සේ දේශනා කරපු ආකාරය. 'අරහත්ත සූත්‍රය' බලන්න. බුද්ධෝත්පාද

දේශනා මාලාව අධ්‍යනය කරන්න. මේ පරම සත්‍යයි. මේ ගෞතම බුද්ධ සාසනයේ නැවත පිබිදීමයි. **මිනිස් සිත අභිබවා ගිය ඒ මහා දැවැන්ත ඥානය ඒ අභිඥාව ඥානයට කිසිවක් අන්න මායිම් කළ නොහැකියි. ඔබේ සිතුවිලි කොයි තරම් බොළඳ ද? ඒ සිතුවිලි ගොඩ නැගෙන්නේ කෙසේද? ඒ සිත හට ගන්නේ කෙසේද? ඒ ආත්මය කෙසේද? ඒ ආත්ම සංඥාව කෙසේද? ඒ ආත්ම දෘෂ්ටිය කෙසේද? ඒ ආත්ම සංඥාව ආත්ම දෘෂ්ටිය ගොඩ නැගෙන්නේ කෙසේද ඉන් මිදෙන්නේ කෙසේද?** ඒ ඔබටම ආශ්චර්යය අත්භූතයි කියලා කියැවෙන දේශනා.

එදා 'ධම්ම අභිඥාවක්' තියෙන්නෙ බොහොම විරලවයි. ඒ බුදු නෙතටයි හසුවෙන්නේ. ඒ ධම්ම අභිඥාලාභීන් ඇත්තටම මෙකල නම් නොවඩිනු මැන බුදුනේ කියන තරමට ඔබට මේ සත්‍ය දැනුණු දවසට ඔබ දැනෙයි. මේ සමාජය බුදු කෙනෙක් කෙසේ නම් පහළ වුවහොත් පවතින්නේ අහසේ පළඟක් බැදගෙන සිටීද? එසේ නොවේ. ඒ බුදු සමයේ තථාගත සම්මාසම්බුදු පියාණන්වත් කරල නැහැ. **උන් වහන්සේ පාද චාරිකාවේ වැඩියා, උන් වහන්සේ රුක්ෂ මූලයක් යට දානෙ වළඳන්නේ. උන් වහන්සේ අන්ධ වනයට වඩිනවා. ඉපදුනෙත් ගසක් යට, බුදු වුනෙත් ගසක් යට, පිරිනිවන් පෑවෙත් ගසක් යට. කෝ සුවිසල් මන්දිර, කෝ රතු පාවඩ, මේ බුද්ධ න්‍යාය, මේ බුද්ධ විෂය, මේ බුද්ධ ඥානය, මේ බුද්ධ ආඥාව සොභාදහමට ම විවෘතයි.** මිනිස් සිත දෙදරා ගිය දේශනා, මිනිස් සිත අභිබවා ගිය මහා මුනිවරුන්ගේ භාෂාව එදා බුදු සමයේ වසර 2500කට පෙර අපි කතා කරා මහා සෘෂිවරු, මුනිවරු, ඔබ හිතනවද නුතනයේ එවන් අය නැති බව. ඔබ මේ දේශනා හොඳින් සවන් දෙන්න. මේ දේශනා සවන් දෙන විට ඔබට ම යමක් වැටහේවි.

අපි අද කියනවා පොත්වල අභිධර්මය කියලා, ධර්මය අභිඥාවෙන් දැකීම. අභිධර්ම පොත්පත් අපට තියෙනවා. ප්‍රායෝගිකව මේ ධර්මය අභිඥාවෙන් දකින ආකාරය ඔබ දැන් සවන් දෙනවා. **මේ අභිධර්ම දේශනා මේ අභිඥා දේශනා බුදුන් වහන්සේ දේශනා කළේ මහා ප්‍රඥයින්ට. හැබැයි ඔබ හිතනවද ඒ තුළ තියෙන්නේ මනඃකල්පිතයක් කියලා, නෑ ඒ තියෙන්නේ පරම සත්‍යයක්** ඔබගෙන් අපි අහනවා යමක් ඔබ කියන්න සිරස කොහොමද ටී.වී. එකේ පේන්නේ කියලා. ඔබ කියන්න

දෙරණ කොහොමද ටී.වී. එකේ පේන්නේ කියලා. කොහොමද මේ සර්කිට් එකේ මේ තරංග අල්ලන්නේ කියලා. කොහොමද මේක සර්කිට් එකේ සකස් වෙන්නේ කියලා. මේ තරංග කොහේද තියෙන්නේ කියන්න ඔබේ ඔය දුරකථනයට ඔය හැන්ඩ්ෆෝන් එකට කොහොමද සිග්නල් එන්නේ කියන්න. කොහොමද ඔය දුරකථනයෙන් ඔබ කතා කරන්නේ කියන්න. ඔබට මෙය ඕනෙ නෑ කියල ද කියන්නේ. ඔබට සත්‍ය දැනගන්න ඕනෙ නම් ඔබ සත්‍යයට විවර වෙන්න.

ඔබට මේ ෆෝන් එකට කෝල් එක ඇවිල්ලා, මේ කතා කරන එක මෙහෙම ඇහෙන්නේ කොහොමද? ලෝකයේ එහා කෙලවරේ කතාකරන එක මෙහා කෙලවරේ ඉන්න ඔබගේ කන් දෙක ළඟ ඉන්නවා වගේ අහෙන්නෙ කොහොමද මේක සිද්ධ වෙන්නේ. ඔබට ඒක හිතා ගන්න බෑ. කෙසේද ඔබේ මරණින් පස්සේ ඔබට වෙන දේ ගැන කියන්නේ. ඔබ කොයි තරම් **අන්ධ භක්තියෙන්ද ඉන්නේ. ඔබ හිතනවද මෙතන හුස්ම ටික ගියාම සේරම ඉවරයි කියලා. එහෙනම් ඔය ඔබගේ ෆෝන් එකට කෝල් එක ආවේ කොහෙන්ද කියලා කියන්න පුළුවන් නම්. ඔබට මෙතනින් හුස්ම ටික ගියාට පස්සේ ඉවරයි කියලා කියන්න පුළුවන් නම් දෙකම එකයි. ඔබට ඒක කියන්නත් බෑ. ඔබට මේක කියන්නත් බෑ. එහෙම නැත්නම් ඔබ ඒක කියපු දවසක අපි ඔබට අභියෝග කරනවා. ඔබේ හුස්ම ටික යන කොට ඔබට වෙන දේ කියනවා. මේ දෙකම එකම කන්සෙප්ට් එක. එකම සොබාදහමක න්‍යායක බුදුන් වහන්සේ පෙන්නන න්‍යායක් ඇතුළේ ගැබ් වෙලා තියෙනවා.**

මේ සිස්ටම් එක අඳුනා ගන්න ටිකක් අමාරු වෙන්න පුළුවන්. ප්‍රෙසෙස් එක හඳුනා ගන්න ටිකක් අමාරු වෙන්න පුළුවන්. නමුත් මෙතන මහා ගැඹුරු ධර්මයක් තියෙනවා. ඒ ධර්මතාවයක් ඔබ අවබෝධ කර තියෙනවා. මේක ලේසි නෑ. ඔබ නොදන්න බොහෝදේ ඇති බව ඔබට මේ පුංචි වචන ටිකෙන් තේරෙනවා. **ඔබ ඇමරිකාවේ ඉන්න කෙනෙකු ඔබේ දුරකථනයෙන් වට්ස් ඇප් එකට කෝල් එක ගන්නවා ලංකාවේ කියලා හිතාගෙන, ඔබට මේ මොහොතේ මෙතන ඉන්නවා නෙවෙයි ඔබ කියන්නේ ඔහු ඇමරිකාවේ ඉන්නවා කියලද. නැත්තම් මෙතන ඉන්නවා කියලද මෙතන තියෙන්නේ මෙතන අංශු මෙතන සකස් වෙන එක, එතන**

**අංශු එතන සකස් වෙන එක මෙතන එතන දෙකම එක සමානයි කියන එක.** ගැඹුරු විෂයක් මෙතන තියෙනවා. අතිශයින් ගැඹුරු, අතිශයින් ගාම්භීර ඇත්තටම මිනිස් සිත අභිබවා යන මහා අභිඤ්ඤා ඥාණයක දේශනාවක් මෙතන තියෙනවා.

මේ භාෂාව මනුස්සයාගේ භාෂාව නෙවෙයි. මනුස්සයාගේ භාෂාව කියන්නේ වර්ණ, ශබ්ද, ගන්ධ, රස, පහස, උණුසුම, සීතල, තද ගතිය අයිති භාෂාව **මනුස්සයාට ශබ්ද වර්ණ වලින් සැදුනු ලෝකයක් තියෙනවා. මනුස්සයාට වර්ණ, ගන්ධ, රස, පහස, උණුසුම, සීතල, තද ගතිය තුළින් මවා ගත්ත ලෝකය තියෙනවා. 'මැටීරියල් වර්ල්ඩ් එකක ජීවත් වෙනවා. එහෙම එකක් කොහේවත් තියෙනවද? එහෙම එකක් කොහේවත් නෑ.** නිස්ටියල් එහෙම එකක් කොහේවත් තියෙන එකක් නෙවෙයි. එක 'මැටීරියල් වර්ල්ඩ්' එකක්. ඒක මිරිඟුවක්. ඔය ශබ්ද කොහේවත් තියෙනවා නොවෙයි. ඔය වර්ණ කොහේවත් තියෙනවා නෙවෙයි. ඔය ඔබට දැනෙන සෙන්සස්වලට දැනෙන ඒවා සේරම එතනම කියේෂන් එකක් ඔබයි ලෝකෙම. ලෝකයේ ඉන්න ජනගහනය කෝටි 800 නම් කෝටි 800 ම තම තමන්ම ලෝක මවා ගෙන ජීවත් වෙනවා. චිත්තේන නීයතී ලෝකෝ කිව්වේ එකයි.

ඔබේ ඇස් අන්ධ නම් ඔබට බාහිර කතාව නෑ. **ඔබේ ඇස් අන්ධ නම් ඔය වර්ණ පේන ඒවා, ඈත පේන ඒවා, පුංචියට පේන ඒවා, ලොකු වෙලා පේන ඒවා කොහෙද?** ඕවා තියෙන්නේ. ඔබේ ඇස් අන්ධ නම් අන්ධයාට කොයින්ද පාට පාට ලෝකයක්, ඔබේ කන් බිහිරි නම් ඔබට ශබ්ද කතා කොයින්ද? **ශබ්දයි වර්ණයි නැත්නම් ඔය දැනෙන දැනීම් ටික, ඒකක් නැත්නම් ඔය සෙන්සර් ටික වැහුනු දවසට ඔබ ඉවරයි. ඔබ නෑ ඔබ කියල කෙනෙක් නෑ.** ඔබ කියන කෙනා කොහොමද හැදුනේ. ඔබ හැදෙන්න ඒ ආයතනවලට මැවිනු ඒ ශබ්දෙට, වර්ණෙට ගන්ධයට රසට පහසට මැවිනු ඒ ලෝකය මැවීම තුළ ඒ මොහොතෙම දැනෙන ස්වභාවයමයි ඔබ. ඒ තියෙනවා වගේ දැනෙන ස්වභාවයමයි ආත්මය. ඒ ආත්මය තියෙනවා නම් ඔබට ඔබ ඉන්නවා. ඔබ ඉපදුනා කියන්නේ, **ඔබ ඉපදුන තැන ඉපදීමත් සමග ම ලැබෙන තෑග්ග මරණය.** ඔබට ඉපදුනේ බිත්තිය, ඔබට ඉපදුනේ මේ මොහොතේ සිත. **මේ මොහොතේ**

**සිත ඔබට ඉපදෙන කොටම දෙයක් කියලා ගන්න කොටම එය ඉපදෙනවා කියන්නෙම, දෙයක් තියෙනවා කියන්නෙම ඉපදනෙවා කියන එකයි.** එහෙනම් බිත්තිය තියෙනවා කියන්නේම බිත්තිය දෙයක් වගේ දැනෙනවා. කියන්නෙම බිත්තිය දෙයක් වගේ දැනෙන එකමයි. ඔබේ ඉපදීම ඉන්නවා වගේ දැනෙන එක එහෙනම් එහෙම එකක් කොහේවත් නෑ. බිත්තිය කියන්නේ ශබ්දයක්.

දේශනා හොඳට අධ්‍යනය කරපු අයට නම් ප්‍රශ්න මොකවත් නැහැ. අලුතින් අහන කෙනෙකුට නම් ප්‍රශ්න ඇතිවෙයි. ඒ නිසා අහන්න කෙනෙකුට නම් ප්‍රශ්න නිසා අහන්න වෙයි මේ ශබ්දයයි වර්ණයයි. මේ ශබ්දයයි වර්ණයයි කියන බිත්තිය කියන මේ ශබ්දයයි වර්ණයයි කියන බිත්තිය කියන 'සම්භූත' වෙනවා කියන්නේ, චිත්තයක් කියන එක කොහේවත් නෑ. ඒකයි කිව්වේ ශබ්ද තරංගයි වර්ණ තරංගයි එකතු වෙලා චිත්ත තරංගයක් හැදෙනවා. ඒ කියන්නේ කම්පන. මේ ඔක්කොම කම්පන ගොඩක් විතරයි. මේ සේරම වේගයක් මත මැවෙන එකක්. ඔය වේගය ගැන පැහැදිලි කරලා තියෙනවා ඔබට අහන්න පුළුවන්. වේගයට කොයින්ද මේ වර්ණය මැවෙන්නේ කියලා 'ස්පාකින් ස්පීඩ්' මේ ස්පාක් වෙන ස්පීඩ් එකට මේක මැවෙන හැටි අර අහසේ විදිල්ලක් කොටනවා වගේ. වේගයෙන් විදුලි කෙටුවොත් ආලෝකයක් තියෙනවා, තත්පරයකට කෝටි ගාණක් වේගයෙන් මේක මැවෙනවා. මේක අතිශයින්ම සුන්දර කතාව තමයි සම්පූර්ණයෙන් ම බුදුන් වහන්සේ දේශනා කරපු අසූහාර දහසක් ධර්මස්කන්ධය තුළින් මේක පැහැදිලි කෙරෙන්නේ.

**මේ 'ස්පාකින් ස්පීඩ්' එක පවා බුදුන් වහන්සේ කියනවා චිත්තක්ෂණ කෝටි ගාණක් පහළ වෙලා සිතක් සකස් වෙන ආකාරය.** මේක තුළ ඔබ හොඳට දැක්කා ආර්යයන් වහන්සේගේ මේ හැම දෙයක්ම හොඳට අධ්‍යනය කරපු ඒ ස්වභාවය. **චිත්ත විථි තුළ සම්පටිච්චන සංතීරණ ඔත්ථපන ජවන්, ජවන් ස්කන්ධය කියන්නේ මේකමයි චිත්ත වීථිමයි**. මේකමයි සම්පටිච්චන සංතීරණ කියන්නේ, වේදනා සංඥා, සංඛාර ජවන් කියන්නේ සේරම 'ස්කන්ධ' විග්‍රහයමයි කියලා. චිත්ත වීථියක් යනු රූප වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ කියලා ස්කන්ධයමයි. 'සම්පටිච්චන සංතීරණ වොත්ථාපන ජවන් ජවන් ජවන්' කියලා කියන්නේ කියලා. මේක

විග්‍රහ කරන කොට ඇඟ හිටිවැටිලා යනවා. කිසිම පොතක නැහැ. එකම ආරම්මණයයි. **ආරම්මණය යනු ස්කන්ධ විග්‍රහය 'ස්පාක්' වෙන වේගයයි එයමයි, 'චිත්ත වීථි' 'ද්වාර' ඔක්කොම එකමයි. අරමුණේ සත්‍ය දැකීම යනු ස්කන්ධයේ උදය වැය දැකීමයි. උපදානස්කන්ධයෙන් මිදෙන ශීලය යනු ආර්ය කාන්ත ශීලය යනු එකම කතාවයි. 'එකම අරමුණක' 'එකම සිතක' 'එකම අංශුවක' 'එකම ක්ෂණයක' කතාව 'ක්ෂණ සම්පත්තිය' ඒ 'බුද්ධක්ෂණය'** ඒ බුද්ධක්ෂණය අත්දකින ආකාරය මේ දේශනාවලින් ලෝකයට විවර වෙනවා. මේවා මනඃකල්පිත ඒවා නොවෙයි. මේවා සත්‍යයි. පරම සත්‍ය නම් පරම සත්‍යයි. ඔබ ඒක අත්දකියි, ඔබට ඒක දැනෙනවා ඔබ ඉන්න ලෝකය. **මේ මනුස්ස ලෝකයේ මනුස්ස සිතේ ස්වභාවය, මනුස්ස සිත අභිබවා ගිය 'මහාමුණි ස්වභාවයට' අවබෝධ වෙනවා.** ඒ කියන්නේ ශබ්ද, වර්ණ, ගන්ධ, රසත් එක්කල ඉන්න මේ විඤ්ඤාණය කියාගෙන ඕක ඇතුලේ ඉන්න බොළඳ සිතකට මේ දහම අවබෝධ කරන්න බෑ. ඉස්සෙල්ලා මිනිස් සිත අභිබවා ගිය මහා ඥානයන් අවධිකර ගන්න. ධර්මය කතා කරලා ධර්මය නැත්නම් දේශනා කරන්න. එහෙම නැත්නම් ඔබට සිද්ධ වෙන්නේ කවුරුන් හෝ මුනිවරයෙක්, කවුරුන් හෝ ශාස්තෘවරයෙක් එහෙම නැත්නම් අපේ තථාගත සම්මා සම්බුදු පියාණන් වහන්සේ දේශනා කළ ඒ ධර්මයේ ඒ ධර්මය තුළ පෙන්වන කාරණා විදර්ශනා යානිකයෙක් ලෝකෙට හෙළි කරන තෙක් බලා සිටීම. එහෙම නැත්නම් ඒ හෙළි කරන මොහොතක එය ඇහුම්කන් දීම අසා දැනගන්න. ඔබට වෙන කරන්න දෙයක් නෑ. ඔබ ඒකාන්තයෙන්ම ශ්‍රාවකයෙක්මයි.

අපි හැමෝම තථාගත සම්මා සම්බුදුපියාණන් වහන්සේ ලෝකෙට හෙළි කළ ඒ ගෞතම බුද්ධ සාසනයේ බුද්ධශ්‍රාවක, ඒ ගෞතම බුද්ධ සාසනයේ නැවත පිබිදීම සිද්ධ වෙන්නේ. මේ මොහොතේ මේ සිද්ධියත් සිද්ධ වෙනවා. ඒ බුද්ධෝත්පාද දේශනා අධ්‍යනය විශාල සත්‍යය ලෝකෙට විවරවෙනවා. නැවතත් ගෞතම බුද්ධ සාසනය නැවත පිබිදීම සනිටුහන් වෙනවා. එකම 'බුද්ධ' කියන වචනෙ තියෙන්නේ ආර්යයන් කියන්නේ කෙනෙක් පුද්ගලයෙක් නෙවෙයි. බුද්ධෝත්පාද කියන්නේ නැවත රිවෝකින් නැවතත් ඒ ගෞතම බුද්ධ සාසනය පිබිදීම සනිටුහන් කරන 'බුද්ධ' කියන වචනෙ විතරයි. ඔබට කෙනෙක් පුද්ගලයෙක් කොහෙවත් හම්බ වෙලා නෑ. ඔබට හමුවුනේ ධර්මය විතරයි. මාරයා දෙයක් ඇදලා

ගන්නකොට ආර්යයන් වහන්සේලාගේ ස්වභාවය තමයි අත් හැරලා දාන එක. එතකොට මාරයා ඇදගෙන වැටෙනවා.

කඹ අදිනවා දැකලා තියෙනවානේ. පනදාලා අදිනකොට අනිත් පැත්තේ ඉන්න අය නම් මොකක්ද කරන්න ඕනා, කඹය අත් ඇරලා දාන්න ඕනා. මාරයා ඒ පැත්තෙන් අදින කොට මේ පැත්තෙන් කරන්න තියෙන්නේ එක දෙයයි. පොඩ්ඩක් ඇදලා අතඇරලා දාන්න, මාරයා කුඩේ කුඩු. මාරයාට යන එන මං නෑ. මේ බුද්ධෝත්පාද දේශනා අහන අයට මාරයාට සෙල්ලං දාන්න බෑ. මාරයා අපිට දුන්නා අවස්ථා කීපයක් අපිත් ඇද්දා දන්නැතුව. ඒවා මාර සංඥාවලින් පෘතග්ජන සංඥා අවදිවෙලා ආත්ම දෘෂ්ටිය හදාගෙන කියවන්න ආවට කයිවාරු ගැහුවට දශමයක්වත් හොල්ලන්න බෑ. එක එක රූප රංගන දාගෙන ආවට වැඩක් වෙන්නේ නෑ. මාරයාට අපෙන් ගන්න දෙයක් නෑ. මාරයාට කරන්න පුළුවන් කෙන් ගෙඩියක් ඒක නිසා දැන් නැහැ. ඒ ආර්ය භූමිය හරි සුන්දරයි. ඒ නිසා නිර්භයවම ඒ සත්‍ය මතුවෙනවා. ඒක වහන්න කාටවත් බෑ. වහන්නේ පුද්ගලයෙක් නෙවෙයි. වහන්නේ මාර සංඥාවෙන්. ඒක සොභාදහමේ න්‍යයායක්. එය හොඳට ආර්යයන් වහන්සේ අඳුනනවා.

මීට කලින් පැහැදිලි කරා අභිඤ්ඤා දේශනාවලින්, මේ රාත්‍රී දේශනා හරහා. ඔබ හිතුවට ඔබට මෙහෙම හිතිලා ඔබ මෙහෙම කරනවා කියල ආර්යයන් වහන්සේගේ පුද්ගලික අදහසකින් හරි යමක් කරනවා නම් ඒක ඔබේ කතාවක් නෙමෙයි. ඒක ආර්යයන් වහන්සේ දකිනවා. ඒක මේ සොභාදහමේ න්‍යායේ පණිවිඩයකින් එන්නේ ඒ මාර සංඥාව, බුදුන් වහන්සේටත් ගල් පෙරලන්න හිතන්නේ ඒ න්‍යායෙන්ම තමයි. චිංචිමානවිකාවන්, සුන්දරී පරිබ්‍රාජිකාව අර මරලා හංගන්නේ 'මාගන්දිය' කසාද බඳින්න කතා කළත්, මාර සංඥා කොච්චර කළත් ඇති වෙන්නේ නෑ. ඒක සොභාදහමේ නිර්යායකයක් ආත්ම ඊගෝ එක ප්‍රබලයින්ගේ මතු කරලා දෙනවා. මේකේ අපි ගත්තොත් මේ අංශු කතාව, ඕක අංශු කතාවක් නෙවෙයි ඕක සත්‍ය කතාවක්. මේක සොභාදහමේ න්‍යායක් පෙන්නන්නේ මේ න්‍යාය පරම සත්‍යයක්. මේක 'ක්වොන්ටම්' වේවා තරංග වේවා, එහෙම නැත්නම් බුදුන් වහන්සේ දේශනා කළේ මේ 'මජ්ජේ සූත්‍රය' බැලුවොත් මේක කාගෙවත් එහෙම එකක් නෙවෙයි,

සොභාදහමේ න්‍යාය. මේක බුදුන් වහන්සේ ලෝකෙට හෙළි කරනවා ඒක නිසාමයි සම්මාසම්බුද්ධ වෙන්නේ. 'යෝ උභෝ අන්තේ විදිත්වාන කියන කතාව 'යෝ උභෝ අන්තේ විදිත්වාන - 'මජ්ජේ මන්තා නලිප්පතී' 'තං බ්‍රෑහී මහා පුරිසෝ' 'සේද සික්බනි මජ්ජගා' මේක මහා මුනිවරයෙක් විග්‍රහ කරනවා. මුළු ලෝකධාතුවම කම්පා වෙලා යනවා. මේ බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ ඒක නුවනින් දැකලා ඒ මහා අභිඥද්ඥා ඥානයට ඒක අසුවෙලා මේ මුළු සියලුම කතාව මේකේ තියෙනවා. මේක හරියට දැක්කොත් ඔබට 'සිරස' ගෙදර බලන එක එච්චර දෙයක් නෙවෙයි. මේක තමයි ඇත්තම න්‍යාය. මේ සියලු ක්‍රියේෂන් හැම එකටම හැම සිද්ධියකම මූලය මෙතනයි තියෙන්නේ. මේ කම්පනය මේක ඇත්තටම වේගයක්. වේගයක් කියන්නේ තියෙන එකක් නෙමෙයි. වේගෙට මැවෙන එකයි 'සම්භූත' වෙනවා කියන්නේ. මේක 'දිට්ඨි සංයුක්තයට' ගියහම හොඳට අහුවෙනවා. වාත සූත්‍රය 'දිට්ඨි සංයුක්තය' පටන් ගන්නේ එතනින්. සංයුක්ත නිකායේ 3 හරි 4 හරි බලන්න. වාත සූත්‍රය පටන් ගන්නේ වාතය, ආග සූත්‍ර ඕඝය එක එක විදිහට නම් තියෙනවා.

ගඟ ගලනවා, වැස්ස වහිනවා, සුළඟ හමනවා. ගඟ කියලා දෙයක් තියෙනවද, **ගලන වේගයටයි ගඟ කියන්නේ වේගයක්. මෙතනින් ගන්නේ වේගයක්. අතට ගත්තොත් වතුර ටිකක් ගඟ කියලා දෙයක් අතට ගන්න බෑ කවදාවත්. අපි ගඟ කියලා නමක් දාලා තියෙන්නේ වේගෙ කටයි, හැබැයි වේගයක් කියලා ගත්තොත් දෘෂ්ටියක්. ගඟ ගලනවා කිව්වොත් මිත්‍යා දෘෂ්ටියක්, ගඟ තියෙනවා කිව්වොත් මිථ්‍යාදෘෂ්ටියක්.** කොහොමද මිථ්‍යා දෘෂ්ටි විග්‍රහය. **බුදුන් වහන්සේගේ 'වාත සූත්‍රයට' ගිහින් බලන්න මිථ්‍යා දෘෂ්ටිය කොහොමද හඳුන්වන්නේ නැති දෙයක් තියෙනවා කියලා ගත්තොත් මිථ්‍යා දෘෂ්ටියක්. මේකමයි සුර අසුර යුද්ධෙත් තිබ්බේ.** දෙල්පචිත්‍ර අසුරේන්ද්‍රයාගේ කතාවේ පෙන්නලා තිබ්බේ සුරංගනා කතාවක් නෙමෙයි මෙතන තියෙන ධර්මය ගැඹුරුයි. **බාහිර තියෙනවා කියලා නැති දෙයක් ගත්තොත් මිථ්‍යාදෘෂ්ටියක්. ඒ නිසා ඔබ මිත්‍යා දෘෂ්ටිකයෙක්. ඔය 'වාත සූත්‍රය' තුළ තියෙනවා ඔය පුංචි කතාව විශාල කතාවක්, එක වාක්‍යයයි අසුහාර දහසක් ධර්මස් කන්දයක් තියෙන්නේ.** ඒත් ඔබ ඒක දකින්නේ නෑ. ලේසි නෑ. අපි මේ හදාගෙන ඉන්න ශබ්ද, වර්ණ ගන්ධ රස ඔහොම ඒවා නෑ. නමුත් අපි ඒක දැන්

ඒක ඇතුලේ ඉන්නවානේ ක්‍රියේට් කරගෙන. කෙනෙක් පුද්ගලයෙක් නෙමෙයි 'සිස්ටර්මැටිකලි' සිද්ධ වෙලානේ 'සිස්ටර්මැටිකලි' මේ මැටිකලිවක එනවා මේ මැජික් එක මේ මායාව එනවා, ඒක නවත්වන්න බෑ විඤ්ඤාණ සිස්ටම් එක ප්‍රොසෙස්' එක. ඒක අන්න 'චිත්ත නියාමය' සිස්ටම් එකට එන්නේ. ගහකින් බීජයකින් ගහක් පැලවෙන්නේ 'බීජ නියාම' වහින්නේ පායන්නේ ඔක්කොම 'ඍතු නියාම' මේකත් සිස්ටම් එක. නියාම 'සිස්ටර්මැටිකලි' එනවා මේක කම්පනයකින් තමයි මේ සේරම තියෙන්නෙ කොටුවෙලා. එකම සිස්ටම් එකක් ඇතුළේ තියෙන්නේ ජේන් නැති වුනාට. එහෙම දේවල් මොකක්වත්ම නෑ. දැන් මේ නැති දෙයක් තියෙනවා කියලා. මේ ඇහැට එන්නේ වර්ණ, වර්ණ හදන එක කොහේවත් තියෙන එකක් නෙමෙයි. එතකොට ශබ්ද, මෙතන ස්පාක් වෙන එක කන්බෙරය. ඒ ශබ්දෙ කොහේවත් තියෙන එකකුත් නෙමෙයි. මේ දෙක එකතු වෙලා දැන් දෙයක් තියෙනවද මේකෙ.

ශබ්දය වර්ණය තුළ දෙයක් තියෙනවද නෑ. තියෙනවා වගේ ජේනවනේ. තියෙනවා වගේ දැනෙනවනේ. දැන් මේ කතාව මොකක්ද? මේ තමයි කරන්ට් එක වගේ ඉපදිච්ච ඒකෙ යම් කිසි බලයක් හරයක් මේකෙ දැනෙනවානේ තියෙනවා වගේ. **මේ ඔබේ කතාව. ඔබ හිතන්න ඔබ කරන්ට් එකක් කියලා. ඔබ හිතන්න ඔබ නැමැති කරන්ට් එක හැදෙන හැටි. මේ ඔබ ස්පාක් වෙන වේගෙට, ඔබ ආරෝපන බලයක් වෙනවා කරන්ට් ගුලියක්. ඒකේ ශබ්දය, ගන්ධය, රස පහස විදිහට ඒක ස්පාක් ගුලියක්, කරන්ට් එක තියෙනවා වගේ දැනෙන එකතමයි කරන්ට් එක. ඒක තමයි ආත්මය වගේ දැනෙන්නේ දැන් මේ කරන්ට් එක තමයි ඔබ. ඔබ කියන්නේ ශරීරය නෙමෙයිනේ.** කරන්ට් එක නැති නිසානේ ශරීරය පුච්චලා අලු කරලා දාන්නේ. කරන්ට් එක තියෙනවා කියන්නේ ස්නායු ඔස්සේ යනවානේ, මි.වො. 5 හේ කරන්ට් එකක්. මේ කරන්ට් එකනේ අඩුවෙන්නේ වැඩි වෙන්නේ, ඕකනේ ඉතින් ඔබ කියන්නේ කරන්ට් එකක් කියලනේ.

කරන්ට් එකක් එන්නේ කොහොමද? උත්පාද වුනේ කියලා බලන්න. කොහොමද **මේ 'ෆිසිකල්බොඩි' එකේ කොහොමද මේ කරන්ට් එක ඉපදුනේ මේ ආත්මය කියල බලන්න** 'සිස්ටම්' එක ඔක්කොම එතකොට

එනවා සෙන්සස්වලින් මොකද වුනේ 'ස්පාක්' වෙන 'ස්පීඩ්' එකට මේ අහසේ විදුලි කොටනවා වගේ, විදුලි කොටන කොට ආලෝකය තියෙනවා වගේ මේ සිස්ටම් එක දුවන්නේ, ශබ්ද, වර්ණ, ගන්ධ, රස, පහස, උණුසුම, සීතල, තද ගතිය උණුසුම සීතල තද ගතිය කියන්නේ හන්කඩේ. අභිධර්මයෙත් පෙන්නුවා වර්ණ, ගන්ධ, රස, ඕජා, පඨවි, ආපෝ, තේජෝ කියන 'ශුද්ධාෂ්ඨකයෙන්' අන්න රූප කලාප 54කින් ප්‍රසාද රූපයක් හැදෙන හැටි පෙන්නුවා එක අංශුවක් ඇතුළේ සේරම දේවල් තියෙනවා. මේවා හොඳට විග්‍රහ කරා පඨවි, අපෝ, තේජෝ, වායෝ ඔය එන හැටි හන්කඩේට 'සෙන්සර්' ටික දැනෙන එක.

මේ 'ඕජා' කියල මේ 'සෙන්සස්වලට' දැනෙන එක, මේ දෙකම එකතු වෙලා මේ කොහෙවත් තියෙන එකක් නෙමෙයි එකම අංශුවේ මේ කම්පනය වන සිස්ටම් එක ඇතුළේ තියෙන එක. රූප කලාප 54න් ප්‍රසාද රූපයක් දසක දසක විදිහට අරගෙන 'කම්ම' 'චිත්ත' 'ඍතු' 'ආහාර' කියල 'චතුසමුට්ඨාන' විදිහට අරගෙන රූප කලාප දශක හැදෙන හැටි අභිඥ්ඥා දේශනාවල මුල් දේශනාව ඔය මූලික අවස්ථාව පැහැදිලි කරන්නේ ඔබ, කොහොමද ඔබට පේන්නේ, කොහොමද එක අංශුවක් ඇතුලේ කොහොමද තියෙන්නේ කියලා කම්පන වේගෙට මේක මැවෙන හැටි. ඔබට මැවෙනඑක, සංකල්පයක් ඔබට පේන්නේ මේ සංකල්පයක්ද? ඔව් ඔබට වෙන දේ මේ හැබැයි කියන්නේ, ඔබ ඇත්තෙයි කියලා හිතන දේ මේ කියන්නේ. එහෙනම් **ඔබේ පරම සත්‍යයි කියන්නේ, ඔබ හිතුවත් නැතත් ඔබට ඒක දැනේවි.** ඔබ ප්‍රත්‍යක්ෂ වුන දවසට ඔබ ඒක, අන්න ඒක එදාට ප්‍රත්‍යක්ෂතාවය තුළයි ඔබට බාර ගන්න වෙන්නේ. මේක ඔබට නුවනට අසුවෙනවා. දවසක් එනවා කලබල වෙන්න එපා. මේක 'අතක්කාවචර' දහමක්.

මේක ප්‍රායෝගික නැත්තම්, ප්‍රත්‍යක්ෂ නැත්තම් කිසි කෙනෙකුට කියන්න අවශ්‍යතාවයක් වෙන්නේ නෑ. මෙන්න මේ කම්පන වේගය, මේ වේගෙට මැවෙන එක තමයි බුදුන් වහන්සේ සෝතය සෝතය සෝතය කියන්නේ **මේ වේගය වේගය වේගය කියන්නේ එකම කතාව අනුසෝතය පටිසෝතය.** අනුසෝතය ඔක්කොම බාහිර තියෙන ඒවා ගඟ ගලන අතට ගලනවා, එන එන හැම එකම තියෙනවා. 'අනුසෝතය'

'පටිසෝතය' අනිත් පැත්ත, එතකොට 'පටිසංයුක්තයි' අන්න 'පටිසංයුත්ත' දේශනා. බුදුන් වහන්සේ ගාවට කවුරු ආවත් 'ජටිලයෝ' 'නිගන්ඨයෝ' 'බ්‍රාහ්මණයෝ' ආවත් මේ අපි වගේ තමයි. එකපාරටම ගැඹුරු දෙයක් කියන්නේ නෑ. ඒ ගොල්ලෝ දිව්‍ය ලෝකේ යන ඒවා ආ එහෙමයි එහෙමයි කියලා දෙවියොත් ඉතින් මනුස්සයින්ටනේ වදින්නේ කියලා කරකෝලා දානවා - අනිත් පැත්තට අර මේ ගොල්ලෝ ගිහිල්ලා අදහනවා දෙයියන්ව. බුදුන් වහන්සේ කරකෝලා අනිත් පැත්තට වදිනවා කියනවා. මහත්ඵල උතුමන්ට ඔබ ධර්මය අවබෝධ කර ගෙන එහෙම වුනොත් ඔබටත් වදිනවා කියනවා. ආයි එච්චරයි දෙවියන්ගේ සරණ යෑම එතනින් ඉවරයි, ඒ 'ජටිලයෝ නිගන්ඨයෝ බ්‍රාහ්මණයන්ට' දීපු ටොක්ක.

මේ බුද්ධ ධර්මය කියනඑක පුදුමාකාර ගාම්භීරයි, ඔය දාන කතා ඇහුවම පුදුම හිතෙනවා. බුදුන් වහන්සේ මේ සතාට දෙන දානය 'දුෂ්ශීලයාට දෙන දානය' 'සිල්වතාට දෙන දානය' මහත්ඵල උතුමන්ට දෙන දානය' 'බුදුන්ට දෙන දානය' ඒක කියල කියන්නේ ඔක්කොම හොඳයි හොඳයි එහෙම තමයි වෙන්න ඕනා කියලා, අන්තිමට දාන දාහක් දෙනවට වැඩිය මේ ධර්මය පොඩ්ඩක් සත්‍ය දකින්න. අන්න ඒක තමයි උසස් කිව්වේ. **දාන දහක් දෙනවට වැඩිය මේ ධර්මයේ පොඩ්ඩක් සත්‍ය දැක්කොත්, අන්න ඒක තමයි උතුම්ම දානය. ඒ ධර්මයයි උතුම්** ඔබ ධර්මයට එන්න සත්‍ය අවබෝධ කර ගන්න කියන එකයි ඉදිරිපත් කළේ. ඒකට හේතුව මිථ්‍යා දෘෂ්ටිය, දෙයක් ඇත්ත කර ගෙන තමයි ඔය දාන දෙන්නේ. දෙයක් ඇත්ත කරගෙන දෙනවා කියන්නේ, බාහිර ඇත්ත කර ගෙන විඤ්ඤාණ මායාව ඇතුලේ මිථ්‍යා දෘෂ්ටියේ ඉඳගෙන. ඔබ මිථ්‍යාදෘෂ්ටියේ විඤ්ඤාණ මායාව ඇත්ත කරගෙන කරන දෙයක්වත් ඒ දෘෂ්ටි ගතවීම ඒ හිරවීම ඔබට යහපතක් නෑ. බුදුන් වහන්සේ ඒක කොතනින්ද කඩන්නේ බුදුන් වහන්සේ ධර්මදානය කියන කොට මොකක්ද වෙන්නේ ධර්මය ගත්තොත් මොකක්ද වෙන්නේ **ධර්මය කියන්නේ දෙයක්නැති බව. දෙයක් නැතිබව දකිනතැන දේවල් තියෙනවාද, ලෝකයක් තියෙනවාද? දෙයක් තිබ්බොත් ලෝකයක් තියෙනවා දෙයක් නැත්නම් ලෝකෙකුත් නෑ. එහෙනම් ඒ දාන කතාවෙන්ම දානත් කුඩු වෙලා ගිහිල්ලා ධර්මය අවබෝධ වෙලා නිවන් දකිනවා.** එතෙන්ට මේ

ගන්න උත්සාහ කරන්නේ. එතකොට මේ ඔක්කොම වේගයක් මත කියන කොට 'වාත සූත්‍රයට' ගියහම අපට හම්බ වෙනවා 'ගංගාවෝ ගලනවා කියලා' ස්ථිරව 'ගඟ' කියලා දෙයක් තියෙනවා කියලා ගත්තොත්, එයා මිථ්‍යා දෘෂ්ටිකයෙක්. මිථ්‍යා දෘෂ්ටිය පටන් ගන්න තැනම හොඳට මේක පේනවා. වැස්ස වහිනවා තියනවා කියලා ගත්තෝ වැස්ස කියලා දෙයක්, එයා මිථ්‍යාදෘෂ්ටිකයෙක් ඒ කියන්නේ **නැති දෙයක් තියෙනවා කියලා ගත්තොත් මිථ්‍යා දෘෂ්ටිකයෙක්. අර වතුර බිංදු වැටෙන වේගයට වැස්ස කියල කිව්වට එහෙම දෙයක් කොහේවත් නෑ. හැබැයි ඒක දැක්කොත් එයා සම්මා දිට්ඨිකයෙක්** 'වැස්ස කියලා දෙයක් නෑ' 'ගඟ කියලා දෙයක් නෑ' 'හුළඟ කියන්නේ වේගෙට, 'හුළඟ' කියලා දෙයක් කියල ගත්තොත් මිථ්‍යා දෘෂ්ටිකයි.

**නැති දෙයක් තියෙනවා කියලා 'දෘෂ්ටියකින් බැලීම' 'මිථ්‍යා දෘෂ්ටිය' කියන්නේ,** ඒකේ තියෙනවා තව සැර වචනයක් ඒ වාක්‍යයේ **'ගැබිනියෝ ප්‍රසව නොකරති'. බුදුන් වහන්සේ ඒක කියන්නේ, ඒක කියන්න ලොකු හේතුවක් තියෙනවා. මෙතන එහෙම කරන එහෙම කෙනෙක් නෑ ධර්මය දැක්කොත් කෙනා නැති වුනාට පස්සේ ක්‍රියාවලියක් විතරයි. ඒකයි ගැබිනියෝ ප්‍රසව නොකරති කියලා කියන්නේ. ඒ ක්‍රියාවලියට හිමිකාරයෙක් නෑ.** ගඟ කියන ක්‍රියාවලියට හිමි කාරයෙක් නෑ. හැබැයි ගඟ කියලා දෙයක් තිබ්බොත්, වැස්ස කියලා දෙයක් තිබ්බොත්, හිමිකාරයක් ඉන්නවා, ඒ කියන්නේ හැමතැනම මම ඉන්නවා. ඒ ක්‍රියාවලියට හිමිකාරයෙක් නෑ කියලා දැක්කොත් අන්න 'සම්මා දිට්ඨිය.

මේ දිට්ඨි සංයුක්තයේ පෙන්වන මහා ඉන්ද්‍රජාලය එක වාක්‍යයි. වැඩිය නෑ. මුළු ධර්මයම තියෙනවා. ඔන්න ඔය වේගය මොකක්ද කියන එකයි ඔය මුළු ධර්මස්කන්ධයම. හැම තැනම 'උප්පාදවය ධම්මිනෝ කියන්නේ ඇතිවෙන නැතිවෙන ප්‍රවාහයක් 'උප්පජ්ජිත්වා නිරුජ්ජන්ති' එතනම ඇතිවෙලා නැති වෙනවා. 'උප්පාද පඤ්ඤායතී' 'වයෝ පඤ්ඤායතී' ' ඨිථත්ත අඤ්ඤථත්තං පඤ්ඤායතී', කියන්නේ ඨිථියක් නැහැ මහණෙනි කියන එක. එහෙනම් වේගෙට මැවෙන එක 'සංඛාර පච්චයා විඤ්ඤාණං' කිව්වේ, එහෙනම් සකස් වෙන වේගයක් තුළ මැවෙන එකක්. අන්න ස්කන්ධ විග්‍රහය තුළ රූප, වේදනා, සඤ්ඤා, සංඛාර,

විඤ්ඤාණ කියන මේ 'කන්සෙප්ට්' එක වේගයක් කියලා. මේක රුප්පන වේගෙට, ඒ කියන්නේ රුප්පනය රූපය කියන්නෙම රුප්පන වේගයක්. 'රූපේ පරජානාති', 'රූපය' නැතුව 'රූපය පරජානාති' වෙන්නෙ නෑ. 'රුප්පනය' කියන්නේ කම්පන වේගය. කම්පන වේගයට මැවෙන මැවීම, කම්පන වේගයමයි 'රූප්පන'ය. ඒක නිසාමයි දෙයක් වගේ දැනෙන්නේ. **'ශබ්ද රූප', 'වර්ණ රූප', 'ගන්ධ රූප', 'රස රූප', 'පොට්ඨබ්බ රූප' එහෙනම් මේ හැම තැනම තියෙන්නේ රුප්පන, රූප නෙවෙයි රුප්පන කියන්නේ. හැබැයි රුප්පනය නිසයි රූපය හැදෙන්නේ.**

රූපය කියන්නේ එන කම්පනයටයි, රූපය කිව්වේ කම්පන වේගෙට මැවෙන එකක්, කම්පන වේගය නිසා දැනෙන දැනීම. වේදනාව දැනුණු නිසා අන්න කම්පන වේගය. ස්පාක් වෙන වේගය අහස විදුලි කොටනවා වගේ තත්පරයට කෝටි වාරයක් අහස විදුලි කෙටුවොත් මේ සේරම අභ්‍යන්තරය අහසෙන් ඔබට ආලෝකයක් බවට පත්වෙනවා. ඒක ඔබේ 'ඇස' කියන ඉන්ද්‍රිය තුළ සිද්ධ වෙනවා. ඇස් බෝලෙ කියන්නේ පෘථිවිය කියලා හිතන්න අහස විදුලි කොටනවා වගේ ඔබේ ඇස් බෝලෙ විදුලි කොටනවා කියලා හිතන්න, ඔබට මැවෙන ආලෝකය ඒක. ඒ ස්පාක් එකක්. මෙතන තියෙන්නේ සෙන්සස්, සෙන්සස් කියන්නේ අර කණට ශබ්දෙ සෙන්සර් එකක්, දිවට රස සෙන්සස් එකක්, සෙන්සස් ඒ කියන්නේ. මෙතන තියෙනවා මේ අපි සර්කිට් එකක් හැටියට කිව්වොත් එහෙම අපි ඔය 'සිරස' 'දෙරණ' අල්ලනකොට, ඇයි සිරස අල්ලන්නේ ඇයි කොහොමද දෙරණට මාරු කරන්නේ. අර කම්පන සංඛ්‍යාතය වෙනස් කරනවා, වෙනස් කරහම අරක මාරු වෙනවා ඒ කම්පනය සිරස, මේ කම්පනය එතකොට අංශුවක් කම්පනය කරනවා කියලා දැන් මේක ගත්තහම ඒක හොඳට තේරෙනවා.

ඒ විදිහට ඔබේ දිව ගාවත් එන අංශු කම්පනය කරන එහෙට මෙහෙට කරන මොකක් හරි ගැජට් එකක් තිබ්බොත් ඔබට මොකද හිතෙන්නේ, ඒ ඔක්කොම එක පැත්තට කම්පනය ටික එක පැත්තකට වුනොත් ආ ඒක වෙනස්. ඒ වගේ මොනවා හරි ආවොත් අර වගේම තමයි 'දිව' මේ වගේම තමයි 'නාසය ගන්ධය වගේ දැනෙන එක අර නාසයට එන කම්පන ඔක්කෝම තියෙන්නේ. ගන්ධ සුවඳ ඒ මොනවා

හරි ආවොත් අන්න එතනට දැනෙනවා. ඒ වගේ තමයි ඔය ඔබේ ශබ්දෙ, ඒ කන්බේරේ හෙල්ලෙන කොට ඒ එක ආකාරයකට වෙන ආකාරයකට කම්පනය වන ස්වභාවයක් මතු වෙනවා. ඒ ස්වභාවය ඔක්කොම ශබ්දය විදිහට, ඒක කම්පනය දිගටම යන කොට ස්පාක් වෙනවා. 'ස්පාකින් ස්පීකින්' කිව්වේ ඒකයි. ස්පාක් ප්‍රසාද, 'ස්පාක් කියන්නේ ප්‍රසාද උද්දීපන උජ්ජිත්තදි'. මේක සම්පූර්ණම ඛජ්ජනීය වග්ගයෙන් ඒ ටික අර ගන්නේ බුදු සමය තුළ තිබිච්ච ඒවයි, සූත්‍රවල තියෙන ඒවයි හැම එකම එකතු කරලයි මේ විග්‍රහ කරන්නේ. **'කම්පන ස්පීඩ්' එක දකින එක ලේසි නෑ. මේක මනුස්ස ඇසකට මස් ඇහැට පේන්නේ නෑ. මේක ඇස, කන, දිව, නාසය නෙවෙයි. අපි මේ මනුස්ස ලෝකේ කතා කරන ශබ්ද වර්ණ ඇත්ත කර ගත්ත අයට මේක තේරෙන්නේ නෑ.** තේරෙනවා අපහසුයි. හැබැයි මේ ශබ්ද වර්ණ කියලා දෙයක් නෑ. මේ ඔක්කොම කම්පන විතරයි කියන ගමන්ම 'ඩෝං ගාලා' කෙලින්ම මනුස්සයාගේ සිතේ ස්වබාවය බිඳවැටෙනවා. ඒ කියන්නේ අම්මා, තාත්තා, ගෙවල්දොරවල්, ඉර, හඳ, ලංකාව, ඇමරිකාව, කළුසුදු. වර්ණ ශබ්ද ඔක්කොම ඉවරයි. දැන් මොනවද ඉතුරුවෙලා තියෙන්නේ, 'අභ්‍යාවකාශය' අන්න මහා මුනිවර අන්න බ්‍රහ්ම ලෝක කම්පන විතරයි. ඒවායේ ඕලාරික ස්වභාවය නෑ විතක්ක විචාර සංසිදිලා ඒ ස්වභාවය වෙනස්.

අර ලෝක සඤ්ඤා, ඝන සඤ්ඤා කුඩු කරනවා. එතකොට ස්වභාව වෙනස් කම්පන ස්වභාවය විතරයි. එතකොට **බාහිර තියෙනවා කියලා අරගත්ත, 'සිස්ටර්මැටිකලි' අර මෙටීරියල් වර්ල්ඩ් ඉවරයි. ඔක්කොම චිත්ත විථියට ආවා චිත්ත විථි දෙකක් නෑ කියලා, අතනින් කඩලා එතනට කියන්නේ බ්‍රහ්ම ලෝකය. දැන් ඔබ බ්‍රහ්මයෙක් විදිහට මේකේ පිහිටන්නේ. ඔබට මනුස්සයෙක් විදිහට මේක ගන්න බැරි වෙනවා කොහොමත් මේ හිතන සිස්ටම් එක වෙනස් වෙනවා.** මේ අවබෝධ කරන සිස්ටම් එක තුළ ඔබ දන්නෙම නැතුව තිස් එක් ලෝක ධාතුවෙම ඔබ හැරි සරනවා. මේ අවබෝධයට පත්වෙන කොට ඔබ දන්නැතුව තිස් එක් ලෝක ධාතුවම ඔබ කුඩු කරනවා. ඔබගේ තුළින් ම කුඩු වෙනවා. මේ දේශනාව සවන් දෙන කොට, දේශනාව මෙනෙහි කරන කොටත් ඔබගේ එක ලෝකයක් කුඩු වෙලා ඊගාව ලෝකය තුළ ඉදන් කුඩුවෙලා, ඔබ දන්නැති වුනාට මෙනෙහි කරනකොට ඔබ දන්නැති වුනාට.

මේ සිත මේ මොහොතෙම මේ සිතුවිලි ස්වභාවය, මේ එක සිතේ තිස් එක් ලෝක ධාතුවම තියෙන්නේ. මෙහෙම ලෝකයක් කියලා ඔබට දැනෙන කොටම, ඔබ පයගහලා ඉවරයි කෙළින්ම කාම භූමියට. ඒ කියන්නේ සදෙව් ලෝකේ මනුස්ස ලෝකේ සතර අපායට ඔබ ගිහිල්ලා ඉවරයි. ලෝක යුද්ධයක් මෙතන තියෙන්නේ, ඒක ලෝක යුද්ධය ඒ මාර යුද්ධය ඔබ කරනවා ඔබ දන්නේ නෑ. ආර්යයන් වහන්සේ දේශනා අධ්‍යනය කරන හැමෝම මේ මාර්ගයේ ලෝක යුද්ධයක් කරනවා. මේ අරමුණේ එන එකේ සත්‍ය දකිනවා කියන්නේ, ඔබ සත්‍ය අවබෝධ කරගෙන තුන් ලෝකෙම ජය ගන්නවා. ඔබ නොදැක හෝ ඔබ දකින්නැතුව හෝ ඔබ හිතලා හෝ නොදැනුවත්ව හෝ ඔබට තුන් ලෝකයෙන්ම මිදුනු පුදුමාකාර සුවයකට ඔබ අවසානයේ එනවා.

මේ කම්පනය කියන්නේ එසේ මෙසේ කතාවක් නෙවෙයි, මේක මැවෙනවා දකිනවා කියන්නේ. මේක මොකක්ද වෙන්නේ කියන එක, මෙතන කම්පන ස්වභාවයමයි. වර්ණ ගන්ධ ශබ්ද කියලා ඔබ දකිනවා කියන්නේ වර්ණ ශබ්ද කියන්නේ කම්පන ගත්ත කියන්නේ, ඔබ මේක සැකේට හරි අහලා හරි දන්නැතුව හරි වැරදිලා හරි වෙන විදිහෙන් හරි, ඔබට මෙය කණ වැකුණා කියන්නේ ඔබ අනුසෝතය කුඩු කරලා පටි සෝතයට එනවා. පෘතග්ජනයෙක් නම් මේ ආර්ය භූමිය තුළ මේ ටික හරියට ගලපා ගත්තට පස්සේ මේ ලෝකෙට ගැහුවට පස්සේ ආයෙ පෘතග්ජන කරන්නබෑ. මෙතන තියෙන්නේ ශබ්ද වර්ණ කියල දෙයක්නෑ, මෙන්න මේ සිස්ටම් එක දැක්කොත් මේ චිත්ත ස්වභාවයක් ඔබට හැදෙන හැටි චිත්ත ස්වභාවය සකස් වෙන ආකාරය ශබ්ද තරංග වර්ණ තරංග චිත්ත තරංග හැදෙන හැටි, මේවා සේරම එළියේ තියෙන ඒවා නෙවෙයි කියන එක.

මේ සේරම සත්‍ය ඔබට මතුවෙන්න මතුවෙන්න, එක දවසින් එන්නේ නෑ කෙනෙකුට නැවත නැවත නැවත නැවත ඒක දකිනකොට එයාට මතුවෙනවා. අපි කියන දේ නෙමෙයි ඒක නිරායාසයෙන් ම මතු වෙනවා. කියන්න තියෙන්නේ එක දෙයයි. නිරායාසයෙන් මතු වෙලා මේ සත්‍යයට එයාව අවධි වෙනවා එතන කම්පනයට මැවෙනවා. හැබැයි මේ කම්පනය තමයි ඔබ මේ දකින 'වර්ණ ශබ්ද' සේරම. මේක අර සිරස අල්ලන

විදිහමයි. සිරස ඇල්ලුවේ කම්පනයෙන්. ඒකේ තියෙන ශබ්දෙ ගත්තොත් ඒකත් එහෙමයි. ඒක බෆර් එක වෙනමයි. ඒ කම්පනය ඒ සිස්ටම් එකේ, ඒකෙන් වර්ණ සිස්ටම් එක වෙනයි. ඔබ සාමාන්‍යයෙන් ඔය ෆෝන්වල වීඩියෝ එහෙම හදනවා නම් ඒකෙන් ඔය සිස්ටම් එක වෙනයි. ඕඩියෝ සිස්ටම් එක නෙමෙයි වීඩියෝ සිස්ටම් එක. අර ඒකේ තියෙන ෂොට්ස් ගාන තත්පර ගාන වැටෙනවා ඒවා වෙනස්, මේ සිස්ටම් දෙක හොඳට පේනවා මේක හැම පැත්තෙන්ම මේ සිස්ටම් දෙකක් කියලා.

මේ විදිහට ඔබ අධ්‍යනය කරන්න එදිනෙදා කටයුතු කරන ඔබ දකින පේන ඇහෙන හැම තැනම තියෙන්නේ ධර්මය. ශබ්දෙ කියන්නේ මොකක්ද කියලා ඔබ මෙනෙහි කලොත් ඔබ දකින්නේ ධර්මය. සමහර විට ඔබ ඇවිදගෙන යනවා වෙන්න පුළුවන්. බස් එකක යනවා වෙන්න පුළුවන්. කෝච්චියක යනවා වෙන්න පුළුවන්. මොනවා හරි කනවා වෙන්න පුළුවන් උයනවා වෙන්න පුළුවන් වැඩ කරනවා වෙන්න පුළුවන් ඉගෙන ගන්නවා වෙන්න පුළුවන් ඕනම දෙයක්, ඔබ ඒ හැම එකක්ම සත්‍ය හොයනව කියන්නේ ධර්මය. ඔබ සත්‍යයට එනවා කියන්නේ ඒ ධර්මයට එනවා කියන එකයි. **ඒ ධර්මය කියලා අමුතු දෙයක් නෑ. ඔබ සත්‍ය දකිනවා කියලා හැම තැනකම ඔබ රැවටීමෙන් තමයි මිදෙන්නේ. ඒ නියමාකාරයෙන් සුවිසුද්දන් කියන තැනටම තමයි මේ අවබෝධය තුළ එන්නේ. එතකොට මේ කම්පනය නොවන ස්වභාවයට කම්පනය වන ස්වභාවය දැනෙන බව ඔබ විසින්ම අත්හදා බලන්න. ඒක තමයි මේ සිහියයි සිතුවිලියි අතර තියෙන කතාව**, අවකාශයයි වලාකුලු අතර තියෙන කතාව.

ඒ අංශුවෙන් පෙන්වනවා කම්පනය වන ස්වභාවයයි. නොවන ස්වභාවයයි අතර කතාව. මේ හැම මොහොතේම හැම සිතකම පවතිනවා සිහියක්. හැම සිතටම සිහියක් පවතිනවා, හැබැයි ඒ කම්පනයෙන් ඒක වැහිලයි තියෙන්නේ. හැබැයි එක සිහියට අසුවෙනවා, එතකොට කම්පනය පේන්න ගන්නවා. එතකොට ඔබ සිහිය බවටපත්වෙලා කම්පනය, හැබැයි සාමාන්‍ය පෘතග්ජනයා කම්පනය තමන් වෙලා සිහිය දන්නේ නෑ. පෘතග්ජනයාගේ ස්වභාවය අර අංශු කම්පනය වන ස්වභාවය තමන් වෙලා ඉන්නවා. හැබැයි ආර්ය භූමියේ ස්වභාවය

කෙළින්ම කම්පන ස්වභාවය අනිත් පැත්තට ඇවිල්ලා අර කම්පන නොවන ස්වභාවය දෙපැත්තට මාරු වෙච්ච ගමන් අන්න 'අනුසෝතය' 'පටිසෝතය' යනවා එතන සිහියට අහුවෙනවා මේක දැනෙන ස්වභාවය. මේක පර්යංකයේ කරන එකක් නෙවෙයි පටලෝ ගන්න යනවා. ඒක පරිස්සම් වෙන්න කියන්න ඕනා. මේක සත්‍ය දකිනකොට මතුවෙනවා සිහිය, සත්‍ය විසින්ම දැනෙන්න ගන්නවා ඒකයි කම්පන ස්වභාවය.

මොකද 'ඔබ හැම තිස්සෙම දකින්නේ මායාවක් මායාවක් කියන්නේ කම්පන වන ස්වභාවයක්. කම්පනය කම්පනයෙන් මිදුන ස්වභාවයක්, ඒ කියන්නේ ඔබට දැනෙන ඇහෙන හැම තැනකම ඒකෙන් මිදුන ස්වභාව සිහියට තමයි හසුවෙන්නේ. ඒක අර 'දර්ශන ඥානය' තුළින් දෙයක් කියලා දකින කොට තමයි 'ඥායස්ස අධිගමාය' ඤානයට අසුවෙන්නේ. ඒක සමාධිමත් ස්වභාවය, අන්න එනවා 'අනිමිත්ත සමාධිය' පැත්තට නිමිත්ත කියන්නේ හැම තිස්සෙම කම්පනයක්. දරුවා කියන්නේ නිමිත්තක් පුටුව කියන්නේ නිමිත්තක්, ගහ කියන්නේ නිමිත්තක් නිමිති කියන්නේ කම්පන වලින් අපි හදා ගත්තු නිමිති ගත ලෝකය. එහෙනම් මැටීරියල්වල්ඩ් අනිමිත්ත සමාධිය කියන්නේ එහෙනම් කම්පනයෙන් මැවෙන එක. කම්පනය වන ස්වභාවය එකම නිමිත්තක සිහිය පිහිටුවා ගන්න එකයි සමථය කියන්නේ. එහෙනම් එකම කම්පනයක තියාගෙන ඉන්න උත්සාහ කරනවා. අර කම්පනයේ තරංග එකම දෙය තියාගන්න හදනවා. ඒකට කියනවා සමථය වඩනවා කියලා.

මේක අවබෝධය තුළ සිද්ද වෙන එක වෙනයි, එකම කම්පනයේ තියාගෙන ඉන්න එක වෙනයි. එහෙනම් කම්පනය නොවන ස්වභාවය අවබෝධය තුළින් අවිද්‍යාවට ගහන තරමට මේක සිද්ධ වෙන්නේ. අවිද්‍යාව කියන්නේ සත්‍ය මතුවෙන් නැති තැන, අවිද්‍යාව කියන්නේ දෙයක් කියල ගත්ත එකමයි. හැම තැනම දෙයක් වෙලා, පුටුව දෙයක් වෙලා මේසේ දෙයක් වෙලා අම්ම දෙයක් වෙලා තාත්තා දෙයක් වෙලා සිතිවිලි දෙයක් වෙලා සිතුවිලිත් දේවල් හිතින් දුක් විදිනවා. **දුක තියෙන්නේ කොහේද? කම්පනයේ. කම්පනය කියන්නේ දෙයක් තියෙනවා කියල ගත්ත එක. මේක ඇහෙන කොට ඔබ කොතනක හිටගෙන හිටියත් එතන ඔබ වාඩි වෙලා ගල් ගැහිලා වගේ ඉන්නවා. ඒකට හේතුව ඒ මහා මුනි**

**ස්වභාවයකට වැටෙනවා මේ දේශනා අහන බොහෝ අය අභ්‍යන්තර පරිවර්තනයකට.**

**මේක හුදෙක් දේශනයක් නෙමෙයි මේක කම්පනයක්, කම්පනය නොවන ස්වභාවය පෙන්නන එක දේශනයක් නෙවෙයි. ඔබ ඔබව මරා දාන තැනටයි යන්න හදන්නේ, එහෙම කිව්වොත් ඔබට බය හිතෙයි මොකද ඔබට ඔබ ඉන්න නිසා. ඒත් කම්පනය කියන්නේ ඔබමයි. ඔබ ජීවත් වෙනවා කියන්නේ කම්පනයමයි. එහෙනම් ඔබව මරා ගන්නවා කියන්නේ කම්පනය නැති කරන එකමයි.** ඔබට ඔබව මරන්න පුළුවන් කිසිම ආයුධයක් නැතුව කිසිම ටැබ්ලට් එකක් වත් බේතක් වත් මොකක් වත් නැතුව. හැබැයි ඔබ ජීවත් වෙනවා. ඔබට පන තියෙනවා. හැබැයි ඔබ වෙනදා විදිහටම කනවා බොනවා. වෙනදා විදිහටම හොඳට සතුටින් හිනා වෙලා ඉන්නවා, හැබැයි ඔබ මැරිලා. මේ ක්‍රමය තමයි බුදුන් වහන්සේ කියන්නේ සදාතනික සුවයක්, අලමරිය ඥාණ දර්ශනය කිව්වේ ඔතනයි තියෙන්නේ.

වෙනද විදිහටම තියෙනවා, වෙනද විදිහටම පේනවා, වෙනද විදිහටම ඇහෙනවා ඒ කියන්නේ වෙනද විදිහටම සේරම පේනවා, තියෙනවා වුනාට, බැලු බැල්මට ම අර කම්පනය වෙනවා වගේ අර සේරම ඔක්කොම ටික පේනවා වගේ. ඔක්කොම ටික පේනවා වගේ ඔක්කොම ටික, වුනාට ඒකෙ කිසිම බලයක් නෑ. අර මේකේ තියෙනවා යම් කිසි බලයක්. මේ කම්පනය වෙන්නෙ මේ පවර් එකට. මේකේ පවර් එක මේ කම්පනය නිකම්ම එක පාරටම අපි හිතමු දැන් අංශු කම්පනයක් ආවා. දැන් ශබ්ද විදිහට වර්ණ විදිහට ගන්ධ විදිහට මේ කියනවා එතකොට මේ ඔක්කොම කම්පනය කියලත් කියනවා. එතකොට මේ කම්පනය වෙනවා. දැන් මේක පටන් ගත්ත විදිහ බැලුවොත් අන්න ස්කන්ධානානං පාඨිභාවෝ - ආයතනානං පටිලාභෝ - අයං වුච්චති ජාති කියනකොට ජාති ජම්ම සූත්‍රයට එනවා මේ ස්කන්ධ විග්‍රහය මේ සේරම තියෙන්නේ. ස්කන්ධයේ මේ උදයවැය දැකීමමයි වෙන කිසිම දෙයක් නෑ. ස්කන්ධය කියන්නේ කම්පනය, ඕකමයි තියෙන්නේ නිවන් දකින්න.

ඔය ස්කන්ධය කිව්වේ කම්පන වේගෙට ඔය කම්පන වේගය. ඔතන ස්කන්ධ වේගය උදය වැය දකිනවා කියන්නේ, කම්පන වේගය දකිනවා

කියන එක. නිවන් දකින්න නම් මොකක්ද කරන්න ඕනා, මේක ප්‍රායෝගික පැත්තෙදි ඔබට දකින්න තියෙන්නේ ඔබට එන අරමුණු, ඔබට එන අරමුණෝ ඔබ කම්පනය වෙනවද නැද්ද කියන එකයි. ඒක ඔබට හිතලා කම්පනය නොවී ඉන්න බෑ. ඔබට අනිවාර්යයෙන්ම සිද්ධ වෙන දේ සිද්ධ වෙනවා. ඔබගේ අවබෝධය තුළ අන්න කම්පනය ඔබට දැනෙනවා. එය අවබෝධය නැත්නම් ඒ කියන්නේ 'යථා භූතං පජානාති' එක ඔබ ළඟ නැතිනම් ඔබ මේ සත්‍ය දේශනා අසන්නේ නැත්නම් ඔබේ ඒ සත්‍ය ධර්මය අසන්නේ නැත්නම් ඒ කම්පනය ඔබට නවත්වා ගන්න බෑ. ඒක වෙන්නේ නෑ.

ඒකට හේතුව ඔබ මේ අවිද්‍යාව, මෝහය මුලාව අර මේ සිස්ටම් එකෙන්ම ක්‍රියේට් වෙන එක දකින්නේ නැතිකම බැරිකම තුළයි තියෙන්නේ. දකින්න නොහැකියාව තුළ ඔබ ඒකට අසුවෙනවා. ඒක නවත්වන්න බෑ ඒකමයි ආරෝපනය. ඒ ආරෝපනය තුළ ඔබට දෙනවා සංඥාවක්, ඒ ආරෝපනයෙන්ම හැදිලා, ඒ තමයි එතන එන බලය පවර් එක අර ආරෝපන බලය. කම්පනයට ඕන කරන ශක්තිය බලය එනජි එක, ඒක තමයි විඥාණ ශක්තිය කියලා ඒ විදිහට කතා කරන්නේ. ඒ පවර් එක කොහෙන්ද ආවේ, මෙතන අම්මා, තාත්තා, අයියා, අක්කා මේ කම්පන පවර් එක හැබැයි ඒක විසින්ම බලගැන්විලා ඒක රකින සිස්ටම් එකක් හැදෙනවා ඉන්ෂුවරන්ස් එකක් දීලා, ඒක මොකක්ද? ඒ තමයි මමයා ඉන්නවා. මේ සේරම තියෙනවා තියෙනවා තියෙනවා කියල දැනෙන ඒක තුළ එනවා ආත්ම දෘෂ්ටිය සක්කාය දෘෂ්ටිය, එකට මේක හොඳට දැන් 'සීල්' කරලා තියෙන්නේ මේ සිස්ටම් එක ඔටෝමැටිකලි දුවනවා නවත්වන්න බෑ.

මේක බලගන්වලා තියෙන්නේ සක්කාය දෘෂ්ටියෙන්, හරියට නිකන් වාහනයක එන්ජින් එක ස්ටාට් කරන කොට පොඩි ෂොට් එකක් දීලා එහෙම තමයි තල්ලු කරලා වාහනය ස්ටාට් කරනවා වගේ වැඩක් තමයි මේක, මුලින්ම අර පුංචි දරුවගේ සිද්ද වෙන්නේ. ඊට පස්සේ බල ගැන්වෙනවා. බල ගැන්වෙලා හොඳට පණ ගැන්වෙලා තියෙන්නේ. පණ ගැන්වුනාට පස්සේ බඹරේ කැරකුනාට පස්සේ, ආයෙ බඹරේ විසින් බලය අරගත්තා වගේ වැඩක් ඒකේ තියෙන්නේ තනිකරම ඔබ ඉවරයි. ඊට පස්සේ ඔබට

කුඩු කරන්න වෙන්නේ මොකක්ද ඉස්සෙල්ලාම සක්ඛාය දිට්ඨිය මේක පවර් එක ආපු හැටි දැකලා පවර් එක එන විදිහ දැකලා, මේක හැදෙන හැටි දැකලා මේක දැන් හැදිලා එහෙම නම් මේක මොකක් උඩද දැන් තියෙන්නේ. දැන් මේ බඹරේ කැරකෙන්නේ එක සිස්ටම් එකකට මේකේ වේගය අසුවෙන්න වේගය විසින් බලගන්වනවා. වේගය තමයි සක්ඛාය දිට්ඨිය ඒක විසින් ගත්ත බලය පවර් එක.

සක්ඛාය දිට්ඨිය එතනට ගහන්න නම්, මේ සම්පූර්ණම සිස්ටම් එක කුඩු කරන්න පුළුවන් එකම එක ආයුධයයි මොකක්ද ඒ ආයුධය, අර 'භාවානි බ්‍රහ්මයාට' කියපු ආයුධය 'අවිද්‍යා අශේෂ විරාග නිරෝධෝ' ගහන්න කිව්වා ඉස්මුදුන දෙකට පැලෙන්න. අර අවිද්‍යාවට ගැහුවොත් අන්න බොජ්ජංග කියන, බොජ්ජංග වැඩෙනවා කියන්නේ ඒකමයි. සිස්ටම් එක හත්කඩකට පැලිලා සුනුවිසුණු වෙලා ගිහිල්ලා නිවනට පත් වෙනවා. **ගහන්න තියෙන්නේ එකම එකයි. සත්‍ය හොයන්න කියන එකයි, සත්‍ය හොයන්න කියන්නෙ අවිද්‍යාවට ගහනවා කියන එක. අවිද්‍යාවට ගහන තරමටයි ඔබ 'යථා භූතං පජානාතී' කියල ඒ පර්ජානාති කියල. යථා භූත ඥානය ඔබට එන්නේ කොයි තරමටද ඒ තරමට ඔබ මේ බන්ධන බලේ කුඩු කරනවා. ඔබේ ඒ තණ්හාව, ආශාව, ඊර්ෂ්‍යාව - වෛරය -ක්‍රෝධය හැම එකම, ආටිපිෂල් කන්සෙප්ට් එක සම්පූර්ණයෙන්ම කුඩු වෙන්නේ ඔතනින්.** ඒක ටික ටික දියවෙනවා 'ක්‍ෂය ධම්මා වය ධම්මා' කියල, වීතරාගී වීතදෝසී වීතමෝහී කියන ස්වභාවයට ඔබ පත්වෙන්නේ මෙන්න මේ මෙතන හරියට දැකලා මේකට ගහපු දවසට.

රාග ද්වේෂ මෝහ කන්සෙප්ට් එකෙ තියෙන්නේ මොකක් ද? ඇලෙන ගැටෙන රාග ද්වේෂ කියන්නේ මොනවද මේ. ඉලෙක්ට්‍රෝන ප්‍රොටෝන වගේ නෙගටිව් පොසිටිව් වගේ කරන්ට් එක තියෙන මේවා විදිහට තමයි මේ සිස්ටම් එක දුවන්නේ ඒ කරන්ට් එකෙන් තමයි මේක දුවන්නේ මැෂින් එක දුවනවා මොකක්ද ඒ මැෂින් එක, ආත්ම මැෂින් එක 'මයිෂෝල්ඩ්' 'මයිඊගෝ'. ඒකට හොඳ අවබෝධයක් නැතුව මේක කරන්න බෑ කල්‍යාණ මිත්‍රයාගේ පණිවිඩය කිව්වේ ඒකයි, බුදුන් වහන්සේ කිව්වේ ආනන්දය එසේ කියන්න එපා කල්‍යාන මිත්‍රයා මතයි සාසනය පවතින්නේ කියලා. සාසනය කියන්නේ කොහේවත් තියෙන එකක් නෙවෙයි, 'සිස්ටම්'

එක කුඩුවෙච්ච තැන ඒ බුද්ධ ස්වභාවය. ඒ බුද්ධ ස්වභාවය, කියන්නේ කම්පනයත් කුඩුවෙලා අංශු කුඩුවෙලා ගිහිල්ල, මුකුත් ඉතුරු වෙන්නැති ස්වභාවයයි බුද්ධ ස්වභාවය. ඒ මුකුත් ඉතුරු වෙන්නැති ස්වභාවය, අන්න එතනයි සාසනය තියෙන්නේ. එයයි බුද්ධ සාසනය. ඒ සාසනයට එහා මොකක් වත්, මේ සාසනය තුළ ඔබට හම්බ වෙන්නේ නෑ. බුද්ධ ස්වභාවය, අන්න බුද්ධ සාසනය සිතකයි සකස් වෙන්නේ. මේ වෙනුවෙන් තමයි දේශනා දෙදහස් ගාණක් තියෙන්නේ දිව්‍යලෝක කතාද ඕන එකක් අහන්න. කම්පනය නොවන ස්වභාවයට කම්පනය වන ස්වභාවය මේ ආශ්චර්යමත් දේශනාවක්. කිසිම විදිහකට මේක මනුස්ස සිතකට ජනිත නොවන ස්වභාවයක් මේ දේශනය තුළ තියෙනවා. මේක මනුස්ස සිතකට ගෝචර නෑ මේ දේශනය හෙළි කිරීම. මේ අවබෝධය ඇති වීම සියල්ලම තියෙන්නේ අරූප ධ්‍යානවල 'මහා මුනි' ස්වභාවයක. ඒ 'ඍෂි ස්වභාවයක්' සුළං රැළි හතර වටින් හමන කොට නොසැලී සිටින පිළිමයක් වගේ දෙයක් අදිනවා, ඒක තමයි ආර්යයන් වහන්සේගේ නොදකින කතාව. ඒ 'මහා මුනි ස්වභාවය' ඒ 'මහා ඍෂි ස්වභාවය' ඒ සත්‍ය ගවේෂණයට උපකාර වෙනවා.

ඒ පර්වතයක් මුදුනේ ඒ මහා පුදුමාකාර සුළං රැළි හමන ඒ මහා ඝෝර ශබ්දයක් මැද්දේ ඝෝර නාදයක් මැද්දේ, දෑස් පියාගෙන සිටින ඒ මහා මුණිවරයෙක් ආර්යයන් වහන්සේගේ අභ්‍යන්තරය පොඩි කාලේ ඉදල රැව් දෙනවා ඒ භාෂාව හොයා ගන්න බැරුව ආර්යයන් වහන්සේ කැලෑ ගානේ පීරුවා. ආර්යයන් වහන්සේ එදා දැක්කා හැම අර ආරණ්‍යයේ භික්ෂූන් වහන්සේ නමක් කැලේ යන කොට වාඩි වෙලා ඉන්නවා ආර්යයන් වහන්සේට අර සිහිනේ මතක් වුණා. මේක නේද එදා පැය ගානක් ඒ දිහා බලන් හිටිය එතන. පුංචි කාලේ ඉදලා අම්මල තාත්තල නිදිය ගත්තහම අර පංචාශ්‍රය වගේ තියෙන, තට්ටුව උඩ ටීපෝ එකේ කරුවලේ ඇවිල්ලා වාඩි වෙලා අර බෝ කොලේ වගේ තියෙන බිත්තියෙ දොරට උඩින් ගහල තිබ්බ අර රවුම දිහා බලාගෙන අත්දෙක තියාගෙන පොඩි කාලේ ඉදලා ඉඳන් වාඩි වෙලා ඉන්න මොකක්ද තිබ්බිච්ච හේතුව. කළුවරට ආදරේ කළේ ඇයි. කළුවරට වෙලා ඉන්නේ. ඇයි කළුවරට කැමති. මිනිස්සු හොයන පාට පාට ලෝකෙට යන්නේ නැත්තේ මිනිස්සු හොයන පාට පාට ලෝකය රස විඳින්න බැරිද? මොකක්ද මේ වෙලා තියෙන්නේ. මිනිස්සු

කනවා බොනවා පාටි දානවා ජොලියේ ඉන්නවා. ඇයි මිනිස්සු වගේ මේ දේවල් බැරි. ඇයි මේ හුදකලාවේ ඉන්නේ. ඇයි මේ තනියම ඉන්න හදන්නේ. ඇයි හැම තැනම කොන්වෙන්නේ. මේ දේශනය කරන්න ලේසි නෑ මේවා හිතන්නවත් ලේසි නෑ මේවා භාෂාවට ගන්නත් බෑ.

ඇත්තට ආර්යයන් වහන්සේ කියන්නේ නිකම් නෙවෙයි. ආර්යයන් වහන්සේ කියන්නේ මනුස්සයෙක් නම් නෙමෙයි. පිළිගත්ත නොගත්ත ඒක ඔබට බාරයි. මේ සත්‍ය ලෝකෙට දෙන්න ඕනා. මේ සත්‍ය තුළ ඔබේ දුක් නිවෙනවා. මේ මනුස්සයා යන ගමන මේ මනුස්සයාට සිද්ධ වෙන හැම දේටම විසඳුම් තියෙනවා. මේ ඔබේම විමුක්තියයි විමුක්ති සාරයයි, එය ඔබ අත් දකිනවා. මේ දේශනා ප්‍රාතිහාර්ය අති පුදුමාකාරයි. අති ගාම්භීරයි. ඇත්තටම කිව්වොත් මේ අහන ප්‍රශ්න බොළඳයි. නමුත් මේ අහන බොළඳ ප්‍රශ්න ඒ අය අතරම දියුණුවක් ඇති කරලා ඒ අයට ම මේක කියල දීලා, ඒ අය දැන් කියල දිපු උත්තර අනුසාරයෙන් ප්‍රශ්නයක් අහනවා. එහෙම නැතුව ඒ අයට ප්‍රශ්නයක් අහන්න හැකියාවක් නෑ. ඒ තරම්ම නොදියුණු ඒ තරම්ම අධ්‍යාත්මිකය පිරිහුනු මේ මිනිස් සංහතිය, ඒ දියුණු ස්වභාවයට පත් කරලා අරගෙන ඒ මුනි ස්වභාවය තුළ ඒ ලෝක ස්වභාවය දැකල ලෝක ස්වභාවයට සරණ වෙන. ඒ මහා මුනිවරුන් ඍෂිවරුන් මේ ධර්මය අවබෝධ කරගෙන, මේකට ප්‍රධාන හේතුව මේ කටයුත්ත යට සැඟවුන කතාවක් තියෙනවා. නමුත් ඒක කියන්න තරම් සුදුසු නෑ. නමුත් මේ යුතුකම වෙන්න ඕනා. මේක අපි අතින් සිද්ධ වෙනවා. මිනිස් සංහතියට. ඔබේ ප්‍රශ්න බොළඳ වුනත් දෙන උත්තරය මනුස්ස සංහතියට සුදුසු උත්තරයක් නෙමෙයි. ඒ උත්තරයේ තියෙන්නේ මහා මුනි ස්වභාව පිළිතුරක්. ඒ තුළ සමාජයට ලෝකයට මේ සත්‍ය විවරකර ගන්න පුදුමාකාර පන්නරයක් අවබෝධයක් ඥානයක් ප්‍රඥාවක් අවධිවෙනවා. විවරවෙනවා අභ්‍යන්තරයෙන් ලෝකයාට සියලු යහපත සිද්ද වෙනවා. මේක ආශ්චර්යමත් යුගයක්. බොහෝම හොඳයි. යහපතක් වෙන්න ඕනෙ. සත්‍ය අවබෝධ වෙන්න ඕනේ. තෙරුවන් සරණයි.

# 03

# මේ මොහොතේ ඔබ සියළු දුකින් මිදෙනවා

**උපාසිකාව :** තෙරුවන් සරණයි. ආර්යයන් වහන්ස මම කතා කරන විට සම්මුතියෙ වචන පාවිච්චි වේවි. ආර්යයන් වහන්ස මම මාස එකහමාරක් විතර තිස්සේ උදේ ඇවිදීම සිදුකරනවා. ශබ්ද වර්ණ ගන්ධ රස පහස ඇති වන නැති වන දේ බලනවා. දැන් දවස් තුනක් විතර තිස්සේ ආපහු ගෙදර එන විට මට දැනෙන්නේ කිසිම භරයක් නැති ක්ෂණයක්වත් පවතින නොපවතින ඇසීම, පෙනීම, දැනීම, සිතීම ඒක සෙන්සර්වල ඇතිවන ක්‍රියාවක් වෙනවා. එතකොට වේගයට හසු වෙච්ච මායාවක් වගේ සිහියට දැනෙනවා. හිස් බවකින් යුතුව ආපසු එන ගමනක් තමයි සිහියට අහුවෙන්නෙ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්ස :** ඔය ඕක කියන එකේ තේරුම මොකක්ද?

**උපාසිකාව :** ඒ කියන්නෙ ආර්යයන් වහන්ස දැන් අර මුල් පටන් ගත් දවස්වල හැම වෙලාවෙම ඒ කියන්නෙ හුඟක් වෙලාවට සිතුවිලි පොර බදින ගතියක් කෙළෙස් මට්ටම ආර්යයන් වහන්ස දැන් මුල් පටන්ගත්ත දවස්වල මට ශබ්දයක් ඇහෙන කොට ඒක විග්‍රහ වෙන ගතිය

**ආර්යයන් වහන්ස :** නෑ අත්දැකීම කියන්න ඕන, මේ දේශනා අහන අය ගොඩක් දැන් ඔය වගේ කතන්දර අහලා තියෙනවා. දේශනා ආර්යයන් වහන්සේ ගොඩක් කියලා තියෙනවා වෙනදා විදියටම පේනවා, වෙනදා විදියටම ඇහෙනවා, වෙනදා විදියටම පේනවා නමුත් ඒ කිසිම දෙයක් ඇලෙන්නෙ නැති ස්වභාවයක් මතු වෙනවා. ආයි ආර්යයන් වහන්සේට ඕක කිව්වොත් මොකද වෙන්නෙ? මොකක්ද කරලා තියෙන්නෙ

එතකොට. ඕක කියලා වැඩක් නෑනෙ. තමන් අත්දැකපු අත්දැකීමක් විතරයි කියන්නෙ. එහෙම නැති නම් තමන්ගෙ කෙළෙස් ස්වභාවයක් ඒ කෙළෙස් ස්වභාවය කොහොමද නැති කරගන්නෙ කියලා අහන්න පුළුවන් ප්‍රශ්නයක්. එහෙම නේද? කවුරු හරි ආර්යයන් වහන්සේ ගෙන් ඇහුවොත් ආර්යයන් වහන්සේට කිව්වොත් මට මුකුත් දැනෙන්නෙ නෑ, මම රහත් වෙලා නේද කියලා ඇහුවොත්. කවුරු හරි ඇහුවොත් මට මෙහෙම ස්වභාවයක් දැනෙනවා ආර්යයන් වහන්ස මේක කොහොමද නැති කරගන්නේ කියලා. අන්න ඒක කියලා දෙන්න පුළුවන්නෙ එහෙමනේ? තමන්ගෙ කෙළෙස් ඉස්සෙල්ලා දකින්න ඕන. කෙළෙස් දකින්නෙ නෑ කියන්නෙ තාම මාර්ගයේ නෑ කියන එක.

තමන් මාර්ගයේද නැද්ද කියන එක තේරුම් ගන්න පුළුවන් වෙන්නෙ තමන් තමන්ගේ කෙළෙස් ප්‍රමාණය දැකලා කතා කරනවා නම් විතරයි. එහෙම නැත්නම් මයික් එක මියුට් එකේ තියෙන්නෙ ඇයි ඒ තමන්ට කෙලෙස් ස්වභාවය දියවෙලා ගිහිල්ලා කට උත්තර නැති වෙලා කියන්න දේකුත් නැතිව යනවා. එහෙම නම් මයික් එක 'අන්මියුට්' කරලා කතා කරනවනම් මට දැන් මුකුත් දැනෙන්නෙ නෑ මට මුකුත් තේරෙන්නෙ නෑ ආර්යයන් වහන්ස මොකද මේ ගැන හිතන්නෙ? එහෙනම් කියන්න වෙන්නේ ඔය මයික් එක 'මියුට්' කරලා තියාගන්න. ඇයි ඒක ප්‍රශ්නයක් නෑනෙ නේද? එහෙම නේද? ඉස්සෙල්ලාම මේ දේශනා අහන හැමෝගෙන්ම එක ඉල්ලීමක් කරන්න ඕන තමන්ට තමන් අවංක වෙන්න. **මේ නිවන් මග යනවා නම් ඉස්සෙල්ලාම තමන්ගෙ කෙළෙස් බලා ගන්න, අනුන්ගෙ කුණු හොයන්න කලින් තමන්ගෙ කුණු ටික දැකලා ඉන්න. මේ දහම තුළ එක තැනක හමු වෙනවා තමන්ගෙ පැත්ත දැකලා තමයි අනිත් පැත්ත දකින්න තියෙන්නෙ. තමන්ගෙ කෙළෙස් ස්වභාවය දකින්නෙ නැති කෙනෙකුට අනුන්ගේ කෙලෙස් දකිනවා කියන එක වෙන්නෙ නෑ. ඇයි ඒ? තමන්ගෙ කෙළෙස් තියෙනවා නෙ. ඒක බොරුවක්.**

ඕකට හොඳ ගමේ උපමාවක් තියෙනවා නේද ගමේ කථා අනුන්ගෙ සීනි කිරන්න යන්න එපා කියලා. ඔය කතාව තමයි මේ තියෙන්නෙ. තමන්ගෙ කෙළෙස් බලා ගන්න නිවන් මග යනවා නම් ඉස්සෙල්ලාම අනුන්ට බණ කියන්න කලින් තමන් මාර්ගය සම්පූර්ණ කර ගන්න. නැත්නම්

තමන් කොතනක හරි හිර වෙලා ඉඳලා අනුන්ට බණ කියන්න ගිහිල්ලා ඒ අයත් හිර වෙලා තමුනුත් හිර වෙලා ඔක්කොම මිත්‍යා දෘෂ්ඨියට ඇදලා දානවා. හරිම පාප කර්මයක් තමයි වෙන්නෙ. මේ නිසා අපි කරන්න ඕන දෙයක් තියෙනවා මේ නිවන් මග යන අය හැම කෙනෙක්ම බොහොම පිරිසිදුවට දකින්න ඕන කාරනාවක් තමයි තමන්ගෙම කෙළෙස් හඳුනා ගන්න. මාර්ගෙට පිළිපන්නයි කියලා කියන්නේ ආසවක්ඛය ඤාණය තියෙන්න ඕන. **'ආසවක්ඛය ඤාණය' තියෙනවා කියන්නෙ තමන්ගෙම අර ආරෝපනය දැකලා 'රාග ද්වේශ මෝහ' ස්වභාවය දැකලා ඒක දියවෙන මග ඉන්නවා කියන එකයි. ඒ මග නැති කිසි කෙනෙක් මාර්ග යේ නෑ.** තමන්ගෙ කෙළෙස් දැකලා තමන්ගෙ කෙළෙස් දිය වෙන මග නැති කිසි කෙනෙක් මාර්ගයේ නෑ. පෝට්ල භික්ෂුවට දැනුම තිබුණා. ගෝලයෝ රහත් උනා. පෝට්ල භික්ෂුව ඇයි රහත් උනේ නැත්තෙ, පොට්ල භික්ෂුව මාර්ගයේ හිටියෙ නෑ.

මාර්ගය ගැන කියන කොට අපි ගොඩක් වෙලාවට කතා කරනවා ආර්ය අෂ්ඨාංගික මාර්ගය. **'ආර්ය අෂ්ඨාංගික' මාර්ගයේ 'සම්මා දිට්ඨිය' තුළ පටන් ගන්නේ දර්ශන 'දිට්ඨිංච අනුපගම්මසීලවා දස්සනේන සම්පන්නෝ' කියන තැන තමන්ගෙම අභ්‍යන්තරයෙ කෙළෙස් ස්වභාවය දකින තැන, එම ආරෝපණයෙ දිය වෙන මගට බහින තැන. තමන් ඒ දර්ශනය පිරිසිදුවට අසා දැනගත්ත ධර්මය, මොකක්ද ඒ අසා දැන ගත්ත ධර්මය අසා දැනගත්ත ධර්මය කියන්නෙ බුද්ධ ධර්මය කියන්නෙ 'චක්ඛුං නිච්චංවා අනිච්චංවා - අනිච්ජං භන්තේ' මහණෙනි ආත්මයක්ද 'නොහේතං භන්තේ' අනාත්ම ධර්මය දැනගෙන තියෙන්න ඕන. එහෙනම් ආත්මයක් නැති ධර්මයක් දැනගෙන තියෙන්න ඕන**. දැන් මෙතන ආත්මය නැති බව දකින්න ඕන. ආත්මයක් තියාගෙන බුද්ධ ධර්මයේ ඉන්නවා කියනවා නම් කවුරු‍ැ හරි අමූලික බොරුකාරයෙක්. එයා 'භව නිරෝධය' දකින්නෙත් නෑ 'බෞද්ධයෙකුත්' නෙවෙයි. මේ යුගයෙ නිඝණ්ඨයො හරි ලේසියෙන් හොයා ගන්න පුළුවන්. අර බුදුන් වහන්සේ ඇහුවනෙ 'ඉධ භික්ඛවේ භික්ඛු' මේ සාසනේ භික්ෂුවක් වෙන්නෙ කොහොමද කියලා 'චක්ඛුං නිච්චංවා අනිච්චංවා' නේ? 'අනිච්චං භන්තේ' මහණෙනි එහෙනම් ආත්මයක් ද? 'නො හේතං භන්තේ' මේ යුගයෙන් ඕකම තියෙනවා.

අනාත්ම ධර්මක් දේශනා කරන්නේ නැති කිසි කෙනෙක් 'ඉධ භික්ඛු වේ භික්ඛු' මේ සාසනේ භික්ෂුවක් වෙන්නෙ නෑ නිගන්ඨ භික්ෂුවක්. 'ශූඤ්ඤත පටිසංඤ්ඤත' දේශනයක් දේශනා කරන්නේ නැති කිසි කෙනෙක් මේ යුගයේ භික්ෂුවක් වෙන්නේ නෑ. භික්ෂු කියලා කියන්නේ අනුසෝතය නෙවෙයි පටිසෝතය, එහෙනම් 'ශූඤ්ඤත පටිසංයුක්ත' වෙන්න ඕන. ධර්මය කියලා කියන්නෙ දෙයක් නැති බව. 'පටිච්ච සමුප්පාදේසු ධම්මං' කියලා කියන්නෙ 'පටිච්චසම්මුපාද' ධර්මය අවබෝධ වෙන්නෙ දෙයක් නැති බව. පටිසම්මුපාද ධර්මය අවබෝධ නෑ කියන්නෙ අනුසෝතයේ දෙයක් කරගෙන බණ කියන එක අපි සැබෑ බෞද්ධයො වෙන්න ඕන, අපි ධර්මය දේශනා කරන්න ඕන ඒ වගේම ධර්මය අහන්න ඕන, ඒ වගේම ධර්මය හඳුනා ගන්න ඕන. **ධර්මය හරි 'ඍජුයි' හරි 'සුන්දරයි' හරි සරළයි' මේකෙන් මුළු ලෝකවාසීන්ටම යහපතක් සිද්ධ වෙනවා. මේකෙ සියල්ලම අන්තර්ගතයි. මේකෙ 'මහා පුරුසෝ' කියන ස්වභාවයට එන්නේ මනුස්ස ස්වභාවය අභිබවා ගිය ඒ 'ආර්යය භූමිය' හමු වෙනවා.** ඒ ආර්යය භූමිය මේ ඇස - කණ - දිව - නාසය - කය - මන කියන මේ ආයතන වර්ණ - ශබ්ද - ගන්ධ - රස - පහස ලෝකයෙන් මිදුණු සත්ව පුද්ගල දෘෂ්ටියෙන් මිදුනු, එතෙන්ටයි එන්න ඕන. එහෙනම් අපි කතා කරන්න ඕන අපේම කෙළෙස් ගැනයි.

එහෙනම් අපි වැඩියෙන්ම කථා කරන්න ඕන මොනවද අපිට ඕන තරම් දේවල් තියෙනවානෙ කියන්න. ඔබ තුමිය අද පාරෙදි දැකපු දෙයක් ඔබ තුමී අද උදේ නැගිටින කොට ඇඳෙන් බිමට වැටුනා නම් ඒක නේද? ඒන දෙයක් කියතැහැකිනෙ. ඇයි ඉතිං මෙතන කෙනෙක් පුද්ගලයෙක් නෑනෙ ලැජ්ජ වෙන්න දෙයක් නෑනේ. ලැජ්ජ වෙන්න නම් කෙනෙක් ඉන්න ඕන. එහෙම නැත්නම් ඕන දෙයක් 'ඝටීකාරලාගෙ වහල අරං ගියත් කියලා තියෙනවා, ධර්මය තුළ ලැජ්ජ වෙන්න දෙයක් නෑනෙ. මොනවයි නේ, මැටිවලං හදන එක ලැජ්ජ වෙන්නෙ මැටි වලන් හදනවා කියලා කිව්වාට කමක් නෑ. බුදුන් වහන්සේ පස් වග තවුසන්ගෙන් බණ ඇහුවා කියන එක ලැජ්ජ වෙන්න දෙයක් යැයි පස් වග තවුසො කියන්නෙ නිඝන්ඨයො. නිඝන්ඨයොන්ගෙන් තමයි බුදුන් වහන්සේ මුලින්ම බණ අහන්න ගියේ. එදා ඒ ගොල්ලො ධර්මය අවබෝධ කර ගන්න අයයැ. නෑනෙ. දැන් ඉන්න අය කැමති නෑ. එහෙම ලැජ්ජ වෙන්න කැමති නෑ.

(ඉහත සාකච්ඡාව මෙතනින් අවසන්)

**උපාසිකාව :** තෙරුවන් සරණයි! නමස්කාර වේවා ආර්යයන් වහන්ස පහුගිය කාලෙ මට හරියට කේන්ති ගිය කෙනෙක්. ඔෆිස් ඒකෙදිත් මට පොඩි දෙයක්, සුලු දෙයකට උනත් මට තරහා යනවා. මට තරහා වෙච්ච මගෙත් එක්ක දෙන්නෙක් හිටියා දැනටත් එහෙමයි. ඒ අය මගෙත් එක්ක කථා කරන්නෙ නෑ. ඒත් මට ඒගොල්ලො දැක්කහම ඉස්සර වගේ තරහා යන්නෙ නෑ ආර්යයන් වහන්ස. ඒ උනාට සමහර වේලාවකදි මට ඒ ගොල්ලො දැක්කහම දැන් වැඩට යන්න උදේට ලේස්ති වෙන කොටත් මට ඒ ගොල්ලොන්ව මතක් වෙනවා. එපා වෙනවා වගේ මට රැකියාව එපා වෙනවා වගේ යන්න එතනට. මම සූම් දේශනාත් අහනවා, මට විවේක වේලාවෙදි. මට ආර්යයන් වහන්ස තව එකක් තියෙනවා, මට දැන් ඔය දේශනාවන් අර්යයන් වහන්සේගෙ අහන කොට පපුව හිර වෙනවා වගේ දෙයක් වෙනවා. ඊට පස්සෙ අහලා ඉවර වෙන කොට ඒක නැති වෙලා යනවා. මට මගේ වෙනසක් දැනෙනවා. ආර්යයන් වහන්ස ඒ උනාට තරහා යන එක සමහර වෙලාවන්වල දී ඒත් ආයෙම තියෙනවා. මම දැන් වැඩට යනකොට උනත් මම මගදිත් එහෙම හිත හිතා යන්නෙ. දැන් මේ 'ශබ්දයත් වර්ණයත්' මේ හැම දේටම මගේ තරහා තියෙනවා. දැක්කත් මට එහෙම මතක් වෙනවා. ආර්යයන් වහන්ස ඒ උනාට සමහර වේලාවදි මට ඒක අමතක වෙලාම ගිහිල්ලා ආයෙ අර විදියටම වෙනවා අර්යයන් වහන්ස. මගේ මොකක්ද ඒ එතන වෙන්නෙ. මගේ දුර්වලකම මට පොඩ්ඩක් පහදලා දෙන්න සමාවෙලා ආර්යයන් වහන්ස. මාසයක් විතර වෙනවා බණ අහන්න අරගෙන.

**ආර්යයන් වහන්ස :** දැං ඇත්තටම මේකයි වෙලා තියෙන්නෙ. ඇත්තටම තාම පටන් ගත්තා විතරයි නෙ. මේ ඇත්තටම මොකක්ද කියලා, මේකෙ කවුරු හරි කෙනෙක් බුදුන් වහන්සේ ගිය මග ගියා නම්, බුදුන් වහන්සේ මොකක්ද සත්‍ය ගවේශකයෙක් ඒකනෙ අභිනිෂ්ක්‍රමනය කරන්නෙ. බුදුන් වහන්සේ මේ ලෝකෙ සත්‍ය සොයන්නෙ. ඇයි අපිටත් ඔය ස්වභාවයට ආවොත් අපිට කිසිම දෙයක් ඔතන පටලැවෙන්නෙ නෑ. අපි අන්ධයො වගෙ ඉපදිලා අන්ධයො වගෙ ජීවත්වෙලා, අන්ධයො වගෙ මැරිලා යනවද කියල එතනට එන්න ඕන. එතකොට තමයි ඔබතුමියට අන්න අභ්‍යන්තරයට දැනෙන එකක් එනවා ඇත්තටම මේ ලෝකෙ ඇත්ත මොකක්ද, ඇත්තටම අපි ඇයි මැරෙන්නෙ ඇත්තටම අපි ඇයි

ඉපදුනෙ, ඇයි අපි ජීවත් වෙන්නෙ. ඇත්තටම මේකෙ සත්‍ය මොකක්ද? අන්න ඒ කුතුහලෙන් ඉන්න කෙනෙකුට තමයි මේ ප්‍රඥාවන්තයාගෙ මග ආරම්භ වෙන්නෙ. එතකොට එක හොයන නිකන් අර අනිත් අය කරන හින්දා අනිත් අය කරන්නම් වාලේ රැල්ලට එහෙම නෙවෙයි දෘෂ්ඨිවලට නෙවෙයි.

අපි ගාව තියෙන්න ඕන අපේ කතාව දැන ගන්න මොකක්ද? මගේ ඇත්ත කතාව. මොකක්ද මේකෙ තේරුම. දැන් ටික දවසක් ඉඳලා ඔහේ මියයයි නේ. ඔහේ මැරිලා යන එකනෙ වෙන්නෙ. කොයි වෙලාවෙ මැරිලා ගියත් එකයි. නමුත් මේකෙ ඇත්ත මොකක්ද කියලා හොයන්න උවමනාවක් තියෙන්න එපැයි. එහෙම නේද? මෙන්න මේ ආකල්පවල පරිවර්තනයක් කෙනෙක්ගාව හටගැනීමම ධර්මයට ප්‍රවේශයක් සිද්ධ වෙන්නෙ, ඒ තුළ ඒක නිර්මලව ග්‍රහනය කර ගැනීමේ හැකියාව ලැබෙනවා. මේ බණ අහපු ගමන්ම ඔක්කොම කෙන්ති යන එක නතර වෙලා ඒ වෙලේම රහත් වෙනවා කියල මේක හොඳට තේරුම ගන්න ඕන. එහෙම නොවෙනවා කියන්න බෑ. එවැනි ස්වභාවයක් අවබෝධක් ඇතිව මේ දහම යොමු උනොත් එහෙම වෙනවා. හැබැයි ඔබ තුමී කියන විදියට අපට තේරෙනවා ඔබතුමී මේක හොඳින් මේකෙ සත්‍ය සොයන අදහසකින්, මේ දේශනා ටිකක් ගැඹුරුයි ඒවා පොඩ්ඩක් තියලා මුල් දේශනාවට ගිහිල්ලා අර සරල දේශනා අහන්න ඕන. සූත්‍ර දේශනා දාගෙන යනවා. ඒක ගොඩක් වටිනවා. අපි දැක්කා 'බුද්ධෝපාද ආර්යයන් වහන්සේ' නාලිකාවේ සරල කර්මස්ථාන දාගෙන යනවා. ඒක ගොඩක් වටිනවා. අපි දැක්කා 'බුද්ධෝපාද අවදිය' නාලිකාවෙ මුලින් දාලා තියෙන සරල දේශනා පෙන්වනවා අපි දැක්කා ඊවර්කින් බුද්ධෝත්පාද එකේ අලුතෙන්ම එන නවකයෙක්ට හරි යන විදියට සකස් කරගෙන යනවා. ඒවා ගොඩක් වටිනවා. විවිධාකාර විදියට මේ එක එක්කෙනා මේවා තේරුම් අරන් දැන් කටයුතු කරනවා. ඔබතුමියට සුදුසු දේ තේරුම් ගන්න පුළුවන්. ඔබ තුමිය එතනින් ඒක හඳුනා ගන්න.

මේක සරල තැනකින් ඔබ තුමිය මේක ගන්න ඕන. ඒක ඊට පස්සෙ ඔබ තුමිය ඒක සරලව ග්‍රහනය කරගෙන යන්න. ඒ අතරතුර ඔබ තුමියට ගැඹුරු එකක් අහල බලන්න. ඒක වැටහෙනවාද කියලා.

වැටහෙනවානම් ඒකත් එක්ක යන්න. හැබැයි නොවැටහෙනවා නම් සරල එකකට යන්න. අර ගැඹුරු එක ගොඩක් ගැඹුරු වැඩි නිසා ඔලුවට ඔලුවෙ කැක්කුමක් වගේ එන්න පුළුවන් නොතේරෙන කමට. ඒකට වද දෙන්න එපා. මේ මනසට එහෙම වද දීලා කරන්න බෑ. **මේ මනසෙ ස්වභාවයක් තියෙනවා ක්‍රියාත්මක වන, ඒ ස්වභාවය හඳුනාගන්න ඕන. ඉතින් ඒ මනසට දරා ගන්න බැරි අර නොතේරෙන කමට වැඩිය හොඳයි අර සරල එකක් පොඩ්ඩක් අහන එක. අනිත් එක ඇත්තටම එක දිගට අහන්න ගියත් ආතතියක් එනවා.** ඒකත් පොඩ්ඩක් තේරුම් ගන්න ඕන. හැමදේම සමබර කර ගන්න ඕන. බොහොම සරලව ගන්න ඕන. හැම කෙනෙක්ම අසරණයි තමයි. අපිත් එහෙම තමයි. අපිත් මේ උපතින් මේ මොකක්වත් දැනගෙන ඉපදුනේ නෑ. ඇත්තටම කිව්වොත් එහෙම අපිත් මිත්‍යා දෘෂ්ටික පවුල්වල ඉපදුනේ.

(ඉහත සාකච්ඡාව මෙතනින් අවසන්)

**ආර්යයන් වහන්ස :** කැමතියි පුංචි පැහැදිලි කිරීමක් කරන්න **මේ ධර්මය අනාත්ම ධර්මයක් මේ අපි කතා කන්නෙ ඇත්තටම මේ පරම සත්‍යයක් ගැන. මේ ලෝකෙ ඇත්ත මොකක්ද කියන එක ගැන. ඇත්තටම සත්‍ය සොයන කොට තමයි තේරෙන්නෙ මෙතන ආත්මයක් නැති බව.** හැබැයි ඒක ලේසි නෑ වටහගන්න. ඒ අපි කථා කරන මේ සත්‍ය ඥානය කියන තැන ඒ සක්කාය දිට්ඨි ප්‍රහීන වෙනවා කියන තැන මේ අනාත්ම ධර්මය තමයි අවබෝධ වෙන්නෙ. හැබැයි මේක බොහොම පරිස්සමින් දකින්න ඕන තැනක්. මොකද එක පාරටම ලෝකය ඇත්ත කරගෙන ඉන්න කෙනෙක් තමයි මේක අහන්නෙ. ලෝකය ඇත්ත කරගෙන ඉන්නවා කියන්නෙ අපි සාමාන්‍යයෙන් සතා සිව්පාවා වගේ, අපිට පේන ඇහෙන දේවල් හැම එකම ඇත්ත කරගෙන ඉන්නෙ, ලෝකෙ තියෙනවා තියෙන ලෝකෙ මම ඉන්නවා ලෝකෙ තියෙද්දි මට යන්න බෑ මෙතන තමයි සාමාන්‍ය මනුස්සයා ඉන්නෙ සතා සිවුපාවාත් ඉන්නෙ එතන. ඒ නිසා තමයි මරණයත් තියෙනවා 'මම මැරෙණවා' මර බියක් තියෙනවා. මේ පුංචි තැන අපි නුවණින් දකින්න ඕනෙ. මේ දහම ගොඩක් ප්‍රගුණ කරගෙන යන කොට පැහැදිලි කරන පාර ඉතාම සරළව ඔබට පැහැදිලි

කරලා තියෙනවා. නමුත් තමන්ට පුළුවන් විදියට කලබල නොවී ඒ සරළ දෙයින් ඉස්සෙල්ලා මේ දේ අහගෙන ගියොත් වැටහේවි ඇත්තටම මෙතන සත්‍ය කුමක්ද කියන එක. ඔබ ඉන්න තැනේම ඉදන් තමයි අපිත් මේ දහම පැහැදිලි කරන්න පටන් ගත්තෙ.

හැම කෙනෙක්ම මේ සත්‍ය නොදන්න තාක් අසරණයි. **අපි සරණ යන්නෙ අසරණ නිසා. අපි සරණ යනවා කියලා අපි තවත් එක අසරණ කමකට වැටෙන්න බෑ. අපේ ජීවිත කාලෙ බොහොම කෙටියි. ඉතිං අපි අසරණ කමින් මිදෙන්න නිවැරදි මේ සත්‍ය දැනගත යුතුයි.** ඉතින් මේ සත්‍ය අවබෝධ වීම තුළ ඒ අවබෝධ වුන සත්‍ය අතිගාම්භීර බව දැනෙන කොට මේ සත්‍ය ලේසියෙන් කෙනෙකුට අවබෝධ කර ගන්න බැරි බව දැනෙන කොට අපිත් නිහඬව තමයි හිටියෙ. නමුත් මේක නොකියත් බෑ. මේක කියන්න ඕන. නමුත් මේ 'සත්‍ය' බොහෝ  අයට දැන් වැටහේවි. තම තමන්ගෙ මට්ටමට. මේකෙ ඇත්තටම තියෙන්නෙ සත්‍ය නොදන්න කම අවිද්‍යාව තුළයි තියෙන්නෙ කථාව. මේක ඇත්තටම දෘෂ්ඨියකයි තියෙන්නෙ. මිත්‍යා දෘෂ්ටියෙයි තියෙන්නෙ. මේ හැම තැනම තියෙන්නෙ ඇත්තටම අපි දෘෂ්ටියක හිර වෙච්ච එක. මේ අපිට මේ දෘෂ්ඨියෙන් ගැලවෙන්න බැරිවයි ඉන්නෙ. මේ හැම කෙනෙක් ගාවම ඔය ප්‍රශ්නෙ තියෙනවා. මේ දෘෂ්ඨිවලින් ගැලවෙන එක ලේසි නෑ. **මෙතන කෙනෙක් පුද්ගලයෙක් සත්වයෙක් ඉන්නවාද කියලා එහෙම හොයන්න යන්න එපා. ඔබ බලන්න මොකක්ද මේ, මේ 'සත්‍ය' කියන්නෙ මොකක්ද කියලා. එතකොට ඔබට සත්‍යය හමුවෙයි** මොකක්ද මේ ලෝකේ ඇත්ත කියලා.

තම තමන්ගෙ විදියට ඒ සත්‍ය තමයි අවබෝධ වෙන්නෙ. කවුරුවත් එක පාරටම කලබල උනා කියලා එහෙම සත්‍ය අවබෝධ වෙන්නෙ නැහැ කාටවත්. හැබැයි මේ මෙතන සංඛිතේ නිබ්බිදාය කියන කොට මේ දහම අවබෝධ කරන දහමක්. මේ පටිච්චසමුප්පාද ධර්මය අවබෝධ වෙන්න ඕන. මේ පටිච්චසමුප්පාද ධර්මය කියන්නෙ හිත හැදන හැටි. ඔය හැම දේම තියෙන්නෙ කෙන කෙනාගෙ හිතේ. ඒකයි අපි කියන්නෙ 'මනෝ පුබ්බංගමා ධම්මා' කියලා 'චිත්තේන නීයති ලෝකෝ' සිත තුළ මැවුනු ලෝකෙ. අපි දුක් විදින්නෙ සිතින් අපි හඬා වැළපෙන්නෙ සිතින්මයි. අනේ මගේ දරුවා, අනේ මගේ අම්මා අපි කොච්චර ඒ වගේ දැකලා

තියෙනවාද? අපිට ඇහිලා තියෙනවා මේ සත්වයා දුක් විඳින්නෙ මනසින්මයි හිතින්මයි. මහන්සි වෙලා වැඩක් කරත් ඒක හිතනවා මං මහන්සි උනා කියලා. කෑවෙ නැත්නම් හිතනවා මං කෑවෙ නෑ කියලා. එහෙම හිතුනාම දුක්ක එනවා අනිත් අය හොඳට කනවා මට කන්න නෑ. අනිත් අය සැප විඳිනවා මට කිසිම සැපක් නෑ. ගොඩක් අය ඔහොම තමයි හිතන්නෙ. මම දුක් විඳිනවා. හැම කෙනෙක්ම එහෙම හිතලා ඇත්තටම දුක් වෙනවා ඒ හිත නේද දුක් ගේන්නෙ. හිතින් නේද දුක් විඳින්නෙ මට මෙහෙම උනා මට අරම උනා මං දුක් විඳින්නෙ. මං දුක් විඳින්නෙ අරගොල්ලො නිසා. මං දුක් විඳින්නෙ එයා හින්දා. මං දුක් විඳින්නෙ නැත්නං හිතනවා අම්මයි තාත්තයි හින්දා කියලා. මේ අම්මයි තාත්තයි දුප්පත් නිසානෙ මං දුක් විඳින්නෙ කියලා හිතනවා. මේ කෝකවත් නෙවෙයි නේද? **ඔබ දුක් විඳින්නෙ ඔබේම සිත නිසයි. ඔබේ සිතමයි දුක. සිතෙන් මිදෙන මග, ඒක නේද දුකින් මිදෙන මග. ඒක නේද නිවන් දකින මග. ඉපදුනේ හිතමයි එහෙනම් හිතම නේද මේ ඉපදීම, මරණයත් හිතම නේද? බොහොම පරිස්සමින් මේ දේ දිහා බලන්න ඕන ඒක හරි සුන්දර කතාවක්.**

ඔබ දන්නවා පසුගිය දවස් ටිකේ ඉතාම ගැඹුරු පරියායක් බොහොම සියුම්ව විග්‍රහ කරනවා. මේ සත්‍ය දකී නම් ගොඩක් වටිනවා ඔබේ ඇසට මැවෙන ලෝකය කොහේ හරි තියෙනවා නෙමේ ඔබේ කණට ඇසෙන ශබ්ද ලෝකය කොහේවත් තියෙනවා නෙවේ. ඔබට දැනෙන ලෝකය කොහේවත් තියෙනවා නෙවේ. දිට්ට සුත මුත ඔබ මොහොතකට ඔබේ ඇස් පියාගෙන බලන්න 'වර්ණ ලෝකය' කොහෙද තියෙන්නෙ, එළියෙ වර්ණ ලෝකයක් තියෙනවාද? ඔබ කවදාවත් එළිය අත්දැකලා නෑ. ශබ්ද ලෝකය කොහෙද තියෙන්නෙ, එළියෙ ශබ්ද ලෝකයක් තියෙනවාද? ඔබේ කන්බෙරය හිල් වෙලා නම් ඔබේ කන් ඇහෙන්නෙ නැත්නම්, මෙතන කන් බෙරය හෙල්ලෙන එක මෙතනම මැවෙන එක කොහෙවත් තියෙනවා නෙවෙයි, වර්ණ මෙතන සකස් වෙන එක කොහේවත් තියෙනවා නෙවෙයි, මේක හරි පුදුම මායාවක්. එක පාරට කෙනෙකුට තේරෙන්නෙ නෑ. ඉතිං හරිම සුන්දර කථාවකුත් මේත් එක්කම තියෙනවා. මොකද මේ සත්‍ය අවබෝධ උනා කියලා ඔබ සාමාන්‍ය විදියටම කටයුතු කරනවා. ඔබ වෙනදා විදියටම කටයුතු කරනවා. ඔබ එදිනෙදා රැකියාව කරනවා.

පාසල් දරුවෙක් නම් සද්දයක් නෑ කටයුතු කරනවා. මේ එකක් වත් වෙනස් වෙන්නෙ නෑ. ඒ අවබෝධය ඇත්තටම ඔබේ සියලු දුක නිවනවා ඔබ සියලු දුකෙන් මිදෙනවා. ඊට පස්සේ ඔබ සතුටින් රැකියාවට යනවා. ඔබ සතුටින් ඉගෙන ගන්නවා. ඔබ එදිනෙදා කටයුතු බොහොම සතුටින් කරනවා. මේක මහ පුදුම සුන්දර කථාවක්.

බෞද්ධයො හරි වාසනාවන්තයි බෞද්ධයෝ හරි භාග්‍යවන්තයි. හැබැයි මේ බෞද්ධයාට දහම අහිමි වීම හරිම අභාග්‍ය සම්පන්නයි. හැබැයි මේ බෞද්ධයා මේ දහම අත්දැක්කොත් මැරිලා නෙවෙයි ජීවත් වෙලා ඉන්න කොට සදාතනික සුවයක් අත්දකිනවා. ඔවුන්ට දරුවො ඉන්නවා, ඔවුන්ට ගෙවල් දොරවල් තියෙනවා, ඔවුන්ට අම්මා තාත්තා ඉන්නවා. ඔවුන් එදිනෙදා කටයුතු කරනවා හැබැයි කිසිම ගින්නක් නෑ. ඔවුන්ට මරණයක් නෑ ඔවුන්ට මර බියක් නෑ ඔවුන් මරණය ජය ගෙන ඔවුන් සත්‍ය අවබෝධ කරනවා. හෙට දවසේ ඒ බෞද්ධ සමාජය ගොඩ නැගෙනවා ඒක ඒකාන්තයි. මේ අසරණ අම්මලා තාත්තලා ඔය දෘෂ්ටිවලින් ගැලවෙන්න ඕන. මේ හැමෝටම මේ සත්‍ය අවබෝධ වෙන්න ඕන. කොයි තරම් සැනසිමක් මනුස්සයාට ලැබේද? කොයි තරම් භාග්‍යයක් මනුස්සයාට දැනේද? ඔබේ දරුවාට ඔබ දරාගන්න බැරිව කෑ ගහනවා, ඔබ ඔබේ බිරිඳට කෑ ගහනවා ඔබේ ස්වාමියාට කෑ ගහනවා. ඔබ කටයුතු කරන තැන්වල ඔබෙන් ඉගෙන ගන්න දරුවො අසහනෙන් ඉන්නෙ. මේ හැම දේටම විසඳුම මෙතන තියෙනවා ලෝකෙ බොහෝ රටවල විශාදය වගේ අසනීප තියෙනවා. ඔවුන් මැෂින් වගේ උදේට දුවනවා හවසට එනවා. ඉතින් ඔවුන්ට 'මෙඩිටේෂන් තෙරපි' කරන හැටි අපි දවසක් දේශනාවල දැම්මා. හුස්ම දිහා බලාගෙන ඉදලා පොඩි සුවයක් ගන්නවා. දවස් දෙකක්. ඊට පස්සෙ ආයෙ සඳුදා මැෂින් එක වගේ දුවනවා. හිටපු තැනමයි. ආයෙමත් සෙනසුරාදාට අර මෙඩිටේෂන් තෙරපි එකේ ඉන්නෙ. හැබැයි ඒක හැමදාම කරන්න බෑ. කවදාවත් එයාට සදාතනික සුවයක් ඒ කියන්නෙ හැමදාම සැනසීමක් හම්බවෙන්නෙ නෑ. ආයේ ඉන්නෙ ගිනි ගොඩේමයි.

හැබැයි මේ ධර්මය අවබෝධ උනොත් මේ පැහැදිලි කරන කාරනා ටික වටහා ගත්තොත් මෙතන ආත්මයක් නැති බව දැක්කොත් මෙතන

සත්වයෙක් පුද්ගලයෙක් නැති බව දැක්කොත් ඔබ කරන කිසිදු කටයුත්තක් වෙනස් වෙන්නෙ නෑ. රැකියාව කරන අය වෙනදාට වඩා සතුටින් ශක්තිවන්තව රැකියාව කරනවා. දරුවෙක් අසනීප උනත් වැලපෙන්නෙ දඟලන්නෙ නැතුව දරුවාට බෙහෙත් ටික දෙනවා කිසි ගින්නක් නැති වෙනවා. **ඇත්තටම මේ සත්‍ය හරි සුන්දරයි. මේ සේරම සිත හැදෙන හැටි අවබෝධය තුළයි සිද්ධ වෙන්නෙ. ශබ්ද වර්ණ එකට එකතු වෙන හැටි, ඒ ශබ්ද වර්ණ එකට එකතු වෙලා චිත්තයක් සකස් වෙන හැටි. ඒ තුළ ඇත්තටම දෙයක් නැති බව. ඒක අවබෝධ වීම තුළ ගින්නෙන් නිවීම. අභ්‍යන්තර ගින්නක් හට නොගැනීම.** දරු ගින්න, මව් සෙනෙහස, දරු සෙනහස ඔක්කොම නැති වෙන්නෙ නෑ. ඔය හැම දේම තියෙනවා - ගින්නක් නැති සෙනෙහසක් ගින්නක් නැති ආදරයක් ගින්නක් නැති දුකක්, ගින්නක් නැති සතුටක් ගින්නක් නැති ලෝකයක්. මේක ඔබට හමු වෙනවා. ඔබ සියලු දුකින් මිදෙනවා. ඔබ කිසිදු දුගතියකට වැටෙන්නෙ නෑ. ඔබ පුදුම භාග්‍යවන්තයි. මේ කතාව ඇත්තක් මේ බුද්ධොත්පාද දේශනා නිවන් දොරටුව. මේක නිවනටම උපනිශ්‍රය වෙන්නෙ මේ දේශනා කරන ධර්මය පරම සත්‍යක්. නිර්මලව දකින්න ඇස් ඇත්තෝ දකිත්වා, ඒ දේශනා කළ නිර්මළ දහම ඒ සුන්දර සරල තැනින් අල්ලන්න. කලබල වෙන්න දෙයක් නෑ මේක හරි සරල කතාවක් මේක ඔබට තේරුම් කරන්න පුළුවන්. ඔබේ විදිහට මෙය වටහා දෙන්න පුළුවන්.

(ඉහත සාකච්ඡාව මෙතනින් අවසන්)

***උපාසක :*** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස ප්‍රශ්නයක් පැහැදිලි කර ගැනීමක් සඳහා පසුගිය ටිකේම ආර්යයන් වහන්ස මං හිතන්නෙ වෙනසක් මාසයේම සිදු උනේ දේශනා පෙළහක් ඉතිං මට තේරිච්ච විදියට ඇත්තටම ඔබ වහන්සේ ඉදිරිපත් කළ නාමරූප පිළිබඳ විග්‍රහය අති විශිෂ්ටයි. චිත්තේන නීයතී ලෝකේ කියන කොට රූප - නාම වෙන්නැතිව 'නාම- රූප' වෙන විදිය සහ ඒ පැහැදිලි කිරීම් ශුද්ධාෂ්ඨකය පිළිබඳව ආර්යයන් වහන්සේ ඒ සිදුකළ පැහැදිලි කිරීම එය කිසිදාක අපි නො ඇසූ තිව්‍ර පැහැදිලි කිරීමක්. ඉතිං ආර්යයන් වහන්ස මට හිතෙන දේ විදර්ශනා ධූරය භාග්‍යවතුන් වහන්සේ ස්වයංව අවබෝධ කරන්න ඒ

විදර්ශනා ධූරය ප්‍රායෝගිකව බුද්ධ කාලයේ දේශනා කරා, පසු රහතන් වහන්සේලාගේ යුගය අවසාන වෙන කොට ඒක ග්‍රන්ථවලට ඒ කියන්නෙ පොතකට සීමා උනා. මට හිතෙන්නෙ අපි බොහෝ වෙලාවට අදටත් මේ විදර්ශනා මතු කර ගන්න නොහැකි වී ඇත්තෙ මෙන්න මේ වචන තුළ ගන්ථාරූඪ වූ, ඒ වචන තුළින් විදර්ශනා ධූරය අවදිකරගන්න ගියාම වචනවල දෙන අදහස. ඔබ වහන්සේ පසුගිය දේශනාවල දේශනා කර වචනය මත හිතන්න එපා. බොහෝ වේලාවට ඒකට උදාහරනයක් කිව්වොතින් ආර්යයන් වහන්සේ මුල් දේශනාවල මට මතකයි දේශනා කරනවා මහා කාශ්‍යප මහා රහතන් වහන්සේ සහ බුදුන් වහන්සේ අතර නෙළුම් මලක් අරඹයා සිදු වූ ඒ සංවාදය. එතන ඇත්තටම නෙළුම් මලක් ප්‍රස්තුතය උනාට උන් වහන්සේලා දෙපළ කථා කරේ ඇත්තටම ඊට එහා ගිය වචනයට එහා ගිය කරුණක් ගැන ඉතිං බොහෝ වෙලාවට මේ දේශනාවල මම දකින දේ අපි, අපි රැවටෙන්නෙ ඇත්තටම මායාවකින් මායාවක් අවබෝධ කර ගන්න තැනදී. එතනදි වචනවලට අපිට තියෙන අපිට අර ආර්යයන් වහන්සේගේ කිව්ව විදිහට නම් කරන ලද දේ 'නාමය' නම් අර වට්ටම් වට්ටති කියන විදිහට පැහැදිලි කරගෙන ඇවිල්ලා, එතනදි මේ අපි දන්නෙ ඒ වචනෙට ගොඩක් ගෝචර වෙච්ච අදහස්. ඉතිං මං හිතනවා මෙන්න මේ කරුණු අපි ඉතාම සියුම් සලකා බැලිය යුතුයි ආර්යයන් වහන්සෙ. හැමදාම කරන දේශනාවල මේ සියලු කරුණු පැහැදිලි කරනවා.

මොකද මා හිතන්නෙ බුද්ධ කාලයේ ඒ දේශනා වෙචච විදර්ශනා ධූරය වර්ථමාන කාලයේ බුද්ධ දේශනාවට 2500ක් ගතවන කාලයේ ඔබ වහන්සේ අවබෝධ කරගෙන විදර්ශනා ධූරය තුළ අවබෝධය කළ දේශනා වීමට තමයි මේ ආශ්චර්යය ආර්යයන් වහන්ස. මට යොමු කරන්න අවශ්‍ය වෙච්ච ප්‍රශ්නය පැහැදිලි කර ගැනීමට ඇත්තටම ධර්ම කරුණු පැහැදිලි කිරීමේ දී මේක කෙලින්ම ඇවිල්ලා ශූන්‍යයයි කියලා කිව්වොත් බාහිර ලෝකයක් නෑ කියලා කිව්වොත්, නෑ කියල හිතන එක නෙවෙයි අවබෝධ කරගන්න ඕන දෙයක්. එතනදි ගැඹුරු පරියායක් තුළ ඇවිල්ලා තමයි ඒක විග්‍රහ කරන්නෙ. එතකොට ඊට අමතරව ඔය කලින් සඳහන් කර ඒ විග්‍රහයන් දෙකට අමතරව මට තව දැකපු විග්‍රහයක් තමයි ආර්යයන් වහන්සේගෙ පසුගිය දේශනාවක මනායතනය

හැදෙන ආකාරය. ආර්යයන් වහන්සේ එය විග්‍රහ කරේ ඇසට අසුවන සෙන්සර් එකට හසුවන කම්පනය උඩට පල්ලෙහාට නම්, කණට අපි හිතමු හසුවන්නෙ හරහට යන අංශු කම්පන නම් ඒ වගේම අපි හිතමු නාසයට දැනෙන්නේ මෙහෙම හරහා අතකට යන අංශු කම්පනයක් නම් මනායතනයේ දී මෙන්න මේ ඔක්කොම එකතු වෙච්ච අංශු කම්පනයක බලපෑමක්. ඒ කියන්නේ ඇත්තටම එතකොට අපිට පුටුව මැවෙනවා ගස මැවෙනවා ඒ වගේ ආකාරයක් ආර්යයන් වහන්ස සඳහන් කරා එතකොට මේකෙ දිගුවක් විදියට ගියොත් ආර්යයන් වහන්ස අභිධර්ම විග්‍රහයේ දී චිත්ත වීථිවලට ගියාම එක අරමුණක් දැන ගන්න අඩුම වශයෙන් චිත්තක්ෂන 17ක් වත් යන්න අවශ්‍යයයි කියලා මා කියවා තිබෙනවා. එතන දි 'භවාංග' 'භවාංගචලන' 'භවාංග' 'උපච්ඡේද' 'සම්පටිච්චන' 'සංතීරණ' වොත්ථපන' ආදි වශයෙන් ජවන් ජවන් 7ක් ගිහිල්ලා, එතකොට ආර්යයන් වහන්ස අර අංශු කම්පනයෙන් පැහැදිලි කරපු ඒ කරුණම නේද ආර්යයන් වහන්ස අර චිත්ත වීථියකින් පැහැදිලි වෙන්නේ කියන එකද ආර්යයන් වහන්ස ඒ අදහස හරිද සහ ඒ ගැන ඔබ වහන්සේගෙන් පැහැදිලි කර ගැනීමක් කරන්න.

**ආර්යයන් වහන්ස :** තෙරුවන් සරණයි. ඒකේ 'චිත්ත වීථි'වල පැහැදිලි කරන්නෙත් අපි දැන් මේ මොනවා කරත් කතා කරන්නෙ අරමුණක් ගැන නෙ. සිත ගැනයි කතා කරන්නෙ එතකොට මේ කතා කරන්නේ සූත්‍ර පිටකයේද අභිධර්ම පිටකයේ ද එහෙම කියලා ගත්තාට, එහෙම දෙයක් නෑ. මේ කතා කරන්නෙ අරමුණක් ගැන. ප්‍රායෝගික පැත්තට ආවාම මේ අරමුණම තමයි හිත කියන්නෙ. ප්‍රායෝගිකව අත් දකින්න තියෙන්නෙ 'ආරම්මණ' 'වර්ණ ආරම්මණ' 'ගන්ධ ආරම්මණ' 'රස ආරම්මණ' 'පොට්ඨබ්බ ආරම්මණ' අපි පංච ද්වාරාවර්ජන ආරම්මන කියන්නෙ ද්වාර පහෙන් එන ආරම්මණවලට. දැන් අපි ගත්තොත් එහෙම 'ස්කන්ධ' විග්‍රහය ගන්නෙත් ඕකම තමයි, ස්කන්ධ විග්‍රහය ගත්තත් රූප - වේදනා - සංඥා - සංඛාර - විඤ්ඤාණ. **ඔය රූප කියන කොට, ශබ්ද රූප, වර්ණ රූප, ගන්ධ රූප, රස රූප, පොට්ඨබ්බ රූප ඒත් එන්නෙ ඕකම තමයි. එතකොට වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ ඕකම තමයි, 'සම්පටිච්චන්න' 'සංතීරණ' 'වොත්ථපන' 'ජවන්' 'ජවන් ජවන් ජවන්' කියන්නෙ සංඛාරා ඔය එකම කතාව කියන්නෙ.**

**ඔය චිත්ත වීථියේ ස්කන්ධයේ කියලා දෙයක් නෑ සකන්ධයේ උදයවැය දැකීමයි නිවන් දකින්න තියෙන්නෙ. චිත්ත වීථිය කියන්නෙත් ස්කන්ධයම තමයි**. 'සම්පටිච්චන්න' 'සංතීරණ' 'වොත්ථපන' 'ජවන් ජවන් ජවන් ජවන්' කියන්නෙ වේදනා සංඥා සංඛාර කියන එක තමයි ජවන් ජවන් කියන්නෙ. වේදනා සංඥා තමයි සම්පටිච්චන සංතීරණ කියන්නෙ. වචන ටිකක් මාරු කරලා විතරයි.

**උපාසක :** එහෙමයි ආර්යයන් වහන්ස ඊට අමතරව ආර්යයන් වහන්ස ඉතාම සියුම් කරුණු භාග්‍යවතුන් වහන්සේගේ වෙසක් තෙමඟුල සිදුවන මාසය වෙසක් මාසයේ ඇත්තටම බුද්ධ කාලයෙන් පසුව ආව හොඳම වෙසක් මාසය කියලයි මට හිතෙන්නෙ. මොකද මේ රාත්‍රි දේශනාවල දේශනා වූ ඒ කරුණු එතරම්ම අතිවිශිෂ්ටයි. බුද්ධ කාලයෙ භාග්‍යවතුන් වහන්සේගෙ මුවින් දේශනා වූ ඒ කරුණු ම ඒ ආකාරයෙන් මේ කාලයට ගැලපෙන අයුරින්ම මං හිතන්නෙ ප්‍රති නිර්මාණය වෙනවා ඔබ වහන්සේ හරහා. ඉතිං එය අත් දැකපු කාරණාවක් පසු ගිය කාලවල්වල දී. එතකොට ආර්යයන් වහන්ස අර මජ්ජේ සූත්‍රය හරහා ඔබ වහන්සේ අංශු කම්පන නොවන ස්වභාවය සිහිය නම් අංශු කම්පනය වන ස්වභාවය සිතුවිලි කියන එක කිව්වා. එතනින් පස්සෙ ආර්යයන් වහන්සේ බුද්ධ ස්වභාවය මොකක්ද කියලා අහපු ප්‍රශ්නයට පිළිතුරක් ලබලා දුන්නා. ඒ අංශු දෙකක් අතර තියෙන හිඩස. ඊට අමතරව කලින් ප්‍රකාශ කර ආර්යයන් වහන්ස අංශුව කියලා දෙයකුත් නෑ කියලා. එසේ නම් ආර්යයන් වහන්ස බුද්ධ ස්වභාවය යනු අවකාශයයි කියලා කියපු තැන 'අඛොප්පා' අකම්පිත කිව්ව තැන ශූන්‍ය වූ ස්වභාවය ද ආර්යයන් වහන්ස පැහැදිලි කරන්නේ.

**ආර්යයන් වහන්ස :** තෙරුවන් සරණයි, ඒකෙ නම් ඔබ තුමාගෙ විග්‍රහය වැරදි ඒක එහෙම කියන්න ඕන. අංශු දෙකක් අතර හිඩස බුද්ධ ස්වභාවය කියන එක නෙවෙයි එක පැත්තක්, තව පැත්තකින් අංශු දෙකක් කියලා එහෙම එකක් නෑ. තව පැත්තකින් මේක ටිකක් ගැඹුරු විග්‍රහයක්, ඒ කියන්නේ 'බුද්ධ ස්වභාවය' කියලා කියන්නේ මේ කම්පනයක් කියලා කියන්නෙ සිතුවිලි. ඒ කම්පනය තමයි අපි මේ හැම දේකින්ම ඔය 'ශබ්ද වර්ණ ගන්ධ රස පහස' කියලා කම්පනය තමයි

අපි ඔය දන්නෙ. ඒ කියන්නේ මේක අර අංශුවේ විග්‍රහය ගන්නේ මේක වටහා ගැනීම සඳහා උපකල්පනයක් පමණයි. එහෙම අංශුමය කථාවක් මේකෙ නෑ. මේක ඇත්තටම අපි සාමාන්‍යයෙන් පඨවි ආපෝ තේජෝ වායෝ කියන කොට අපි කියනවා මේ 'අංශු' 'ඝණ' වෙලා අයිස් කැටේ හැදෙනවා. ඒ අංශු තව ටිකක් රත් උනොත් ද්‍රව වෙනවා. එතකොට ඒ අංශු ඈත් වෙනවා. එතකොට තවත් මේ අංශු රත්උනොත් වායු වෙනවා ඒ කියන්නේ තවත් ටිකක් රත් උනොත් වායු වෙලා වාෂ්ප වෙලා යනවානෙ. එතකොට පඨවි ආපෝ තේජෝ වායෝ මෙතන ගන්නවා 'රශ්මිය' හැබැයි ඕකෙ එක මට්ටමකට ඕක කාට හරි තේරුම් කරන්න මේක විග්‍රහ කරනවා. මෙතන එක්කො පඨවි ආපෝ තේජෝ වායෝ කියලා දේකුත් නෑ. **ඒකෙ එකම අංශු ටික ඝණ වූ අවස්ථාවට, ඒ ඝණ වන බලයට තමයි පඨවි කියන්නේ, අර ද්‍රව වන බලයට, ඒ කියන්නෙ ඒකට තමයි අපෝ කියන්නෙ. අර ද්‍රව රත් වුනොත් වෙන බලයට තමයි තේජෝ කියන්නෙ, රත් වෙලා වාෂ්ප වෙලා යනවා, ඒ ශක්තියට තමයි වායෝ කියන්නේ. එතකොට එහෙම ගත්තාම ඕක දැනෙන්නෙ ශක්තියක් විදියටයි.** ඊට පස්සෙ එතකොට අංශුමය ස්වභාවයක් නෑ ශක්තිමය ස්වභාවයක් කියලා ගන්නෙ. එතකොට එහෙම ගත්තොත් එහෙම දේකුත් නෑ මේකෙ. මේකෙ තියෙන්නෙ ඇත්තටම කම්පන වේගයකට සකස් වෙන එකක්.

කම්පන වේගයක් කියන්නෙ අංශුවක කථාවක් නෙවෙයි මේ. ඒක තමයි මේක ඩාක් මැටර්ස් ද 'ඩාක් එනර්ජි' ද කියන්නෙ. **'ඩාක් එනර්ජි' කිව්වොත් ශක්තියක් වෙනවා. ඩාක් මැටර්ස් කිව්වොත් අංශු වෙනවා.** නූතන විද්‍යාඥයෝ පවා මේකට ඩාර්ක් මැටර්ස් කියලා කියන්නෙත් නෑ. ඩාක් එනර්ජි කියලා කියන්නෙත් නෑ දෙකම නොකියා ඉන්නවා. ඒකට හේතුව නූතන විද්‍යාඥයා බොරුකාරයෙක්. මේක අර ගන්නේ බුද්ධ න්‍යායෙන් බුදුන් වහන්සේ එහෙම කිව්වෙ නෑ ඕකයි හේතුව. **බුදුන් වහන්සේ කිව්වෙ නෑ මේක අංශු කියලා කිව්වෙත් නෑ. මේක ශක්තිය කියලා කිව්වෙත් නෑ.** ඔබට කියා ගන්න බැරි කමට ඔබ කොහොමත් පරීක්ෂණාගාරක ඔප්පු කරලත් නෑ. **ඒක නිසා ඔබ බුදුන් වහන්සේගෙ බුද්ධ වචනෙන්ම කියන්න කියන්නෙ, මේක අංශුන් නෙවෙයි ඩාක් මැටර්ස් නෙවෙයි ඩාක් එනර්ජිත් නෙවෙයි.** මේක තියෙන්නේ මජ්ඣය

සූත්‍රයේ **බුදුන් වහන්සේ පෙන්වන නියාය ඇතුලේ අංශු කියලා දේකුත් නෑ. ශක්තිය කියලා දේකුත් නෑ.** මේකෙ තියෙන්නෙ වෙනස්ම පරියායක්. අපි හිතන අපේ සිතිවිලිවල ස්වභාවයට දෙයක් තියෙන්න ඕන. **මේ මනුස්සයාගේ සිතුවිලි ස්වභාවය වැඩ කරන්නෙ හැම තිස්සෙම දෙයක් කරගෙන. ඒක නිසා එක්කො අංශු තියෙන්න ඕන එක්කො ශක්තිය තියෙන්න ඕන.** මේක වෙනස් පර්‍යායක්. මේකෙ කිසිම දෙයක් නෑ.

මෙතන තියෙන්නෙ කම්පනයක් විතරයි. කම්පනයෙ මොනවද කියන එක අදාළත් නෑ. මුකුත් නැතත් මෙතන කම්පනයක් උනොත් මෙහෙම වෙනවා වගේ දෙයක් මේකෙ තියෙන්නෙ. නමුත් ඒක එක පාරටම කෙනෙකුට තේරෙන්නෙ නෑ. මෙතන 'එම්ටිනස්' කිව්වත් එක පාරටම තේරෙන්නෙ නෑ. මෙතන මුකුත්ම නැතුව මෙහෙම කොහොමද, මෙහෙම ඝණ වෙන දෙයකුත් නෑ එහෙම මෙතන අපිට කථා කරාට. අපේ මේ ඇස කණ දිව නාසය කය අපි ගත්තොත්, අපේ ඇස් දෙකට මැවෙන මේ වර්ණ කොහේවත් තියෙනවා නෙවෙයි. අපේ ඇස් දෙක නැත්නම් අන්ධයි කිව්වාම, අපි ඔය 'සෙන්සස්' ටික අයින් කරොත්, අපිට වර්ණ කතා නෑ ශබ්ද කතා නෑ ගන්ධ කතා නෑ රස කතා නෑ උණුසුම සීතල කතා නෑ සෙන්සස් ටික නැත්නම්. එතකොට ඔය කතා මොකක්ද කියලා අහන්න. ඔබ බාහිර අත් දැක්කොත් අපිට කියන්න. ඔය සෙන්සස් ටික නැතිව බාහිර අත්දකින හැටි කියන්න. නුවණින් හරි අත් දැකලා කියන්න. නුවණ මෙහෙයවලා හරි කියන්න මොකක්ද දැන් ඔබට දැනෙන්නෙ කියලා. මෙතන එහෙම දෙයක් නෙවෙයි. මේකෙ ඇත්ත කථාවක් තියෙනවා. නුවණට හසු වෙනවා ඔය මායා කතා නෙවෙයි. ඔය වර්ණ ශබ්ද කතා ඔක්කොම සිතුවිලි. සිතුවිලිවල ශබ්ද වර්ණ තියෙනවා, සිතුවිලි හැදිලා තියෙන්නෙ ඕවයින්. සිතුවිල්ලට අයිති නැති කතාවක් මේකෙ තියෙනවා.

**සිතුවිලි අභිබවා ගිය 'ඥානයට' හසුවෙන සත්‍ය, සිතිවිලිවලට කවදාවත් ගන්න බෑ. 'සත්‍ය ඥානයට' හසුවෙනවා, 'ඥනයට කියන්නෙ මේක සිහියට හසුවෙනවා.** සිහියට කියන්නෙ ඔබට දැනෙන දෙයක් තියෙනවා. හැබැයි ඔබට ඔය සිතුවිලිවලින් වැහිලා තියෙන තාක් කල් ඒක දැනෙන්නෙ නෑ. මෙතන තියෙන්නෙ මෙතන සැබෑවටම ඔබට දැනෙයි මෙතන තියෙන්නෙ එම්ටිනස් එක නතිං එක මොකක්ද කියලා.

ඔබ මේ ශබ්ද වර්ණ ගන්ධ රස වලින් වැහුණු ලෝකෙ ඔබට දැන් පේන දරුවො ගෙවල් දොරවල් ඔය අපි පැහැදිලි කරා 'විඤ්ඤාණයකටමයි නගරය මැවෙන්නෙ කියලා 'පාර මැවෙන්නෙ' විඤ්ඤාණයකට කියලා මේ එකක්වත් කොහේවත් නෑ කියලා, මේ විඤ්ඤාණයට මැවෙන එක 'මැටීරියල්' කියලා එහෙම දෙයකුත් නෑ. ඒවත් පවතින සාධක නෙවෙයි. එහෙම දෙයක් වත් නෑ. ඇත්තටම දැන් මේ විඤ්ඤාණ ටික ඇත්තටම දැන් මේ ලෝකෙ ජනගහය කෝටි දෙක අටසියයම මේ ඇස් කන් දිව නාසය 'පචං ආයතන' වලින්ම මේක දකිනවා මිසක් වෙන පරියායක් නෑ. මේ ආයතන ටික තියෙන අයට විතරයි මේකෙ මේ විදියට පේන්නෙ. ඕක ඔය විදියට පේන්නෙ ඔය ආයතන ටික වෙනස් උන අයට ඕක ඔය විදියට පේන්නෙ නෑ.

ඇත්තටම ගත්තොත් එහෙම අපේ විද්‍යාඥයෝ හදපු අර 'ෆොටෝ' ගහන මැෂින් එකට මුලින්ම දැම්මෙ රෙද්දක්. එක ෆොටෝ එකයි ගත්තෙ. ඊට පස්සේ රීල් එකක් දැම්මා. ඊට පස්සෙ ෆොටෝ ගොඩක් ගත්තා. ඕක 'ෆීචර්ස්' ගැන වැඩි කරලා දියුණු කරලා හැදුවා. අපි මේක කිව්වා මීට කලින්. අන්තිමට 'එක්ස් රේ' කිරණක් වගේ අර ඇටසැකිල්ලක් වගේ වැහුනා. ඊට පස්සෙ ඊටත් වැඩිය දියුණු කරා ඕක 'ෆීචර්ස්' ගැන දියුණු කරාම ගත්ත 'ෆොටෝ' එකේ මුකුත් නෑ. මේක නොබෙල් ත්‍යාගයට දැම්මාම දෙන්නෙ නෑ. ඇයි ඒ සාධකයක් නෑ පෙන්වන්න ගත්ත ෆොටෝ එක. ගත්ත ෆොටෝ එකේ මුකුත් නෑ. හැබැයි විද්‍යාඥයාට වැරදිලා නෙවෙයි. ඒ විද්‍යාඥයාට හරි ෆීචර්ස් ගාන වැඩි කරලා වැඩි කරලා ෆොටෝ එක නිර්මාණය කරන කොට අන්තිමට ගත්ත ෆොටෝ එකේ මුකුත් නෑ. මේකෙ තේරුම අපේ ඉන්ද්‍රියට මේ කම්පනය අහු වෙන මට්ටම විතරයි මේ පේන්නෙ. හැබැයි මීට වැඩිය දියුණු ඉන්ද්‍රියන් සකස් කරොත් ඔය පේන ගොඩනැගිලිවත් පෙන්නෙ නෑ. ඇත්තම කිව්වොත් ඔය අපි කථා කරන ලෝකය බොරුවක්. මේක අපේම මේ ආයතන ටික රවට්ට ගන්න එකක්. මේ ආයතනවල මේ කන්සෙප්ට් එක ඇතුලෙ අපි ඉන්නෙ අපි ඉන්නේ මේ ෆැන්ටසියක් ඇතුලේ. මේක මේ මෙතන මේ මේ විශාල ෆැන්ටසියක් මේ මායාවක් මේක මේ දේශනාවලින් මේක ඔප්පු වෙනවා. පැහැදිලි කරන හැම තැනකින්ම මේක ඔප්පු වෙනවා.

**මෙතනදි අංශු දෙකක් අතර ගැප් එකේ බුද්ධ ස්වභාවය කිව්වොත් වරදින්න හේතුව මේකයි. දැන් මේ අංශුවක් අතර කම්පනය වෙන කොටත් ගැප් එකක් තියෙනවා නෙ, එතකොට එතන තියෙනනෙ අර ආරෝපණ බලයනෙ. එතකොට ආරෝපණ බලනේ අපේ මේ 'වේව්' එක.** එතකොට අංශු දෙකක් අතර ගත්තොත් කොයි පැත්තකට ගත්තත් අංශු දෙකක්, ආ මේක තියෙන්නෙ මේකට කම්පනය විතරයි අරකට කම්පනය නෑ එහෙම එකක් නෑ. මේ හැම තැනම බ්‍රිලියන්, ට්‍රිලියන් ගානක මේ ස්වභාවයක් මේකෙ කම්පන ස්භාවයකට මේ මේ සේරම එකක්වත් තියෙනවනෙ මේ. සේරම තියෙන්නෙ කම්පන ස්වභාවයන්, කම්පන ස්වභාවයක් නැති ස්වභාවයක් කියන්නෙ එහෙම ස්වභාවයක් ඔබට අත්දකින්න බෑ. හැබැයි මේක අපි උපකල්පනයක් විදියට ගත්තොත් අංශු දෙකක් අතර හිඩසක් කිව්වොත් වරදිනවා. හැබැයි මෙතන අංශුවක් නැති ස්වභාවයක් කිව්වොත් බුද්ධ ස්වභාවය කිව්වොත් හරි මෙතන ආරෝපනයක් තියෙන කිසිම තැනක බුද්ධ ස්වභාවයක් නෑ, හැබැයි ආරෝපනයක් නැති තැන 'බුද්ධ ස්වභාවයක්' තියෙනවා.

හැබැයි මෙතන අංශුවක් නෑ කියලා කිව්වේ අංශුවක් තියෙනවා කියලා කිව්වෙ අංශුව නිරූපනය කරේ හැම තිස්සෙම දෙයක් වගේ දැනෙන ස්වභාවයක්. දෙයක් වගේ දැනෙන ස්වභාවයක් නිසා තමයි 'එන්ටැන්ග්ල්මන්ට්' එකත් දෙයක් වගේ කිව්වෙ. ඒක නිසා තමයි මුළු විශ්වයේම පවතින ඒ ස්වභාවයත් තියෙනවා කියන චිත්ත ස්වභාවයක් අර අංශුවක් වගේ ස්වබාවයක්, ඒ ස්වභාවය තුළ අර එන්ටැන්ග්ල්මන්ට් එකේ කතාවෙ තේරුම බුදුන් වහන්සේ පෙන්වනවා මේ කවදාම හරි මෙතනත් කම්පන, දෙයක් වෙනවා කියලා. ඒකට හේතු මෙන්න මෙහෙම කතාවක්. **මේ කම්පනය නොඑන තාක්කල් උප්පත්තියක් කතා කරන්න බෑ. කම්පනය උනොත් උප්පත්තිය කතා කරන්න හැකියාව තියෙන්නෙ.** එතකොට උප්පත්තිය ඇසේ උප්පත්තියද, කණේ උප්පත්තියද මේ සෙන්සස්වල උප්පත්තිය ඕන එකක් ඒවා පස්සෙ විග්‍රහ කරන්න පුළුවන්. ඒවා විග්‍රහ වෙනමම තියෙනවා. මෙතන අපි කතා කරන්නේ කම්පනයක් උනොත් උප්පත්තියක් තියෙනවා. දැන් එන්ටැන්ග්ල්මන්ට් එකේ කම්පනයක් තියෙනවා. ඒක සදාතනික කතාවක් නෙවෙයි බුදුන් වහන්සේ ඕක ඔප්පු කරා.

බුදුන් වහන්සේ කියන්නෙ ඔබ විශ්වයේ, ඒ විශ්ව ශක්තියට එකතු වෙලා හිටියත් දවසක උපදිනවා. ඒකට හේතුව කම්පනයක් සකස් උන ගමන්ම ඔබ සකස් වෙනවා. ඒකට හේතුව අංශුව තියෙනවා කියන ස්වභාවය තමයි ඔය පෙන්වන්නෙ එන්ලයින්මන්ට් එකේ ස්වභාවය. එන්ලයින්මන්ට් එක ගිහිල්ලා නැවතුනා නොවේ. එතනත් කම්පන ස්වභාවයක් තියෙනවා කියන එකයි. හැබැයි **බුද්ධ ස්වභාවය කියන්නෙ ඒකෙ ආරෝපනයක් කම්පනයක් නැති අංශුමය ස්වභාවයක් නැති ස්වභාවයක් නිරූපනයක් නෑ කියන එකයි. එතන පහන නිවී ගියා, ගිය තැනක් නෑ කිව්වෙත් ඒකයි.** මේක මේ අපි කතා කරන දේ වැඩි කාලයක් නොගිහින් මේ නූතන තාක්ෂණයත් එක්කලා බද්ධ වෙලා වෙනස් විදියකට ලෝකෙට එළිවෙනවා. මේක කවුරුත් දැම්ම නොහිතාවි. නමුත් ඉදිරියේ දී ඔබෙ, ඔබේ මේ දුරකතනය නොවේ ඉදිරියේ දී නිර්මාණය වෙන්නෙ. ඔබ දැනට ඔබ පාවිච්චි කරන්නෙ 'හෑන්ඩ් ෆොන්' එක, නමුත් ඉදිරියේ දී ඔබේ මේ නියුරොටික් සිස්ටම් එක හරහා මේක දැනට අපිට කියන්න පුළුවන් කරන්න ඕන ක්‍රමයක් කියන්න පුළුවන්. මේ ඔබ සිතන සිතුවිල්ල අනිත් පැත්තට යනවා හිතපු සැනින් යනවා. ඔබ දුරකථන අංකයක් අරගෙන ෆෝන් එකක් අරගෙන ගන්න ඕනෙ නැහැ. මේ සිස්ටම් එක ආර්යයන් වහන්සේට කියන්න පුළුවන්. ඔබ හිතන සැනින් අනිත් පැත්තට කෝල් එක යනවා. ඒ පැත්තට මුකුත් අංකයක් අවශ්‍ය නෑ. ඒ පැත්තට කෝල් එක එනවා ඒ පැත්ත දන්නවා මේ කිව්වෙ මොකක්ද කියලා. මේ සිස්ටම් එක ඉදිරියේ දි හැදෙනවා.

හැබැයි මීට කලින් අතර මැද සිස්ටම් එකක් හැදෙනවා. ඒකටත් කලින් නව සිස්ටම් එකක් මේ මෑතකදී හැදෙනවා තව අවුරුදු 50ක් යන්න කලින්. ඒක තමයි ඔබ පච්චයක් කොටනවා වගේ එකක් ඔබේ අතේ කොටනවා පොඩි දෙයක් කරන්නෙ. ඒක ටච් කරපු ගමන් අනිත් පැත්තට යනවා මැසේජ් එක. මේකෙ තියෙන්නෙ මේ අමුතුවෙන් ෆෝන් අවශ්‍ය නෑ. මේ සෙන්සර් සිස්ටම් එකක් තියෙන්නෙ. මේ සෙන්සර් සිස්ටම් එක ෆ්‍රීකොන්ස් සිස්ටම් එකක්.

මේ අපේ සිත ෆ්‍රීක්වන්ස් එකක් මේක තරංගයක්. මේක හඳුනා ගන්න විතරයි ඕනෙ විද්‍යාඥයන්ට. විද්‍යාඥයෝ දැනටමත් හඳුනාගෙන තියෙන

බවක් අපිට පෙනුන හරියටම ඉන්ඩිකේට් කරලා නෑ. මේක හරියට ටච් කරපු ගමන් අනිත් පැත්තට ඒ ෆ්‍රීක්වන්ස් එක ගන්න පුළුවන්. අනිත් පැත්තට ෆ්‍රීක්වන්ස් එක යවන්න පුළුවන් සිස්ටම් එකක් හදන්න පුළුවන්. දැනට අපි මේක කරන්නෙ ෆෝන් එකට අංශු කම්පන කරලා අනිත් පැත්තට ඒ කම්පනය දෙනවා අංකයක් විදියට. දීලා ඒ පැත්තෙන් කෝල් එක ආන්සර් කරනවා. නමුත් ඒක නෙමේ මේක කරන්න පුළුවන් ඊට වැඩිය සියුම්ව ඉස්සරහට කරයි. නියුරොමික්ස් සිස්ටම් එකෙන් කරන්න පුළුවන් ඉස්සරහට කරයි. පච්චයක් කොටලා කරන්න පුළුවන්, 'පච්ච සෙන්සස්' සිස්ටම් එක ඉන්ඩිකේට් කරන්න පුළුවන්. මේක ඉස්සරහට එක අදියරයකට කරයි. ඊට පස්සෙ තව අදියරයක් ලෝකෙ හැදෙයි. ආර්යයන් වහන්සේගෙ දේශනා ඒකට ඉවහල් වෙයි. ඉස්සරහට ඒවා ආර්යයන් වහන්සේ කතා කරවි. කොහොමද මේ 'කම්පන සිස්ටම්' වෙනස් කරන්නෙ කියලා. මේකෙ පුදුමාකාර කතාවක් තියෙනවා දිග හරින්න. මේ කතාව ඇත්ත කතාවක්. මේ කතාව බොරු කතාවක් නෙමේ. මේ ඇයි ඉපදෙන හැටි පවා කියන්න පුළුවන්. මේක ඇඟ හිරිවැටිලා යන කතාවක්. අපි මොකද මේක සංකීර්ණ වෙනවා.

***උපාසක* :** අවසරයි ආර්යයන් වහන්ස. ආර්යයන් වහන්ස කිව්වා වගේ මේ කම්පන ශක්තිය මට ඇහෙනවා ආර්යයන් වහන්ස. ඒ කියන්නෙ අර්යයන් වහන්ස වචනයක් පාසා කියන කොට නිකන් ශරීරයට ඒ දේ දැනෙන තත්ත්වයක් පත්වෙලා තියෙනවා ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්ස :** මේකෙ 'ෆ්‍රීක්වන්ස් සිස්ටම්' එකක් තියෙනවා, මම ඔබ තුමා එහෙම කියපු නිසා තව චුට්ටක් ඉස්සරහට කියන්නම්. දස දහසක් ලෝක ධාතුව මේ බුද්ධ වචනයක් තියෙනවා, **මොකක්ද මේ දස දහසක් ලෝක ධාතුව. මේ දස දහසක් ලෝක ධාතුව මේ ලෝකෙ එලියෙ තියෙන ලෝකයක් නෙවෙයි. මේ ලොකේ සකස් වෙන්නෙ විඤ්ඤාණ මායාවෙන්.** මේ ලෝකෙ ජනගහනය කෝටි අටසිය නම් කෝටි අටසියම ලෝක කෝටි අටසියයක් තියෙනවා. මේ ලෝක කෝටි අටසියයෙ දැන් මෙතන ෆ්‍රීක්වන්ස් එකක් තියෙන්නෙ. මේ ලෝක කෝටි අටසියෙම ලෝක කෝටි අටසීයට ෆ්‍රීක්වන්ස් කෝටි අටසියයක් තියෙනවා. මේ ෆ්‍රීක්වන්ස් කෝටි අටසියය මේ පැත්තෙ ඒ හැම එකකම කම්පන අංශු තියෙන්නෙ.

අංශු කම්පනය කියලා ගත්තාම මේක ලේසියෙන් තේරෙනවා. මේ පැත්තෙ මෙතන ටියුන් කරන කොට මේක නිකන් අර අපි රේඩියෝ නාලිකාව අල්ලනවා වගේ මෙතන කම්පන සිස්ටම් එක අඩුකරලා අඩුකරලා අඩුකරලා අඩුකරලා අඩුකරලා අඩුකරලා පෙන්වනවා. ඊට පස්සෙ දැන් මේක නාලිකාව අහන් ඉන්න අයගෙ හැමෝගෙම අර විඤ්ඤාණය ගැන කතා කරන අර සිස්ටම් එක සකස් වෙන සිස්ටම් එක කම්පන සිස්ටම් එක අඩුවෙලා අඩුවෙලා - අඩුවෙලා - අඩුවෙලා - අඩුවෙලා ශූන්‍යතාවයට එනවා.

එතකොට **ආර්යයන් වහන්සේ ශූන්‍යතාවය මෙතන ශූන්‍ය කරලා තිබ්බොත්, ඒ ශූන්‍යතාවය ටියුන් කරොත් අර ඔක්කොටම ශූන්‍යතාවය ටියුන් වෙනවා. එතකොට ඒ ඔක්කොම මේ දේශනා අහන, හැමෝගෙම අර 'අභ්‍යන්තර කම්පන ස්වභාවය' 'ලෝක ස්වභාවයෙන් මිදිලා' 'රූප ස්වභාවයෙන් මිදිලා' 'අරූප ස්වභාවයෙන් මිදිලා' අර නිර්වාණයට ලං වෙන 'ශූන්‍යතාවයට' ටියුන් වෙනවා.** මේකට කියන්නෙ ලෝකෙ කුඩු වෙලා යනවා කියනවා ලෝකයේ, 'ලෝකවිදූ' කියන තැනට එනවා. දැන් ලෝකෙන් මිදෙන තැනට යනවා. භව නිරෝධයට එනවා. මේක තමයි 'දස දහසක් ලෝක ධාතුව' කම්පා කරමින් අන්න මගඵල ලබන ආකාරය 'බුද්ධ ආඥාව' මේ බුද්ධ ආඥාව මේ මොහොතෙ සිද්ධ වෙනවා. මේ මොහෙතෙ මේ යූ ටියුබ් නාලිකාව ඔස්සේ මේ විකාශනය වන මේ විකාශනය වන අහන් ඉන්න අයගෙ කම්පන සුසර වීමක් සිද්ධ වෙනවා. ඒ අයගෙ ලෝකය තියෙනවා කියලා බැස ගන්න දේවල් කුඩු වෙලා කුඩු වෙලා කුඩු වෙලා යනවා. **ආර්යයන් වහන්සේ කුඩු වෙන්නම ගහනවා. කුඩුවෙන්නම ගහනවා, විඤ්ඤාණ ධාතුවල බැසගෙන තියෙන 'කම්පන සිස්ටම්' එක ඇකිලිලාම යන්න ගහනවා. වියලිලාම යන්න ගහනවා. වැලි මිරිකලාම යන්නට ගහනවා මුළු ලෝක ධාතුවේම තියෙන මනුෂ්‍ය ශරීරවල තියෙන කම්පන විඤ්ඤාණ ධාතුවල තියෙන කම්පන සිස්ටම් එක ශූන්‍ය වෙලා ගිහිල්ලා බුද්ධ ස්වභාවයටම අවධි වෙන්න ගහනව** පුළුවන් නම් නවත්තන්න. මේ කට්ටිය කිසිම කෙනෙක් නැවත 'සුසර' වෙන්න නැත ෆ්‍රීක්වන්ස් සකස් වෙන සිස්ටම් එකට එන්නෙ නෑ. සත්ව කළලවල සකස් වෙන්නවත් දුගතියකට වැටෙන්නවත් සිද්ධ වෙන්නෙ නෑ 'සුචි සුද්ධං' වෙනවා.

මේක බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේගෙ බුද්ධ ආඥාව, මේක සිද්ධ වෙනවා. ඕස්ට්‍රේලියාවල ඉන්ග්ලන්ඩ්වල කැනඩාව ප්‍රංශය අපිට විශාල පිරිසක් දුරකතන ඇමතුම් දීලා කියනවා ආර්යයන් වහන්සේගෙ දේශනා අහන් හිටියා ඇඟ හිරිවැටිලා ගියා කියලා අපට හිතා ගන්න බෑ මොකක්ද උනේ කියලා. මේ ජේන එවත් කිසිම ඕන කමක් නෑ, කිසිම දේක කිසි අගයක් නෑ ආර්යයන් වහන්ස මොකක්ද උනේ කියලා. දේශනය අහන එකයි කරලා තියෙන්නෙ. වෙලා තියෙන්නෙ මොකක්ද අභ්‍යන්තර 'කම්පන සිස්ටම්' එක සම්පූර්ණ 'සීරෝ' වෙලා. ඒ ගොල්ලො නිවන දකින එක නවත්තන්න කාටද පුළුවන්. දස දහසක් ලෝක ධාතුව කම්පා වෙලා ඉවරයි බුද්ධ ස්වභාවයට අවදිවෙලා ඉවරයි. ගෞතම බුද්ධ සාසනයේ නැවත පිබිදීම සම්පූර්ණ වෙලා ඉවරයි.

**උපාසක :** සත්‍යයි පවසන්නේ ආර්යයන් වහන්ස

**ආර්යයන් වහන්ස :** බලන්න අපේ මේවා එකේ දේශනාවල තියෙන ඒවා ගන්න ඒවා සාක්ෂි දරනවා. බැංකුවක මැනේජර් කෙනෙක් කතා කරනවා මුළු ඇඟම හිරිවැටිලා ගියා. සමහර අයට ඉන්න තැනම චූ යනවා මේ ඇත්ත කතාව කියන්නෙ. සමහර අයට කරන්ට් එක වැදිලා වගේ හිතා ගන්න බැරි වෙනවා. අර අනුසෝතය තුළ ලෝකයක් තියෙනවා කියලා බැස ගත්ත ඒ ලෝක සංඥාව කුඩු වෙලා ගියාට පස්සෙ එයාට මේ ලෝකෙ නෑ, ආයතනවල නිරෝධය වෙලා ඉවරයි. ඊට පස්සෙ එක මොහොතක හරි එයා ඒ කම්පනය දැකලා ඉවරයි. නිවන් නොදැක්කොත් තමයි පුදුමේ. ඒ කිසි කෙනෙක් නැවත පෘතග්ජන කරන්න බෑ. බුද්ධොත්පාද ආර්යයන් වහන්සේ කියන්නෙ පුද්ගලයෙක් නෙවෙයි, බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ කියන්නෙ මනුස්සයෙක් නෙවෙයි. බුද්ධොත්පාද ආර්යයන් වහන්සේ ඒක ඔප්පු කරනවා. අර උපක අහපු ප්‍රශ්නය ස්වාමීනි ඔබ මනුස්සයෙක්ද? නෑ. ස්වාමීනි ඔබ දෙවියෙක් ද? ස්වාමීනි ඔබ බ්‍රහ්මයෙක් ද? සත්ව පුද්ගලයෙක් නෑ. බුද්ධ ස්වභාවය තව පැත්තකින් බැලුවොත් සියලු ලෝක ටික කුඩු කරනවා. මේ බුද්ධ ස්වභාවය මේ ලෝක ස්වභාවයේ අපි කතා කරන්නේ සේරම සංඛතන් කියලා. නමුත් අසංඛත එකම නිර්වාණය කියන්නේ මේක තමයි ඇත්ත කතාව. මේ ඔබ කල්පයක් හිටියත් වැඩක් මේ සත්‍ය එක මොහොතක් නොදැක.

හැබැයි ඔබට මේ මොහොතත් මේ ලැබිලා තියෙන අවස්ථාවත් මඟ හැරුනොත්, ඔබ දන්නෙ නෑ ඉතුරු කතාව. ඒක ආර්යයන් වහන්සේ දන්නවා. අන්න ඒ නිසා ආර්යයන් වහන්ස දිවි හිමියෙන් කන්න නැතත් ඒත් අපි එක දේශනයක් වත් අඩු කරලා නෑ. ඇයි ඒ අපේ යුතුකම තියෙන්නෙ මනුස්ස කතාවක් නෙවෙයි මේක මනුස්ස සිත්වල මනුස්ස ශරීරවල තියෙන කතාවක් නෙවෙයි. අපිට ඒ කතාව ඉවරයි. මේ ශබ්ද ගන්ධ රස පහස කතා අපිට වැඩක් නෑ. අපිට තියෙනවා නේද වෙනම පරියායක්. මේකෙ සත්‍ය දැනෙනවා නේද? එතකොට අපිට මේ බොළඳ ලෝකයේ ඇති මේ වර්ණ ශබ්ද අල්ල ගන්න මේ වර්ණ ටිකයි ශබ්ද ටිකයි ගන්ධ ටිකයි පහස ටිකයි මේව තියන ඒවද කොහේවත් නෑනෙ. මේවත් අර කම්පනවලින් මවා ගන්න බොළඳ ටිකක් විතරයි. මෙටීරියල් වර්ල්ඩ් එකක් විතරයි. එහෙම එකක් නැනෙ කොහේවත්, කොහේවත් නෑ මේකෙ සත්‍ය දැක්කොත්. ඔබ මේ මිනිස් සිත අභිබවා ගිහිල්ලා මුණි ස්වභාවයක් එනවා, ඒ මුණි ස්වභාවය තියෙන්නෙ කම්පනය විතරයි. මේ කම්පන ස්වභාවයේ ඔබ සුසර වෙනවා. ඔබ ඊට පස්සෙ ඒකත් අභිබවා ගෙන ගිහිල්ලා බුද්ධ ස්වභාවයට අවධි වෙනවා. ඊට පස්සෙ ඔබේ කම්පන සුසරතාවයක් නෑ. ඔබ ඊට පස්සෙ බුද්ධ ස්වභාවයට අවදි වුණාට පස්සෙ ඔය කතා එකක්වත් වැඩක් නෑ හිටියත් එකයි නැතත් එකයි. ඔබේ යුතුකම ඔබ කරනවා පමණයි. මේ අවස්ථාව හැමෝටම නැති වෙන්න පුළුවන්. නමුත් අපිට එහෙමම කියන්න බෑ. මොකද ඒක මේ ස්වභාවය මේ යුගයේ මේ ඔබ හිතනවට වැඩිය වෙනස් කථාවක්. මනුස්ස සිතුවිලිවලට හිතන්න බැරි කතාවක් මේකෙ යට තියෙනවා.

**උපාසක :** එහෙමයි ආර්යයන් වහන්ස සම්පූර්ණ සත්‍යයක් පැවසුවෙ. ආර්යයන් වහන්ස, හේතුඵලවාදයක් තමයි භාග්‍යවතුන් වහන්සේ දේශනා කරේ. හේතු ආයතන නම් ඵලය ආත්මයයි. ආයතනවල මුලාව ආර්යයන් වහන්සේ පැහැදිලි කළ ඒ කම්පන ස්වභාවය අප වරදවා වටහා ගැනීම තුළ හේතු නිරුද්ධ වීම තුළ ඵලය නිරුද්ධවීමක් කියලා ඒ විදියට හිතුවොත් සහ ආර්යයන් වහන්සේ ආපහු නැවත නැවත ප්‍රකාශ කරපු 'පහනෙ තෙලුත් ඉවර නම් තිරත් ඉවර නම් පන නිවී ගියාසේ' කියන එකත් එක්ක ඔය කරුණු දෙක සම්බන්ධ වෙන්නෙත්. ආර්යයන් වහන්ස අර විස්තර කරපු පර්යාය තුළින් පැහැදිලි කරන ඒ ක්‍රියාවලිය

දැක්කාම අවිද්‍යාව දුරුවීම තුළ අංශුවක් වත් නොමැති ස්වභාවය කියන ඒ විදියට ඇහුවොතින් ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්ස :** තෙරුවන් සරණයි. මේ මෙතන මේ අපි ගත්තොත් එහෙම විද්‍යුත් ආරෝපන කියන කොට මෙතන තියෙන්නෙ අපි කතා කරන්නෙ ඉලෙක්ට්‍රෝන ප්‍රෝටෝන. එතකොට අපිට විද්‍යුත් ආරෝපන වගේ නෙවෙයි චුම්බක ආරෝපන කියන කොට. චුම්බක ආරෝපන කියන කොට මෙතන, අපිට තියෙන්නෙ අර ආකර්ෂන චුම්බක ආකර්ශන එතකොට ඒවා. අපේ මේ දෙකම වගේ නෙවෙයි චිත්තාරෝපන කියන කොට. මේ ආරෝපන බල උනාට, එකකට එකක් සමාන නෑ. මේ ආරෝපන බල තමයි මේවා එකකට එකක් සමාන නෑ. චිත්තාරෝපන බලවල ස්වභාවය ශබ්ද වර්ණ ගන්ධ රස පහස ඒ කියන්නෙ මේ චිත්ත ස්වභාවය. චිත්ත ස්වභාවය අවසානයේ බලගන්වා තියෙන්නෙ. ඔබ මේ චිත්ත ස්වභාවයකින් මේක බල ගැන්වෙලා තියෙනවා. 'ඉත්ථ' ඔබේ සිතුවිල්ල මෙතනදි බල ගැන්වෙලා ඔබේ අර දැනෙන ස්වභාවය, දැන් අපි ගත්තොත් එහෙම දැන් අපිට මොනා හරි දැන් අපිට බඩගින්නක් ආවා. බඩ ඇතුල බලන්න එතකොට කවුරු හරි කියනවා පුතේ ඕක බඩගින්න කියලා. ඉතින් ඕක තමයි බඩගින්න. දැන් බඩගින්න කියන්නෙ මොකක්ද, බඩගින්න කියන එකට පිච්චෙන ස්වභාවය අපිට එනවා. ඒකත් රූපයක් තමයි, ඒකට අන්න ශබ්දයක් එනවා. ශබ්දයක් කියන්නෙ කම්පනයක්, මේක කොහෙටද දාලා තියෙන්නෙ දාලා තියෙන්නෙ අර දැනෙන සංඥාවට. **දැනෙන සංඥාවට දැනගන්නෙ මොකක්ද ශබ්ද වර්ණ දෙකක් තියෙනවා ඒක තමයි මේ බඩගින්න කියන එක.** බඩගින්න කියන එකට ශබ්දයක් දාලා තියෙනවා. අර සංඥා ස්වභාවයට. එතන රූප සංඥාවකුත් තියෙනවා. අර ගින්න තියෙන්නෙ රූප සංඥාවට. එතකොට ඒකට තමයි අපි දැන් බඩගින්න කියන එක කිව්ව ගමන් අප එන්නෙ ආ මේක තමයි බඩගින්න දැන් කන්න ඕන. ඒ වගේ ඔතන රූපයකුත් එනවා.

එතකොට ඒ වගේ දැන් මෙතන අපි ශබ්ද රූප, වර්ණ රූප, ගන්ධ රූප, රස රූප, පොට්ඨබ්බ රූප කියන්නෙ, මේ කම්පන රූපවලට රුප්පන, රුප්පන කියන්නෙ මේක හැම පැත්තෙන්ම තියෙන එකක්.

දැන් උණුසුම සීතල ගත්තත් ඒකෙන් තියෙන්නෙ කම්පන. ඒකෙන් තියෙන්නෙ රූප්පන, ඒකෙන් තියෙන්නෙ දෙයක් වගේ දැනෙන ගතියක්. ශබ්ද දෙයක් ද නැහැ, වර්ණ දෙයක් ද නැහැ, ගඳ දෙයක් ද නැහැ. එතකොට ඉන්නවා වගේ දැනෙන එක කොහෙන්ද එන්නෙ, මේ සේරමවල කම්පනවල එකතුවෙන් තමයි ඉන්නවා වගේ දැනෙන එක එන්නෙ. එතකොට ඉන්නවා වගේ දැනෙන එක ඔය එකක් වත් නොවෙයි. එතකොට ඒක ශබ්දත් නෙවෙද, හේතුව ගත්තොත් එන්නෙ කම්පනයක්, කම්පනයක් උනාට අපේ ඵලය වර්ණයක්. එතකොට හේතුඵල. **එතකොට හේතුව ඇවිල්ල කම්පනයක්. ඵලය ශබ්දයක්.** එතකොට ඒ විදියටම ගත්තොත් අර අනිත් ඒවත් එහෙමම තමයි. එතකොට හැම තිස්සෙම දැන් **ඵලය අපිට දීලා තියෙන්නෙ මොකක්ද? වර්ණ ශබ්ද ගන්ධ ඊට පස්සෙ ආයි ඒක හේතුව වෙලා වර්ණ, ශබ්ද, ඵලය එතකොට දෙයක් වෙලා. ඒ කියන්නෙ පුටුව මේසෙ දැන් ශබ්ද වර්ණ නෙවෙයි පුටුව මේසෙ ලෝක සංඥා, එතකොට ලෝක සංඥා ඵලය වෙලා, හේතුව ශබ්ද වර්ණ වෙලා** හේතුව සළායතන ඵලය එතකොට ඊට පස්සෙ දැන් අපි බැලුවොත් එහෙම දැන් එතකොට පුටු මේස අම්මා තාත්තා නෙවෙයිනෙ ඒක හේතුව එකේ ඵලය ඊට පස්සෙ එකෙත් ඒ දේවල් තියෙනවා 'ඉත්ථි සංඥාව'.

ඒ දේවල් තියෙන ඉත්ත සංඥාවක් එනවා, ඒ දේවල් තියෙනවා වගේ ඉත්ත සංඥාවක් එනවා. අන්න 'සත්ව සංඥාව' 'ඉත්ථි සංඥාව' ආත්මය කියන එක. එතකොට ඒක තමයි 'ඉත්ථි සංඥාව' තියෙනවා වගෙ දැනෙන. එතකොට තියෙනවා වගේ දැනෙන එක ආයෙ හේතු වෙනවා. ඊට පස්සෙ ඒක නැවත නැවත වෙන කොට ඒක බල ගැන්වෙන කොට කම්පනය වෙන කොට ඒකෙ ඵලය ආ ආ ඒක තියෙනවා නම් මාත් ඉන්නවා ආත්මයක් එනවා. ආත්මීය ආරෝපනය. එතකොට අන්තිම ඵලය මොකක්ද? අන්තිම ඵලය ආත්මීය ආත්මය කොහෙද තියෙන්නෙ දැන් ආත්මය ආයෙ දැන් කොහෙද තියෙන්නෙ කියල ඇහුවාම අපිට ගන්න වෙන්නෙ ආයි අරමුණමයි සිතමයි. එතකොට ආයි අරමුණමයි සිතමයි කියලා ගන්න කොට අන්න ආයි යන්න වෙන්නෙ ශබ්ද වර්ණවලට, දැන් හේතුව 'ශබ්ද වර්ණ', දැන් ඵලය ආත්මය. අර ඔක්කොම පඩි පෙළ වගෙ දැක්ක කෙනෙකුට විතරයි පේන්නෙ ආ මේ ඔක්කොම ඇවිල්ලා

ආත්මයනෙ හැදිලා තියෙන්නෙ. අන්තිමට ආත්මය කියලා නෑ. ශබ්ද වර්ණ නේ ආත්මය කියන්නෙ. අර ආත්මය කියන්නෙ ශබ්ද වර්ණ, ඕක දැන් දැක්ක ගමන් ආත්මය කෝ සිතුවිල්ල ශබ්ද වර්ණ කියන්නෙ.

සිතුවිල්ලමයි ආත්මය, දැන් ආත්මය කෝ. සිතුවිල්ල, සිතුවිල්ල දෙයක් නෑ. මේ සිතුවිල්ල බලය පවර් එක නැතිවෙනවා. මේක තමයි අර කම්පනයෙ තියෙන අර ආත්මීය අපට මේ ආත්මය තියෙනවා කියන අන්න ඒ කම්පනය අන්න එතනින් තමයි සුනු විසුනු වෙලා යන්නෙ. එතනින් තමයි මේක ක්‍ෂය ධම්මා වය ධම්මා කියන තැනට එන්නෙ. මේ එතනින් තමයි අර ආත්ම සංඥාව දුරු වෙන්නෙ. ඒ ආත්ම සංඥාව කුඩු උනු ගමන්, ආත්ම සංඥාව දැනෙන්නෙ නෑ කියන්නෙ. මැරිලා ඉවරයි. මොකක්ද මරණය, කොහෙද මරණයක් තියෙන්නෙ. මරණය කියන්නෙ ශබ්ද වර්ණ ඇත්තටම ඔබ මේක ප්‍රායෝගිකව අත් දැක්කොත් ඔබට ඔබ ඉන්නවා දැනෙන්නෙ නෑ. ඔබ මේක අත් දැකලා නෑ තාම ඔබ පරිවර්තනය වෙලා නෑ. ඔබ අභ්‍යන්තර පරිවර්තනයකට ලක් වෙලා නෑ කිව්වෙ ඒ නිසා. ඔබ අභ්‍යන්තර පරිවර්තනයකට ලක් උනොත්, මොකක්ද අභ්‍යන්තර පරිවර්තනය කියන්නෙ. ඉන්නවා කියලා දැනෙන ගතිය දියවෙලා ගිහිං නැති වෙනවා, එතකොට මොකද වෙන්නෙ ලී කෑලි වගේ. මේක කියන්න වචන නෑ. අන්න එදාට ඔබ හිනා වෙනවා, වෙඩි තියන්න ආවත් හිනාවෙනවා ඇයි ඔබ නෑ.

ලෝකයත් දන්නෙ නෑ ඔබ නැති බව, ඔබට ඔබ නෑ. ලෝකෙට ඔබ ඉන්නවා. දරුවට තාත්තා ඉන්නවා. බිරිඳට මහත්තයා ඉන්නවා. අම්මාට පුතා ඉන්නවා, ඒත් ඔබට ඔබ නෑ. ඒ කවුරුවත් දන්නෙ නෑ ඔබ නැති බව. අපි කියනවා මැරිච්ච කෙනෙක් ආයෙ මරන්න බෑ කියන එක. පුළුවන් නම් අපිව මරන්න. රහතන් වහන්සෙලා කිසි දවසක මරන්න බෑ ඒ මැරිලා ඉවරයි, කොහෙද ඉන්නේ. බුදුන් වහන්සේ කියනවා විඤ්ඤාණය ගිය තැන මාරය හොයනවා කියලා හම්බවෙන්නෙ නැ ඔබ. ඔබ මෙතනම සුවිසුද්දං කරලා ඉවරයි ඔබ ගිහිං ඉවරයි. ඔබ මෙතනට ඔබ ගිහිං ඉවරයි ඔබ නෑ. ඔබ ඔබව සොයලා දෙන්න. ඔබ නිවන් දැකලා ඉවරයි. **ඔබට ආයේ ආත්ම කතා නෑ 'ෆ්‍රීක්වන්ස් නෑ' 'සිස්ටම් නෑ' මුකුත් නෑ ඔබ ඔක්කොටම ගහලා ඉවරයි, ඔබ තමයි මහ පුරුෂයා වන්නෙ.**

**අභ්‍යන්තර පරිවර්තනය** මේක නෙවෙයි දේශනාව කියන්නෙ මට මම නැති වෙන හැටි, මේ අන්තිම හුස්ම බිංදුවයි දේශනාවෙ හැම තැනකම උද්දේශ පාඨවල බලන්න. ලොවම දෙදරයි මේ හැම තැනම ආර්යයන් වහන්සේ දීලා තියෙන්නෙ මැසෙන්ජර් එක මොකක්ද කියලා බලන්න මැරිච්ච කෙනෙක් ආයෙ මරන්න බෑ.

මේක පරිවර්තනය වෙලාම බලන්න මොනවාද හිතෙන්නෙ කියලා හිතෙන්නෙ ගහක් යට, හුළඟ, ඔය වලාකුළු බිම දිගාවෙලා ඔච්චර තමයි. ඔබට ඒවා තේරෙන්නෙ නෑ. අන්ධ වනය සුන්දරයි. අන්ධ වනයෙ කොහෙද පාට, අන්ධ වනය කොහෙද තියෙන්නෙ, අන්ධ වනය තියෙන්නෙ ආයතන ටික නිරෝධ වෙන තැන. සෙල්ලන් නෑ. අන්ධ වනය සුන්දරයි කියලා අපි දේශනාවට දැම්මෙ ඇස් ඇත්තෝ දකිත්වා කියලා. මේක ඔබ පරිවර්තනය කර ගන්න. මේ සත්‍ය දකිනවා නම් කොච්චර වටිනවාද? මේ අභ්‍යන්තර පරිවර්තනය ඔබට සිද්ධ වෙනවා. අපි ලෝකෙට හෙළි කරන්නෙ අභ්‍යන්තර පරිවර්තනය කියලා අපි දිගින් දිගටම කියනවා අපි වෙන මුකුත් කියන්න අවශ්‍ය නෑ කියන්න අපේ පරිවර්තනය ලෝක සත්වයාට දායාදයක්ව පරිත්‍යාග කරනවා. ඔබත් මෙය අත් දකින්න ඔබට මරණයක් නෑ කියලා ඔබ දහම අවබෝධ කරන්න. සෑප්පුවම දාලා තියෙනවා අභ්‍යන්තර පරිවර්තනයකට ලක් වෙන්න. අපට නැවත උප්පත්තියක් නෑ. ඔබ නැවත නූපදින බව ඔබටම සාංදිට්ඨික වෙනවා.

**උපාසිකාව :** තෙරුවන් සරණයි. එසේයි ආර්යයන් වහන්ස ඔබ වහන්සෙට නමස්කාර වේවා! ඔබ වහන්සේ කියන දේ ඔබ වහන්සේ මනුෂයෙක් දෙවියෙක් බ්‍රහ්මයෙක් නෙවෙමයි බුද්ධ විෂය අචින්ත්‍යයි. මම හැමදාම හිතුවෙ බුදු හාමුදුරුවන්ගේ මේ ශක්තිය මේ විශ්වයේම කැරකි **කැරකි තියෙනවා කියලා.**

**ආර්යයන් වහන්සේ :** බුදුන් වහන්සේගෙ 'සත්‍ය' විශ්වයේ තියෙන කතාවක් නෑ අම්මේ. මේ මේවා අම්මෙ දැන්මම කුඩු කරන්න ඕන. මේ මේක ශක්තියක් නෙවෙයි. මේ ශක්තිය තියනවා එන්ලයින්මන්ට් එකේ එයාට ශක්තිය හම්බුවෙනවා. මේකෙ ලොකු කතාවක් තියෙනවා. එන්ලයින්මන්ට් එකේ තියෙනවා ඒ කතාව. නමුත් මේ බුද්ධ ස්වභාවය ශක්තියක් නෙවෙයි, මේක ඇත්තටම 'නිස්සත්තෝ නිජ්ජීවෝ ශුන්‍යයෝ'

මේකෙ මුකුත් නෑ එහෙම කතාවක් නෑ. ක්‍රියේෂන් එකක් නැති උනා පමණයි. අර මාරයාට දීපු උත්තරය හරි මහණ ඔබට සතුටුද මොනවා ලැබුනාටද මාරය මේ බුදු උනාට පස්සෙනෙ අහන්නෙ. මහණ ඔබට දුකද මොනවා නැති උනාට ද මාරය. නැති උනා නම් නැති උනේ තියෙනවා කියලා හිතපු සිතිවිල්ල විතරයි. ඇත්තටම වෙන්නෙ ඕකයි. ඔබ ඉන්නවා කියලා දැනෙන එකත් නැති වෙලා යනවා. ඊට පස්සේ හැම කෙනෙකුට ම දැනෙන්නෙ ඉන්නවා වගේ හැබැයි මේ පරිවර්තනය අනිත් පැත්තට එන කොට ඔබව එහෙම දැනෙන්නෙ නෑ. 'බුද්ධ ස්වභාව' කියන්නෙ ශක්තියක් මොකක්වත් ඇත්තටම තිබුණු දෙයක් නැති වෙච්ච දෙයක් විතරයි. ඒකයි ඒ කිව්වෙ ඵල නැති කමමයි අපේ ඵලය කියලා කියන්න ඕන. හැම විදිහෙන්ම දේශනා 2000 ඇතුලෙ තියෙනවා. ඇස් ඇරල දකින්න ඒ ස්වභාවයට උතුම් ස්වභාවයට පත් වෙච්ච නැති එක විතරයි අසරණ මනුස්සයාට වෙලා තියෙන්නෙ

පරාසයක් තියෙනවා කතා කරන්න. ඒක ටිකක් වෙනස්. කවුරුත් දන්නෙ නැති පරාසයක්, වෙනස් මානයක්, වෙනස්ම කතාවක් නමුත් එය මේකට අදාළ නෑ නිවන් මගට. නිවන් මගට අදාළ ටික අපි පැහැදිලිව දේශනා කරලා තියෙන්නෙ සූත්‍ර පිටකවල බුදුන් වහන්සේ පෙන්නපු තැන්වලින්ම මතු කරලා හොඳින්ම දීලා තියෙනවා. මේ දේ සිද්ධ වෙනවා. මේක දේශනා ප්‍රාතිහාර්යක් තුළ සිද්ධ වෙනවා අහගෙන අහගෙන යන හැමෝටහම අභ්‍යන්තර පරිවර්තනයක් සිද්ධ වෙනවා. එය නවත්තන්න බෑ. මේකෙ නිර්මලව ශ්‍රී සද්ධර්මය දේශනා වෙනවා ශ්‍රී සද්ධර්මය නිර්මල ශ්‍රී සද්ධර්මය අහනවා කියන්නෙ ඒකාන්තයෙන්ම අභ්‍යන්තර ඒ පරිවර්තනයට ලක් වෙනවා. අවිද්‍යාව කුඩු වෙලා යන්න යන්න යන්න ක්ෂය ධම්මා වය ධම්මා අභ්‍යන්තර 80%ක් කෙලෙස් දිය වීගෙන දියවී ගෙන යනවා. නිවැරදිවම මෙය හරියටම පෙන්වන්න ඕන නිසා මේ සූම් සාකච්ඡාවට ගන්නේ පටලැවෙන තැන් ගොඩයිනෙ. තෙරුවන් සරණයි

***උපාසක :*** අවසරයි ආර්යයන් වහන්ස. පාද නමස්කාර කරමි.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මුද්‍රණය කරන එම ධර්ම ග්‍රන්ථ සඳහා ඔබටත් දායක විය හැක.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය

ගිණුම් අංක : 106161005988

බැංකුව : සම්පත් බැංකුව

ශාඛාව : බත්තරමුල්ල

බුද්ධොත්පාද ආරණ්‍ය සේනාසන කටයුතු වෙනුවෙන් දායක වමට දැන් ඔබටත් අවස්ථාව උදා වී ඇත.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය

ගිණුම් අංක : 100800597511

බැංකුව : ජාතික ඉතිරි කිරීමේ බැංකුව

ශාඛාව : බත්තරමුල්ල

කුසට අහරක් හිතට සරණක් යන තේමාව යටතේ අසරණයින්ට පිහිට වීම උදෙසා මෙම සත්කාරය දියත් කර ඇත. ඒ වෙනුවෙන් ඔබටත් දායක විය හැක.

මෙත්මල් අරණ සමාජ සේවා පදනම

ගිණුම් අංක : 100800598542

බැංකුව : ජාතික ඉතිරි කිරීමේ බැංකුව

ශාඛාව : බත්තරමුල්ල

**බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මගින් මෙතෙක් මුද්‍රණය කර ඇති ග්‍රන්ථ පහත සඳහන් වේ.**

1. සතිය කියන්නේ අපේ ගෙදර
2. මට මම නැතිවන හැටි
3. මොහොතට අවධිය (පළමු කොටස)
4. බුද්ධ දර්ශනය
5. නිවැරදි නිවන් මඟ හමුවිය
6. මොහොතට අවධිය (දෙවන කොටස)
7. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 1
8. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 2
9. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 3
10. The true dhamma has awakend, volume 1
11. The true dhamma has awakend, volume 2
12. The true dhamma has awakend, volume 3
13. මේ අසන මොහොතේම ඔබ නිවන් දකිනවා
14. ආර්ය කමටහන්
15. ලොවම දෙදරයි
16. සූත්‍ර දේශනා 01
17. සූත්‍ර දේශනා 02
18. සූත්‍ර දේශනා 03
19. මේ ගෞතම බුද්ධ සාසනයේ නැවත පිබිදීමයි
20. බුද්ධ ඥාණය අචින්ත්‍යයි
21. නොපෙනෙන සත්‍යය
22. සිතුවිල්ල මම නෙවෙයි
23. සබ්බ සංඛාර සමථය